




**බොහෝ** කලකට පසු දාරීගෙන් ලිපියක් ලැබිණ. මේ මොහොත වන විට මා ඒ ලිපිය කියවා අහවර කළා පමණකි. එක ලියමනක් තුළ මේ තරම් දේවල් අඩංගු වී තිබිය හැකි ද? කෙසේ වුවද ඈ මේ ලියමන ටිකෙන් ටික ලියා අවසන් කළ එකකැයි සිතේ. මාස ගණනක් යනතුරා මට ඇගෙන් ලැබුණේ තැපැල් පතක් පමණකි. එවන් තැපැල් පත් ඈ තවමත් ජීවතුන් අතර සිටින බව මට පසක් කළේය. කෙසේ වුවද මේ ලිපිය කියවීමෙන් පසු ඈ පිළිබඳව මා සිත තුළ වූ කනස්සල්ල පහව ගියමුත්, කුතුහලය තව තවත් මුවහත් වී වැඩිණ. දාරී රිය අනතුරකින් මිය ගියද, ඒ ගැන මට කිසිවකු දන්වා නොඑතැයි සිතමි. ජස්ටිනා මට ලියන්නේ අවුරුද්දකට වතාවක් පමණි. දාරීගේ මවුපියෝ අකුරු ලිවීමට නොදනිති.

www.sinhalaelibrary.com 1

මට ප්‍රථමයෙන්ම දාරී මුණ ගැසුණේ මගේ මව ඉගැන් වූ උතුරු නයිජීරියාවේ පාසලකදීය. මගේ මව දරී ඉගෙනුම ලැබූ නේවාසික පාසලේ ගුරුවරියකි. පාසල් වත්තේ වූ ගුරු නිවාසයක අපි ජීවත් වුණෙමු. මගේ පියා නගරයේ පිරිමි පාසලක ඉගැන් වූ අතර, ඔහු එහි ගියේ තම මෝටර් රථයෙනි. ගුරුවර ගුරුවරයන්ගේ දරුවන් වූ අප ටික දෙනෙක් හා තවත් විශේෂිත ළමයින් කිහිප දෙනෙක් නේවාසික නොවූ පාසල්වල ඉගෙනුම ලැබූහ. ඒත් එකම වත්තේ සිටීම නිසා සැන්දෑ කාලයේදී අපට මුණ ගැසීමට අවස්ථාව සැලසිණ.

මගේ නිවසේ වම්පසින් වූ බාවොබ් ගස ළඟට ගියවිට දරී සහ අනෙක් අයගේ කාමර පෙනෙයි. හරියටම දරීගේ ඇඳ තිබෙන්නේ කොයිද්දයි මම දන සිටියෙමි. ශ්‍රී ලංකාවේ පාසලින් අස් වී නයිජීරියාවට පැමිණි පසු කිසිවකු හා සදතතික මිතුදමක් පවත්වාගෙන යෑමට මා තුළ දැඩි බලාපොරොත්තුවක් නොවීය.

ජස්ටිනා හා දරී මට හමුවූයේ මේ අතරදීය. අප නයිජීරියාව හැරවිත් මේ වන විට වසර තුනකටත් වඩා කාලයක් ගත වී ඇතත්, දරී ගැන මා තුළ දැඩි විශ්වාසයක් තිබිණ. ඇ ලියූ ලිපිවල කිසිදු පිළිවෙලක් නොවූවත් ඒ ලිපි ගැනද විශ්වාසයක් ඇතිකරගත හැකි විය. ඇගේ මේ අවසාන ලිපිය කියවීමෙන් පසු මුල් ලිපි කියවීමට මා තුළ දැඩි ආශාවක් ඇතිවිය. ඇගේ පැරණි පින්තූරයක් දෙස බලමින් මම ඇ පිළිබඳ මතක අවදි කිරීමට උත්සාහ ගතිමි. ඇ ඉතාමත් පියකරු සුරූපී යුවතිය වූවාය. එහෙත් හදිසියේ ඇ හැමදෙයක් මෙන්ම හැම කෙනෙකු දෙසම සැක සිතින් බැලීමටත්, විවේචනය කිරීමටත් පටන් ගත්තාය.

'ඔබේ දක්ෂකම මතුවෙලා පේනන ඔබ ලස්සන වැඩියි දරී'.



අපි ඇයට විහිළු කළෙමු. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඇ ලස්සනයි. මේ පින්තූරයේ වුවද ඇගේ ආකර්ශනීය දේහ ලක්ෂණ මට දකගත හැක. සිත්ගන්නා සුළු නෙතු සහල හා වක් වූ ඇහි බැම ඉතාමත් පැහැදිලිව මගේ මතකයට නැගේ. සියල්ලන්ම ඉදිරියේ ඇ ඉතාමත් ප්‍රසන්න ලෙස හැසිරුණාය. එහෙත් ඇ තුළ වූ අන් අයගේ සිත් ඇදගන්නා සුළු පෙනුම නිසා අප තුළ ඇ කෙරෙහි කිසියම් ඉරිසියාවක් වැනි හැඟීමක් ඇති විය. එහෙත් දැන් ඇය දකීම මා තුළ දැඩි ආශාවක් උපදී. ඇ දැන් තව තවත් ලස්සන වී ජීවිතයේ පූර්ණත්වයට පත් වී ඇතුවා නිසැකය. එහෙත් ඇ හැම දෙයක් ගැනම පෙරටත් වඩා කෝපයට පත්වනවා ඇතැයි සිතේ.

ඇ විසින් වරින් වර මා වෙත එවන ලද ලියුම් ඇගේ ජීවිත කතාව මෙසේ හෙළි කරයි.

www.sinhalaelibrary.com 2

# 1

**ඔවුන්** තවමත් මා අමතන්නේ අමාරියා යන නමිනි. අමාරියා යනු මනමාලියයි. තව සෑහෙන කාලයක් සිවුවැනි බිරිඳ නිවසට පැමිණෙන තුරු ඔවුන් මට අමාරියා යයි අමතනු ඇත. සැමියාගේ නිවසට මා මනමාලියක් ලෙසින් පැමිණ තවමත් ගෙවී ගොස් ඇත්තේ දෙමසක කාලයකි. අද මගේ වාරය නොවේ. අද වාරය දෙවැනි බිරිඳගේය. එබැවින් අද මම නිදහසේ ගත කරමි. හැන්දෑවේ ඔහු නිවසට පැමිණීමට පෙර ඔහු සමඟ රාත්‍රිය ගත කිරීම සඳහා පේවීමට ඈ එහෙ මෙහෙ දුවමින් මහා කලබලයකින් ඇගේ වැඩකටයුතුවල නියැළී සිටින බව මට පෙනෙයි.

මාත් පරෙයියන් රෑන හැර මිදුලේ වෙනත් කිසිවකු නොමැත. ටකරන් වහළ මතට වී උන් ආදර සුව විඳියි. මුළු



පරෙයියන් රෑනම වහළය උන්ගේ නිවස බවට පත කරගෙන තිබේ. වතුර ටැංකියට ඉහළින් සෙවන දුන් අඹුරු මුල්ල ආදර සුව විඳීම සඳහා උන්ගේ ප්‍රියතම ස්ථානය වෙයි. අරුණෝදයේ හෝ අරුණළු බැස යන හැන්දෑවේ මට වැඩක් නැති නිසා හැම මොහොතකම මම උන් දෙස බලා සිටිමි. වහළට ඉහළින් වූ නැගෙනහිර අහසේ දම් පැහැති නිලක් හා පැහැදිලි රෝස පැහැයක් පැතිර තිබේ. දූවිල්ලෙන් වැසී ගිය ද මෙය පැහැදිලි ආලෝකමත් සන්ධ්‍යාවකි.

ඉඳහිට කොලු ගැටයෙක් කොහේ හෝ ඈතක සිට ගල් කැටයක් දෙකක් විසි කළහොත් සහජයෙන්ම බියපත්වන පරෙයි රෑන එකා මෙන් එක්වන්ව අහසට ඉගිල යතත් මොහොතකින් ආපසු එති. පූල්ලි වැටුණ පියාපත්වලින් යුත් ශෙල පුම්බමින් වංචාකාරී රවුම් නෙත්වලින් ලෝකය දෙස බලමින්උන් ආපසු පියාඹා එන්නේ තම සවි නැති දෙපා උඩඟු විලාශයෙන් දාර ගැසුණු තහඩු වහල මත තබමිනි.

මේ පරෙයියන් කොතරම් සිත් ඇද බැඳ ගන්නා ආදරවන්තයින්ද? පෙරෙවි ධේනුව තම රෑනෙන් පසෙකට ඇද ගන්නා රාගී සිත් ඇති පරෙවියා ඇය පසු පස ලුහු බඳී. මේ පුෂ්ටිමත් මනාලයා තම අමාරියා පසු පස ලුහුබඳිද්දී මගේ මුවගට සදය සිනාවක් නැඟිණ. ඒ දුටු මගේ වැඩිමල් සහකාරිය මා දෙස බැලුවේ තද නොකැමැත්තෙනි.

මුළු මිදුලම දූවිල්ලෙන් පිරී ගොස්ය. හමටාන් සුළඟට හසු වී දහරයක් මෙන් ඒ මේ අත හැපෙමින් පැද්දුන කොහොඹ ගස කෙඳිරිලි හඬ නඟයි. එහි දූවිල්ලෙන් වැසුණු අතුපතර වහළ මත වැතිරී වහළ පිරිමදී. හමටාන් කුඩු දූවිල්ල දසත

www.sinhalaelibrary.com 3

පැතිර යයි. ඇඳුම් පැළඳුම්, කෙහෙරොද, ඇස් කොන් හෝ තොල්පෙතිවලටද එයින් ගැලවීමක් නැත. ඇඟපත ගොරෝසු වී හොරි දමන්නට වෙයි.

මා උපන්නේත් මේ හමටාන් සුළඟ සමගය. දරී නම් වූයේ එබැවිනි. මා මෙහි පැමිණි දිනයද හමටාන් සුළඟ කුණාටුවක් මෙන් හැමූ දිනයකි. වියළි බව කොතරම්ද යත් ඇඳුම් වියැකී ගොස් නිසොල්මන් ලෙසින් සිරුර කම්පිත කොට දැස් දවාලන්නට විය.

මගේ ජීවිතයේ සෑම සියලු දෙයක්ම සිදු වූයේ වියළි හමටාන් සුළඟ හමා ආ මේ සීත කාලයේදීය. මේ ජනවාරියේ මුල් සතියයි. මා මෙහි ආවේ ගිය නොවැම්බරයේය. මගේ තේවා මුරය නොවූ දිනවල මා විසින් කළ යුතු වැඩි වැඩක් නොවීය. මේ තරම් නිදහස් කාලයක් මගේ දතට හසු වූයේ නැති තරම් යැයි සිතේ. මගේ දෙමාපියන්ගේ නිවසේ සිටියදී පාසල් කාලයේදී වුවද මා විසින් කළ යුතු වැඩ කොටසක් තිබිණ. අප ගොවිපොළේ වැඩ සඳහා නොගියද ඉරිඟු ශුද්ධ කිරීම, මෙනේරි ඇඹරීම, වතුර ඇදීම හෝ තවත් බොහෝ වැඩ කළ යුතු විය. එහෙත් මෙහිදී මගේ තේවා මුර දිනවලදී පවා මට වැඩි වැඩක් නොපැවරේ. නිවසේ විශාලත්වය අනුව බොහෝ දෙනාගේ බඩකට පිරවිය යුතු වුවද සේවක සේවිකාවන්, දූප්පත්, නෑදෑයන් ඇතුළු තවත් බොහෝ දෙනෙක් මෙහි රැඳී සිටින බැවින් ඒ සැමගේ සහාය ගෘහ කටයුතු සඳහා නොඅඩුවව ලැබෙයි. මේ හැම දෙන අතර සිටියත් මට මහා පාළු කාංසියක් දනෙයි.

ඔබත් ජස්ටිනාත් මා සමීපයේ නැතිවීම මට ලොකු අඩුවක්



සේ දනේ. මේ ලිපිය ලිවීමට මා අදහස් කළේ ඔබ නැති අඩුව පිරිවීම සඳහා ඔබ සමග කතා බහ කරන අදහස සිත ඇතිවය. ඔබ විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයට සූදනම් වන අන්දම දන ගැනීමට මා තුළ ඇත්තේ දැඩි නොඉවසිල්ලක් බව කිව යුතුය. මට ඔබේ ඇසුර නැතිවීම නිසා මා තුළ ඔබත් ජස්ටිනාත් ගැන ඇත්තේ එක්තරා විදියක වේදනාවක්. මින් මතුවට ඔබ දෙදෙනාට දිගටම ලියන්න පුළුවන් වේවිය කියලා මට හිතෙනවා. ඒත් ඒ ලියුම් කාල චක්‍රය ගැන කියවෙන වාර්තාවක් වේවිය කියල මට හිතෙන්නේ නැහැ.

ඒ ලිපි මගේ ජීවිතයේ අමතක නොවන සිදුවීම්, සිතුවිලි හැඟීම් හා සිතේ ඇතිවන චලනයන් පිළිබඳ එකතුවක් වේවි. ජීවිතය කොයිතරම් පිළිවෙලකට ගෙන යෑමට උත්සාහ කළත් නොයෙකුත් සිදුවීම් එක පසුපස එක හඹාවිත් වේගයෙන් ජීවිතය තුළට රිංගා ගැනීමට මාන බලන්නේ මහ පුදුම විදියකට. ඒ මොහොතේම ඇතිවන සිතුවිලි ඒ වේලාවේ නියම සත්‍යය පිළිබිඹු කරන බැවින් ඒවා සටහන් කර තැබීම වැදගත් සේ හැඟෙනවා.

ඔබට මතක ඇති අප තිදෙනා එකම විශ්වවිද්‍යාලයකට ඇතුළු වී අධ්‍යාපනය ලැබීමට සැලසුම් කළ හැටි. ඔබ වගේම ජස්ටිනාත් ඉක්මනටම විශ්වවිද්‍යාලයකට ඇතුළු වේවි. ඒත් මා එහි යන්නට පෙරුම් පිරුවා පමණයි.

www.sinhalaelibrary.com 4

## 2

**මහා** බලැති අල්ලා දෙවියන්ගේ කැමැත්ත මේ විය යුතුය. එහෙත් ඇත්ත වශයෙන්ම මහා බලයක් ඇත්දැයි සිතීම පවා පුදුම සහගතය. පසුගිය වසරේ දීර්ඝ ගිම්හාන නිවාඩුව මට අතිශයින්ම කනගාටුදායක එකක් විය. ඔබ නයිජීරියාව හැර ගියේ ඒ නිවාඩුව ආරම්භ වෙද්දීය.

ඒ නිවාඩුවේ අපි අපේ ගෙමිදුලේ කමින් බොමින් පිළිසඳරේ යෙදෙමින් ප්‍රීති වූණෝ. ඒත් ඇඟිලි දිගුකොට අල්ලා ගත නොහැකි වූ කිසියම් කැළඹිලි සහගත අපහසුතාවක් එදා සුළඟේ රැඳී තිබූ බව මට මතකයි. ගෙදර මූලිකයාගේ සිත තුළ කිසියම් ප්‍රශ්නයක් බර අදිද්දී ගෙමිදුලේ ඇදෙන අපහසුතාව එවැන්නකි.



මගේ පියා ගෙදර ගැහැනු උදවිය සමඟ තම ව්‍යාපාර කටයුතු ගැන කිසිවක් කතා බහ නොකරයි. ඒවා ගැහැනුන්ට අදාළ කාර්යයන් නොවේයයි ඔහු සිතයි. ඒ අවුරුද්දේ ජූනි මාසයේ ඡන්දයෙන් පසු මිල ඉහළ යෑමක් හා භාණ්ඩ හිඟයක් ඇති විය. ව්‍යාපාරිකයකු හා ගොවියකු වූ මගේ පියා මේ දරුණු කුණාටුවෙන් දැඩි ලෙස පීඩා වින්දේය. ඒ අවුරුද්දේ ඔහුගේ ගොවිපළේ කටයුතු ද හරිහැටි ඉටු නොවීය.

තෙල් මිල ඉහළ ගොස් මිලයට ගත් මෝටර් රිය ද ඔහු විසින් විකුණා දමනු ලැබීය. දරුවකු තමන් කැමතිම සෙල්ලම් බඩුවකින් ඈත් කළාක් වැනි කනගාටුදායක හැඟීමක් මා තුළ ඔහු වෙනුවෙන් ඇති විය. එදා හැන්දෑවේ ඔහු පොදු බස් රියකින් පැමිණ හකුලාගත් උරහිසින් යුතුව හිස බිමට නමාගෙන ගේ දෙසට පියමන් කළ අන්දම පැහැදිලිව මගේ මතකයට නැඟෙයි. ඔහු ගෙට ගොඩ වූයේ අවනම්බුවක් විඳි කලක මෙන් නොඉවසිලිමත් ලෙස කබාය හකුලා ගනිමිනි. ඔහුට කතා කොට කිසියම් විදියකින් ඔහුට උදව් කළ හැකිදැයි මම සිතීමි. ඒත් මා කුමක් කරන්නේද?

තම සැමියා සමඟ දබර වී ඔහු අතහැර තම කුඩා බිළිඳාත් රැගෙන ආපසු අප නිවසට පැමිණි මගේ බාල සොයුරිය අසුමි; මගේ පියාගේ හිසට තවත් බරකි. ප්‍රාථමික පාසලේ පස්වැනි ශ්‍රේණිය සමත්වීමෙන් පසු ඇ යළිත් පාසල් නොගියාය.

පවුලේ වැඩිමල් දියණිය වූ බැවින් මා තුළ මගේ පියා කෙරෙහි දැඩි ඇල්මක් පැවතිණ. එබැවින් ඇතැම් විට පියා මට විශේෂත්වයක් දක්වතැයි අසුමි සිතුවාය. ඇත්තටම පියා

www.sinhalaelibrary.com 5

මට වැඩි ආදරයක් දක්වන්නේද? අසූමි විවාහවූයේ අවුරුදු දහතුනේදී. ඒ වන විට ඇගේ සැමියාගේ වයස අවුරුදු දහඅටකි. ඔවුන් යළිත් එකට එක් වී ජීවිත්වීම සඳහා හිත හද ගනීද යන්න මට සිතා ගත නොහැක.

'මට ආයෙත් පාසල් යන්න ඇත්නම්' අසූමි වරක් කීවාය.

'කවුද කීවේ අවුරුදු දහතුනේදී කසාද බඳින්න කියලා'.

එසේ අසන්නට සිතුනද මම ඇගේ සිත් රිදවීමට නොසිතුවෙමි. විවාහ වී දරුවකු ලද පසුව වුවද පාසල් යාම මෙහි අරුමයක් නොවේ.

ඉස්ලාම් ධර්මය දියණියකගේ සම්පූර්ණ වගකීම් බර තම පියා මත පටවයි. දියණිය විවාහකර දීමෙන් පසුව වුවද ඔහුට ඒ වගකීමෙන් නිදහස් විය නොහැක. ඒ අපේ රටේ ළදරු විවාහ බෙහෙවින් සිදුවන බැවිනි.

මේ වැසි සමයේ මුල්ම වැහි වළාව වැටෙද්දී පියා මහන්සි වී වැඩ කරන්නට පටන් ගත්තේය. පසුගිය වසරේ ඔහු වැඩ කළේ ඉතා ස්වල්පයකි. ඔහු විසින් බාර ගන්නා ලද කොන්තරාත්තුවක් අවසන් කිරීමට නොහැකි වී ඇති බව ගෙදර ඇති වූ කතාබහින් මට අවබෝධ විය. පගාව දීමෙන් හෝ කිසියම් දීමනාවක් ගැනීමට ඔහු අපොහොසත්ව සිටී.

කුලුගේ මාමා වූ අල්හාජ් බෙලෝට මගේ පියා විශාල



ණයක් ගෙවීමට ඇතිබව මා දැනගත්තේ කවදාදැයි මට මතක නැත. සමහර අවස්ථාවලදී අල්හාජ් බෙලෝ ඔහුගේ දිලිසෙන මෝටර් රියෙන් ම පියා හමුවන්නට පැමිණියේය.

මා බේබොබ් ගසට හේත්තුවී සිටි ඒ අවස්ථාව මට කිසිදිනක අමතක නොවේ. බෙලෝගේ රිය මිදුළට ඇතුළු විය. ඔහුගේ මේ පැමිණීම කිසියම් දෛවෝපගත සිද්ධියකට මුල පිරීමක් දැයි මම නොදනිමි. කෙසේ වුවද ඔහුගේ පැමිණීම අහඹු සිදුවීමකි. ඔහු පැමිණි මොහොතේ මා ඒ ගස යට නොසිටියා නම් සමහර විට මගේ දෛවය වෙනස් වන්නට ඉඩ තිබුණි. පියාගේ නිවසේ දොර අසලට රිය පදවාගෙන නොගිය ඔහු මා හේත්තු වී උන් ගස යට සෙවනේ රිය නැවැත්විය.

"සුබ උදෑසනක්"

රියෙන් නොබැසම ඔහු කීවේය.

ඒ මොහොතේම තලාතුගේ පුත් අයිරෝ මිදුලට බැස්සේය. ඔහු පෝලියෝ රෝගයෙන් පෙළුණු දරුවෙකි. උඩ පනිමින් ඇවිදින ඔහුගේ කිහිලි කරු දෙක ගල් පොළවේ ගැටෙන හඬ මොහොතකට බෙලෝගේ අවධානය බින්දේය. මොහොතකට පසු ඔහු යළිත් මා දෙස බැලුවේ "ඉතින් කොහොමද වැඩ කටයුතු?" යැයි අසමිනි.

"කොහොමද ඉස්කෝල හොඳද?" ඔහු ඊළඟට ඇසුවේය.

"හොඳයි" මගේ පිළිතුර ඉතාමත් කෙටි විය.

www.sinhalaelibrary.com 6

"කොහොමද යාළුවා කුලු හොඳට පාඩම් කරනවද?"

"ඔව්"

ඔහු රියෙන් බසින්නට දොර ඇරියේය. ඔහු ඇඳ සිටි ශර්වානිය ඉතාමත් වටිනා එකක් යැයි මට සිතිණි. උපැස් යුවළ පමණක් නොව ඔහුගේ කළු කෙස් කළඹ ද දිළිසුණේය.

"තාත්ත ගෙදර නැහැ" මගේ වචන එක්වරම ඔහු නැවැත්විය.

"ආ එහෙමද?" එසේ කියමින් රියට ඇතුළු වූ ඔහු මහ හඬක් නගමින් රිය පණ ගැන්වීය. රිය මා පසුකර ගියේ දූවිලි කන්දරාවක් අවුස්සමිනි. පියා ගෙදර පැමිණි පසු අල්හාජ් බෙලෝ පැමිණි බව මම ඔහු සමග පැවසීමි.

"දුවත් එක්කද එයා කතා කළේ?"

"ඔව්"

මගේ පිළිතුරින් පියා කෝපයට පත්වූ බවක් පෙනිණි.

"ඇයි මූසා කොහේ ගිහින්ද? මූසාට තිබුණෙ පණිවිඩේ ගන්න"

ඔහු කීවේ තරග මැඩ පවත්වා ගනිමිනි.

"... මං බෙලෝ එක්ක කතා කරපු එකේ වැරැද්ද මොකක්ද? අපේ ඉස්කෝලෙ පිරිමි ගුරුවරු කී දෙනෙක් නම් ඉන්නවද? ඇයි මං පිරිමියෙක් එක්ක කතා කළාම මොකද වෙන්නෙ....?"



මම එසේ සිතන්නට වීමි.

"මූසා ගමනක් ගිහින්"

සිත යට මෝදු වී ආ අමනාපය සඟවා ගනිමින් මම පැවසුවෙමි.

බෙලෝ ගෙදරට එනකොට මං මිදුලෙ ගහයට හිටිය එක වැරැද්දක්ද?

මූසා ඩොගෙන්දාස්වල පිහිටි තම මවගේ වැඩිමහලු සොහොයුරියගේ නිවසට ගොස් තිබුණි. මූසාගේ මව මගේ පියාගේ දෙවැනි බිරිඳය. මගේ මවට පිරිමි දරුවන් නැති පාඩුව ඇගෙන් ඕනෑවටත් පඩා පිරිමැහුණි. මගේ මව පියාගේ ප්‍රථම බිරින්දෑය.

මූසා ඇතුළත් කොට තිබුණේද නේවාසික පාසලකටයි. ඒ අවුරුද්ද වනතුරු අපේ සියලුම අධ්‍යාපන පහසුකම් රජ විසින් දරන ලදි. අපට පොත්, ඇඳුම්, නේවාසික පහසුකම් පමණක් නොව අතිරේක පංති සඳහා දීමනාද, වාරය මුල සහ අග නේවාසිකාගාරයට පැමිණීමට හා ආපසු යෑමට ගමන් ගාස්තු ද ගෙවන ලදී. ඒත් මේ වසර වන විට දරුවකු නේවාසික පාසලකට දමා ගැනීම ඉතාමත් අපහසු කාර්යයක් විය. මූසාගේ බාල සොහොයුරු දන්ජුම ගියේ සාමාන්‍ය පාසලකටය. ඔහු නේවාසික පාසලකට ඇතුළත් කරගැනීම සඳහා ඔවුන්ගේ මව පියාට බලවත් සේ ඇවිටිලි කරන්නට වූවාය. එහෙත් බලධාරීන්ට කප්පම් නොගෙවා මෙය කිරීම ඉතාමත් අපහසු කාර්යයක් විය. මේ දිනවල රජයේ පාසල් ගණන අඩු කිරීමටත් පාසල් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන්

www.sinhalaelibrary.com 7

කතා බහ කෙරෙන බව මට දැනගන්නට ලැබිණ. තම දරුවා සාමාන්‍ය පාසලකට යැවීමෙන් තමන් හැල්ලුවට ලක් වන්නේ යැයි මුසාගේ මව සිතයි. කෙසේ වුවද මගේ මව හෝ මුසාගේ මව කිසි දිනක පාසල් ගොස් නැත.

දින දෙකකට පසු යළිත් වරක් බෙලෝ අප නිවසට පැමිණියේය. මම මෙවර ඔහුට නොපෙනෙන සේ මගේ මවගේ කුටියට වී සිටියෙමි. එය ග්‍රීස්ම ඍතුවේ උච්චතම කාල පරිච්ඡේදය වූ අතර උෂ්ණත්වය බෙහෙවින් අප ජීවිතවලට බල පෑවේය. යන්තම් ඇඟ සෙලවීමකදී වුවද සිරුරින් දහදිය ගලා ගියේ පුංචි දිය පාරවල් විලසිනි. බොහෝ දෙනා උණුසුමින් යුත් දහවල ගත කළේ ගස් යට වැතිර ගනිමිනි. දැඩි හිරු රැස් දහරා පොළව මත පතිත වූයේ අප සිරුරු උණුකර දවාලීමට මෙනි. අපි ගතින් දුර්වල වූ අතර නිතර පිපාසයෙන් පෙළෙන්නට වීමු. උණුසුම් වාතාවරණය අප තුළ තරහ ආවේගයන් වපුරන්නට විය. අසුම්ගේ දරුවා අඬන ශබ්දය පවා මා තරහ ගැන්වීය. අප බොහෝ විට නින්දට ගියේ ගෙතුළින් පිට විවෘත තැනකය. එහෙත් බොහෝ විට දූවිලි කුණාටුව අපේ ඒ අවස්ථාවන්ද මගහරවාලීය. ඒ රාත්‍රියේ හදිසියේ ඇහැ පියවෙනවාත් සමගම මම සිහිනයක් දකින්නට වීමි.

මම පාසලේ විභාගයට සූදානම් වෙමින් සිටි අතර පෑනක් මා වෙත නොවීය. කලබලයට පත් මම හැම තැනකම පෑන සොයන්නට වීමි. එහෙත් අවසානයේදී මගේ ගණිත ගුරුවරයා පෑනක් අතැතිව මා වෙතට පැමිණියේය. ඔහු ළං වන විට ඔහුගේ රුව මැකී ගොස් බෙලෝගේ රුව මතුවිය.



මෙච්චර මිනිස්සු ඉන්දෙද්දී බෙලෝ මට හීනෙන් පෙනෙන්නෙ මොකටද...?

එසේ සිතමින් මම අවදි වීමි. හීනෙන් දැනුණු සුවඳ විලවුන් සුවඳ තවමත් කාමරය සුවඳවත් කරමින් තිබිණ. පසුදා උදෑසන බෙවොබ් ගස අවට ද ඒ සුවඳ පැතිරෙමින් තිබිණ. එහෙත් මම එය ප්‍රිය නොකළෙමි.

සැප්තැම්බර් මාසයේ යළිත් ඔහු අප නිවසට පැමිණියේය. දිනය හරිහැටි මතකයේ රැඳී නැතත් ඒ බදාදා දිනයකි. සාමාන්‍ය පොළ දවස ඉරිදා වුවද මේ පළාත් සභා ප්‍රදේශයේ පොළ දවස වූයේ බදාදාය. එදින ඒ මොහොතේද මගේ පියා නිවසේ නොවීය. මම පියාගේ නිවසේ ජනේලය අසල අසුන්ගෙන සිටියෙමි. මේ වන විට පියාගේ කුටිය පරණ ක්‍රමයෙන් වෙනස් කොට තිබිණ. ගැහැනුන්ගේ කුටිවල තවමත් තල්කොළ සෙවිලි කර තිබූ අතර පියාගේ කුටියට ටකරන් තහඩු දැමුවේ මෑතකදීය. මෙහි හැඩයද බෙහෙවින් වෙනස්ය. ගැහැනුන්ගේ කුටි කවාකාර වූ අතර මෙය හතරැස් හැඩය ගත්තේය. එහෙත් ටකරන් තහඩු නිසා මෙය බෙහෙවින් රස්නය දුන්නේය. මම පියාගේ කුටියට වී සිටියේ ඔහු විසින් දෙන ලද බිල්පත් කිහිපයක් එකතු කිරීම සඳහාය. ගෙතුළ උණුසුම දරාගත නොහැකි වූ මම ජනේලය අසලට වී සිටියේ කොහොඹ ගස් සෙවනින් ඉදහිට මද සුළං රැල්ලක් හමා ආ බැවිනි. මම මොට්ටැක්කිලිය ගලවා දමා ඇඳුමද මඳක් ලිහිල් කරගෙන සිටියෙමි. ඔහුගේ රිය කොහොඹ ගස යටට පැමිණ නවත්වද්දී මට මොට්ටැක්කිලිය දමා ගැනීමට පවා කාලයක් නොවීය. ඔහු රියෙන් බැස කවුළුව ළඟට පැමිණියේය. ඔහු නොදුටු බවක් පෙන්වා ගෙතුළට රිංගා යෑමට ද මට අවස්ථාවක්

www.sinhalaelibrary.com 8

නොවීය. අවංකවම එසේ කිරීමට මට උවමනාවක් තිබුණා දැයි මම නොදනිමි. මේ මොහොතේ ඒ අවස්ථාව ගැන යළිත් සිහිපත් කරද්දී මගේම සිතුවිලි ගැන මට සහතික විය නොහැකි තරම්ය. ඒ මොහොතේ මා කොතරම් කලබලයට පත්වූවාද යත් මට කතාකර ගැනීම පවා අපහසු විය. මා සිත තුළ ඇතිවූ ආකල්පය කැමැත්ත හා අකැමැත්ත පිළිබඳ සංකලනයක් විය. කෙසේ වුවද ඔහු වටා විහිදුණු පොහොසත්කමේ සංකේතය මා තුළ කෝපයක් දනවීය. ඔහුගේ වටිනා මෝටර් රිය, දිළිසෙන අත් ඔරලෝසුව, මිල අධික දුම්වැටි දවටනය ඔහු ධන කුවේරයකු බව පෙන්වන ලකුණු විය. ඔහු මගහැර යෑමට, ඔහුට නොපෙනී සැඟවීමට, කවුළුව වසා දැමීමට හෝ කාමරයෙන් පිට වී යෑමට මට අවකාශ තිබිණි. ඒ වෙනුවට මම ඔහු මා අමතන තුරු බලා සිටියෙමි. කිසියම් දෙයක් කිරීමට හෝ නොකිරීමට කෙනෙකු තුළ ඇතිවන අරමුණු තේරුම් ගැනීම කොතරම් අපහසුද? ඔහුගේ මෝටර් රියේ ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක වී තිබිණ. එයින් පිටවූ බොල් ගී හඬ මගේ මවුවරු දෙදෙනා පිටි කොටන හඬට නොදෙවෙනි විය. මහා ඝෝෂාවක් වූ එය අප දෙදෙනාගේ පිළිසඳර යටපත් කරන්නාක් මෙන් විය. අප දෙදෙනාගේ පිළිසඳර නිකම් නමට ඇතිවූ කතාබහකි. වචනවලටත් වඩා එය බොහෝ දුරට හී සැරයකට සමාන විය.

"තාත්ත ගෙදර නැහැ"

ඔහු අසන්නටත් පෙර මම කතා කළෙමි.

"ඔබ කොහොමද දන්නෙ මං ආවෙ තාත්ත හම්බවෙන්නය කියල"



"එහෙනම් වෙන මොනවටද ඔබ ආවෙ?"

"මේ ඉස්කෝලවල සිරිත් විරිත් උගන්නන්නෙ නැද්ද?"

"උගන්නනවා"

"ඇයි ඔබ එහෙනම් මට ගේ ඇතුළට කතාකරල හප හප ඉන්න කෝලා ගෙඩියක්වත් දෙන්නෙ නැත්තෙ?"

"මං ළඟ කෝලා ගෙඩි නෑ"

"එහෙනම් මං ඔබට සිගරැට් එකක් දෙන්නද?"

"මං සිගරැට් බොන්නෙ නෑ"

"ඔබ කවදද ආපහු ඉස්කෝලෙට යන්නෙ?"

කටහඬේ ස්වරය වෙනස් කරමින් ඔහු යළිත් ඇසුවේය.

"ඉස්කෝලෙ පටන් ගන්න දවසට කලින් දවසෙ"

"දිනේ කවදාද කියල හරියටම කියන්න කැමති නැද්ද?"

"ඒක රහසක් නෙවෙයි. ඒත් ඉස්කෝලෙ පටන් ගන්න දවස කල්දාවි"

ඔහුගේ මැදඇඟිල්ලේ රන් මුදුවක් දිලිසුණේය. ඔහු තොප්පිය සකස් කරද්දී ඔහුගේ ඇඟිලිවල නියපොතු පිළිවෙළකටත් ලස්සනටත් කපා තිබෙනු දක්නට ලැබිණ. ඒවා හරියටම වික්ටර්ගේ වාගේය. අනබරා රාජ්‍යයෙන් පැමිණි වික්ටර් අපේ තරුණ ඉතිහාස ගුරුවරයාය. ඔහු හා සමාන කරන විට බෙලෝ ඔහුටත් වඩා උසය. ඔහු ඇඳ සිටි ලා නිල් පැහැති කබායේ කර

www.sinhalaelibrary.com 9

පෙදෙස වැඩ දමා තිබිණ. සමහරුන්ගේ ඇඳුම්වල මෙන් මෙහි ගොරහැඩි රළු පෙනුමක් නොවීම මගේ සිතට සතුට දනවීය.

"පැය බාගයකට කලින් ආවානම් ඔබට තාත්ත මුණගැහෙන්න තිබුණා"

කිසිවක් කිවයුතු බැවින් මම ඒ වචන මුවින් පිට කළෙමි.

"කොහොම වුණත් මට ඔබ මුණ ගැහුණනෙ. ඒ හින්ද පාඩුවක් වුණේ නෑ"

මා කොතරම් කලබලයට පත්වීද? කුමක් කිවයුතු දැයි මට මොහොතකට සිතාගත නොහැකි විය. ඔහු විසින් අදහස් කළේ කුමක්දැයි සිතාගත නොහැකිව ඔහුගේ රිය පිටත්ව ගොස් බොහෝ වේලාවක් යනතුරා මම ඔහේ බලා සිටියෙමි. කුලුගේ පියා සමග ඔහු අපේ නේවාසිකාගාරයට පැමිණි ඇතැම් දිනක අපේ පාසලේ ළමයින් කලබලයට පත්වූ අන්දම මට සිහිපත් වෙයි. ප්‍රධානම ආකර්ශනය වූයේ ඔහුගේ නවීන පන්නයේ මෝටර් රියය. තරුණ ගැහැනු ළමයින්ට පමණක් නොව ඕනෑම වයස් මට්ටමක නයිජීරියානු වැසියන්ට වැදගත්ම රාජ්‍ය සංකේතය වනුයේ මෝටර් රථ එකකට වඩා තිබීමයි. මා තුළ ඔහු කෙරෙහි වූ අක මැත්ත මේ මෝටර් රථ නිසාම ඇතිවූවක් යැයි පවසතොත් එය අසත්‍යයක් නොවේ.

කෙසේ වුවද ඔහු මා කෙරෙහි උනන්දුවක් දක්වන බව තේරුම් නොගැනීමට තරම් මා අන්ධ වී නැත. පසුගිය පාසල් වාරයේ දී මාමා කිහිප වරක්ම මා ගැන විමසූ බව කුලු මා සමඟ පැවසීය. ඒත් කුලුගෙන් ඔහු ගැන තොරතුරු දැනගැනීමට මට අවශ්‍ය නොවීය. ඒ දිනවල මා මගේ මුළු ජීවිතයම කැප කළේ අධ්‍යාපන කටයුතු සඳහා පමණි.



# 3

**වැසස** පැමිණ පොළෝතලය කොළපාටින් බැබළිණ. ගහ කොළ දළු කොළවලින් පිරී ගියේය.

හැම තැන පුංචි පුංචි වතුර වළවල්ය. සමහර තැනෙක ඒවා තාවකාලික පොකුණු බවට පත් වී තිබිණ. මල්ගස්වල ඒකාකාරී කොළ පැහැය මකාදමමින් තැනින් තැන මල් පිපී දිලිසිණ. ආපසු පාසලට යෑමට මා තුළ වූයේ දැඩි උනන්දුවකි. මා ඉහළ පන්තියට සමත් වී ඇති අතර පසුගිය වාරයේ මා ශිෂ්‍ය නායිකා තනතුරකට ද පත් කරනු ලැබීය. ශිෂ්‍ය නායිකාවක වශයෙන් වූ වගකීම මා සිත උද්යෝගයෙන් පිරී ඉතිරී යන්නට විය. එසේම අලුත් එල්ලෙන කරාබු ජෝඩුව පැළඳ යෑමද මගේ සිත වික්ෂිප්තභාවයට පත් කළ කරුණක්

www.sinhalaelibrary.com 10

විය. මා නගරයේ වාසය කරන මගේ අම්මාගේ ලොකු අක්කාගේ නිවසට ගිය අවස්ථාවේ දී ඇගේ දුව විසින් මෙය මට පරිත්‍යාග කරන ලදි. මගේ යෙහෙළියන් බොහෝ දෙනෙක් අලුත් අභරණ පැළඳ එන බැවින් කරාබු ජෝඩුව පැළඳීමට මා තුළ වූයේ දැඩි ආශාවකි.

පසුගිය වාරයේ මෙන් නොව මේ වාරයේ මා පාසලට යායුතු වූයේ පොදු බස් රියකිනි.

අප පාසලට යෑමට ලැහැස්තිවී මගට බසිද්දී බෙලෝගේ වාහනය අප ඉදිරියේ නැවැත්විය.

.... අප යන බව ඔහු දැනගත්තේ කෙසේද... ඔහු රිය නැවැත්වූයේ හදිසියේ අප දුටුවාක් මෙනි.

"මං මගේ ගෙදර යනවා. ඉස්කෝලෙ පහු කරල තව කිලෝමීටර් විසිපහක් විතර මට යන්න තියෙනවා. ඒ පාරෙන්ම තමයි යන්නෙ. නගින්න මං එක්ක යන්නම්."

ඔහු අප ඔහුගේ මෝටර් රියට නංවා ගැනීමේ කිසිදු විශේෂත්වයක් නොවීය. එය අඳුනන අයෙකු මගතොට දී හමුවූ විට කරන උදව්වකි. පියා ඉදිරිපස අසුනේ ඉඳ ගනිද්දී මම පිටුපස අසුනට ගොඩවීමි. මෙය නවීන පන්නයේ අලුත් මෝටර් රියකි. ඔහු කලින් දින පැමිණ සිටියේ වෙනත් මෝටර් රියකිනි. සුඛෝපභෝගී මෝටර් රියේ ආසන සැටින් රෙද්දෙන් ආවරණය කොට තිබිණි. රිය තුළ වූ විලවුන් සුවඳ හා සංගීතය මටත් හොරා මගේ සිතට කාවැදිණ.

ඔහු දම් පැහැති කබායක් පොරොවාගෙන සිටියේය.



එය ඔහුට කිසිසේත්ම නොගැලපෙතැයි මට සිතිණ. පිටුපස අසුනේ ඉඳගත් මට කබායෙන් නොවැසුණු බෙලෝගේ මහත් වූ ගෙල පෙදෙස හොඳින් පෙනිණ. ඔහු රිය පැදවූයේ තාත්තා සමඟ කතා බහේ යෙදෙමිනි. එහෙත් ඔහු ගෙල කෙලින් කරගෙන රිය පැදවූ විලාශයේත් විටින් විට කන්නාඩියෙන් මා දෙස බැලූ විලාසයෙනුත් ඔහු මා ගැන ලොකු අවධානයකින් සිටින බව පෙනිණ. මා ද සිටියේ ඔහු ගැන කිසියම් අවධානයකිනි. අප එකිනෙකාට ඇදී යන පුදුමාකාර කාන්දම් බලයක් රිය තුළ ඇතැයි මට සිතිණ.

මා පාසලට ඇතුළු වෙද්දී ජස්ටිනා පැමිණ සිටීම මගේ සිතට සතුට දනවන්නක් විය. මා පාසල ඉදිරියෙන් බස්සවා අල්හාජ් බෙලෝගේ මෝටර් රිය පාසල් ගේට්ටුව පියමන් කරද්දී ජස්ටිනා උපහාසාත්මක ලෙස උගුර පාදමින් හඬ නගා හිනැහෙන්නට විය.

"දාරි මට නං වැඩිය ඇල්ලුවෙ නෑ. කුලු ඉස්කෝලෙන් අස්වෙලා ගිහිනුත් මාමා තවම ඉස්කෝලෙට එනව."

"මොනවද වැඩිය ඇල්ලුවෙ නැත්තෙ."

ඈ අදහස් කළ දේ නොතේරෙණ බවක් පෙන්වමින් මම ඇසුවෙමි.

"නෑ මුකුත් නෑ. මනාලියන්ගෙ මිල ඉහළ ගිහින් මේ දවස්වල."

ඈ මුල් වචන කිහිපයට උපහාසාත්මකව තවත් කොටසක් එකතු කළාය.

www.sinhalaelibrary.com 11

"පහළ දකුණු ප්‍රදේශයෙ එහෙමද?"

මම ඇගේ ඇනුම්පදය නොතකමින් ඇසීමි.

එයට සති දෙකට පමණ පසු ජස්ටිනාට පියාගේ මාරුවීම් පිළිබඳ ආරංචිය පැමිණියේය. ජස්ටිනාට යන්නට සිදුවීම ඇ මට අහිමිවීම මගේ සිත දැඩි සේ කම්පනයට පත් කළේය. එය ලෝකයේ අනිත් පියස්ස දෙසට ඇර තිබූ කවුළුවක් වසා දැමූවාක් මෙන් විය. සුබි ජනගහනයකින් යුත් සොකෝතෝ රාජ්‍යයෙන් ඈතට මගේ දර්ශන පතය ගෙන යාමෙ සඳහා නයිජීරියාවේ පින්තූර ගෙන අවේ ඇය විසිනි. ජ්ලැටෝ රාජ්‍යයේ උස් තැනිතලා බිම් ගැනත්, ජෝස් නගරයේ ලස්සන ගැනත්, ලාගොස් අගනුවර ගැනත් මට කරුණු කියා දුන්නේ ජස්ටිනාය. මා මගේ රාජ්‍යයෙන් ඔබ්බට කිසිවිටකත් සංචාරය කර නොතිබුණි.



# 4

**අනාගතය** රඳා ඇත්තේ කොතැනකදැයි දන්නේ දෙවියන් වහන්සේ පමණි. එහෙත් සමහර අවස්ථාවල දී ඔහුත් මේ ගැන ඇත්ත වශයෙන්ම දැන සිටිනවාදැයි මම පුදුම වීමි.

මා මේ අධ්‍යාපන වාරය තුළ සති අන්තයක දී නිවසට පැමිණි ප්‍රථම අවස්ථාව මෙය විය. ඔවුන් මා නිවසට කැඳවා තිබුණේ මා හා කතා බහ කිරීමට සැලසුම් කරමිනි. මා මේ බව දැනගත්තේ නිවසට පැමිණියායින් පසුවය. මා නිවසට පැමිණෙන විට මා බෙහෙවින් ප්‍රිය කළ තැනැත්තියක වූ මගේ පියාගේ බාල සොහොයුරිය මෙහි පැමිණ සිටියාය. ඇ දැකීමෙන් මම මහත් සතුටකට පත්වීමි. එහෙත් ඇ නිවසට කැඳවා තිබුණේ මා සමග සාකච්ඡා කිරීමේ අරමුණින් බව

www.sinhalaelibrary.com 12

පසුව මට දැකගන්නට ලැබිණ.

කෙළින්ම කතාවට අවතීර්ණ වන අන්දම ගැන ඈ බොහෝ වේලාවක් සැලසුම් කරන්නට ඇත. ඈ මුලින්ම කතාවට බැස්සේ බෙලෝ ගැන වර්ණනා කරමිනි. තාත්තාගේ ණයකරය ගැන ඈ මුලදී කිසිදු සඳහනක් නොකළාය.

"බෙලෝ දූ ගැන නිතරම අහනවා. දූ ගැන ලොකු පැහැදීමකින් ඉන්නෙ."

නැන්දාගේ ඒ වචන චාටු කතාවකි. එවන් චාටු කතාවලට ඇදී නොඑන කෙනෙක් නැති තරම්ය. අනික් අතට බෙලෝ වැනි සාර්ථක පුද්ගලයකු පසුපස හඹා ඒමට ගැහැනු කැමත්තෝය.

"ඔහු මොනවද මං ගැන දන්නෙ"

මොහොතක කල්පනාවෙන් මිදුණු මම ඇසුවෙමි.

"ඔහු දූව ගැන සේරම විස්තර කුලුගෙන් දැනගෙන කියෙනවා. කුලු එයාගෙ ලේලිනේ."

නැන්දා කීවේ මහත් බලාපොරොත්තු ඇතිවය. නැන්දා හා පැවසීමට බොහෝ දේවල් සිත තුළ වූ මුත් මම නිහඬ වීමි.

....ලේලිගෙන් දැනගත්ත ඔය තොරතුරු ටික කොහොමද මං ගැන දැන ගන්න ප්‍රමාණවත් වෙන්නෙ. ඔය විදියට කෙනෙකුට තව කෙනෙක් තේරුම් ගන්න පුළුවන්ද? ඒත් මගේ



හිත තුළ තියෙන දේ මටම තේරුම් ගන්න බැරිකොට මං කොහොමද නැන්දට ඔය ටික කියන්නෙ. මට ඕන කරන්නේ මොනවද? මොන විදියෙ අවබෝධයක්ද? මාව හොඳින් තේරුම් ගන්න පුළුවන් මිනිහෙක්. මං කොයි විදියට ජීවත් වුනත් මට ආදරය කරන්න පුළුවන් මිනිහෙකුට.

බොළඳ ගැහැනු ළමයකු වශයෙන් මා සිතා සිටි ඔහුගේ ලේලිය ගැන මා තුළ වැඩි ප්‍රසාදයක් නොවීය. එහෙත් ඈ පාසල හැර යාමට පෙර මා සමග හොඳ මිත්‍රත්වයක් ඇතිකරගෙන තිබුණි. බොහෝ අවස්ථාවල ඈ තම මාමාගෙන් ලැබුණු බව පවසමින් මට පැනි රස වර්ග දුන්නාය.

"අල්හාජ් බෙලෝ හුඟක් පොහොසත් දරුවො. එයාගේ ව්‍යාපාර කටයුතු බලන් ඉන්දෙද්දි දියුණු වෙනව. ඉතින් වාසනාව අත ළඟ. එයා දූව ගැන යෝජනාවක් එවල."

කියන්නට උත්සාහ කළ දෙය නැන්දා අවසානයේ දී කියා දැම්මාය.

මම ඒ ගැන පුදුම නො වීමි. පසුගිය මාස කිහිපය තුළ බෙලෝ මා කෙරෙහි දැක්වූ ආකල්පය ගැන මම දැන සිටියෙමි.

ඒත් මා පුදුමයටත් මගේ සිතකම්පනයටත් පත්වූයේ ඔහුට ඉතා ඉක්මනින්ම විවාහ වීමට අවශ්‍ය බව දැන ගැනීමෙනි.

"දූවගෙ තාත්තා අල්හාජ් බෙලෝගෙන් ලොකු ණයක් අරගෙන තියෙනව."

www.sinhalaelibrary.com 13

නැන්දා කතාවේ වැදගත්ම කොටස මා හා පැවසූවේ අවසානයේ දීය.

"දුව බෙලෝ එක්ක විවාහ වෙන්න කැමති වුණොත් තාත්තාගෙ ණයකරය එහෙම පිටින්ම මනමාලිට ගෙවන ගෙවීමට හිලවු කරන්න බෙලෝ කැමතියි."

පසුගිය අවුරුද්ද පුරාම තාත්තා මුදල් අගහිඟකම්වලින් පෙළුණු අන්දම මට සිහිපත් විය. එසේම තාත්තා බෙලෝට ණය වී ඇති අන්දම ගැන අසත්ම කුමක් කිව යුතු දැයි මට සිතාගත නොහැකි විය. මා සීතල වතුර බාල්දියකින් පහර කෑ එකකු මෙන් මට දැනිණ. පංතියේ හොඳම ශිෂ්‍යාව වූ මා තුළ වූයේ අධ්‍යාපනය දිගටම කරගෙන යෑමේ අදහස පමණි. අපේ පවුල්වල ගැහැනු ළමයි අඩු වයසින් විවාහ වුවද විවාහය පිළිබඳ අදහස් මගේ සිතට ඇතුළු වී නොතිබුණි. මා මා ගැන සිතා සිටියේ ඒ සම්ප්‍රදායට විරුද්ධව යන්නකු වශයෙනි.

"එතකොට ජූලි මාසෙ පවත්වන විභාගෙට මොකද වෙන්නෙ?"

මම ඇසුවෙමි.

නැන්දා මහ හඬින් සිනාසුණාය. ඇගේ හිනාව පාර තෙක් විහිද ගිය අතර ඒ අනුව ඇගේ විශාල පියයුරු උස් පහත් වන්නට විය.

"මොන විභාගද? පෝයත් අල්හාජ් බඳින්න කතා කරනවා. කෙල්ල විභාගෙ ගැන හිතනවා."



ඇගේ අදහස විහිළුවක් නොවේ. මගේ සිතුවිලි හා හැඟීම මා කෙසේ ඇයට විස්තර කරන්නද? ඒවා මටවත් තේරුම්ගත නොහැක. නැන්දා කතාකරන්නේ මෙය මේ ආකාරයෙන්ම සිදුවිය යුතු සාමාන්‍ය දෙයක් ලෙසිනි. පොහොසත් මිනිසකු කතා කළ විට මා කීකරු විය යුතුය. සේරම විසඳෙන්නේ විවාහයෙන්ද?

"ඔබට ඕනතරම් ඇඳුම් ගන්න පුළුවන්. රත්තරන් බඩු, ඒ වගේම මක්කමට යන්නත් පුළුවන්. ඔබ දක්කද මක්කම් ගිහින් එනකොට ඩේලු ගෙනාව දියමන්ති මාලෙ?"

දෙවියනේ කොහොම හරි දුව ඔහුව බඳින්න ඕනි. එතකොට අයියා ණයෙන් නිදහස් වෙනව. දුව පෝසතෙක් වෙනවා. ඔහු ඔබට හරි කැමතියි. ඔබට සතුටින් ඉන්න පුළුවන්."

නැන්දා අන්තිමට කීවාය.

මේ යෝජනාව මා කෙළින්ම ප්‍රතික්ෂේප නොකළේ මන්දැයි දැන් මට සිතේ. මං ප්‍රතික්ෂේප කළා නම් ඒ අය මට මොකද කරන්නෙ. ඒත් මේ සේරටම හේතුව මගේ හිතේ තිබුණු දෙගිඩියාව. මගේ හිත ඔහුගෙ සැලකිලිවලට රැවටිලා. ඒ පැත්තට ඇදුණා. ඒත් අනික් පැත්තෙන් මට අවශ්‍ය වෙලා තිබුණා මගේ අධ්‍යාපනය දිගටම කරගෙන යන්න. හොඳට විභාග පාස්වෙලා විශ්වවිද්‍යාලෙට ගිහින් රැකියාවක් ලබාගෙන ලෝකය දිහා බලන්න. ඒත් දැන් සිද්ධවෙලා තියෙන්නෙ ලිස්සලා ගිය මෝටර් රියක් පාරෙන් එහා පැත්තට පැනල මළකඩ බඳින්න ඔහේ නැවතුනා වගේ වැඩක්. මං කියවල තියෙනව සමහර කාන්තාවන් උත්සාහයෙන් වැඩ කරල තමන්ගෙ රැකියා

www.sinhalaelibrary.com 14

ක්ෂේත්‍රයේ ජයග්‍රහණයන් ලබාපු හැටි. ඒ අය හුඟ දෙනෙක්ම දකුණෙන් ආපු අය. මගේ මනෝලෝකය රැඳිල තිබුණෙ අනාගතයේත් ඒ වගේ රැකියාවක් කරල මගේ අනාගත ස්වාමි පුරුෂයා ඒ ලෝකෙන් සොයා ගන්න අන්දම.

පාසලේදී ඔවුහු මට වික්ටර්ගේ නම කියා විහිළු කළහ. වික්ටර් මගේ ඉතිහාස ගුරුවරයාය. ඔහු පිළිබඳ මනෝ ලෝකවලින් මගේ සිත පිරී තිබිණ.

... මං හදිසියේ විවාහ වූ බව වික්ටර් දැනගත්විට ඔහු මහත්සේ කම්පනයට පත්වනු ඇත. මේ ගැන අසන මගේ ඉංග්‍රීසි ගුරුවරිය වූ ජානකී මෙනෙවිය හොඳටම කෝපවනු ඇත. මා විශ්වවිද්‍යාලයට යනු දැකීම ඇගේ එකම බලාපොරොත්තුව විය.

නැන්දා තවමත් මා ඉදිරියේය. නිවෙස් කීපයකට ඈතින් වූ පල්ලියේ සැන්දෑ යාඥාව මහ හඬ නංවමින් මගේ සවනත ගැටෙයි. තාත්තා එතැන යාඥා කරනු ඇත. යාඥාව ඔහු කිසි දිනෙක අත් නොහරී. කෙසේ වුවද මේ සැන්දෑ පුළඟ සිතට සමීප ශබ්දයන්ගෙන් පිරී පවතී.

"අල්හාජ් බෙලෝට හුඟක් වයසයි."

මම අපහසුවෙන් වචන එක්කාසු කළෙමි.

"වයසයි? ඒත් පිරිමියකුට ඒ වයස වැඩි නෑ. මට සහතිකයි හතළිහකට වැඩි නෑ. වයසක මූසා මාමා අවුරුදු හැටේදි බැන්දෙ"



නැන්දාගේ විස්තර මට අවශ්‍ය නොවීය.

වයසක මිනිසුන් බාල වයස්කාර ගැහැනු ළමයින් හා විවාහවන බව මම දැන සිටියෙමි. තාත්තා වෙනුවෙන් කනගාටුවක් මා තුළ ඇති විය. මම නිහඬ වීමි. මගේ නිහඬතාවය නිසා මා එකඟ වූවා යැයි නැන්දා සිතන්නට ඇත.

"මේ ගැන හිතල බලන්න මට වෙලාව ඕනි."

මම ගොත ගැසුවෙමි.

"දුව තාත්තා ගැන හිතන්න ඕනි."

නැන්දා යළිත් කීවාය.

මහත් කනගාටුවෙන් හා කනස්සල්ලෙන් පසුවන තාත්තා හොඳටම ඇදී පැදී ගොස්ය. මට ඔහු ගැන දුක සිතිණ.

..... තාත්ත වෙනුවෙන් මං මේකට කැමති වෙනව...

එසේ සිතූ මම තාත්තාට යහපතක්ම කළබව සිතමි මා ගැනම සතුටු වීමි. එහෙත් බෙලෝ වැනි පොහොසතකුට මා අවශ්‍යව තිබීම ගැන මා සිත කැළඹීමට පත් විය. ඇත්ත වශයෙන්ම පියා වෙනුවෙන් මේ යෝජනාවට මා කැමති වූවා යයි මගේ නැන්දා සහතික නොවීය.

මගේ පංතියේ මිතුරියන් මගේ නම ඈඳමින් විහිළු කළ වික්ටර් මෙන් නොව බෙලෝ තරුණ විය ඉක්ම වූ කෙනෙකි. ඔහු මගේ පියාට වඩා තරුණ වූවානම් ඒ අවුරුදු කිහිපයකිනි. එලිසබෙත් බෙනට් හා ඩාසිත්, එමා හා නයිට්ලිත් මගේ

www.sinhalaelibrary.com 15

මතකයේ රැඳී තිබූ විවාහ ප්‍රතිරූප දෙකකි. විවාහය ගැන සිතද්දී මගේ මවුපිය දෙදෙනා විවාහයේ ප්‍රතිරූප වශයෙන් කිසිවිටකත් මගේ සිතට නොහැඟුණි. එකිනෙකාගෙන් ඉල්ලාගෙන හෝ මාරුකරගෙන අප එක පිම්මට කියවූ ප්‍රේම වෘත්තාන්තවල සඳහන් පොහොසත් ව්‍යාපාරිකයන් දූප්පත් කාර්යාල සේවිකාවන් හා ප්‍රේමයෙන් බැඳුණු අන්දම කියවෙන කතන්දර මගේ මතකයට නැගිණ. බෙලෝ විවාහකයකු විය හැකි බවත්, ඔහුට බිරින්දෑවරුවන් කිහිපදෙනකුම සිටිය හැකි බවත් ගැන හැඟීමක් පවා මා තුළ ඇති නොවූයේ මා යට කී අදහස්වලින් අන්ධවී සිටි බැවිනි. මේ පාසල අවටම තරුණ කොල්ලන් තරුණ කෙල්ලන් හා විවාහ වන අන්දම මහල්ලන් තරුණියන්ට බැල්ම හෙලන අන්දමත නොඅඩුව දක්නට ලැබිණ. එහෙත් බහු විවාහයන්ට සහමුලින්ම විරුද්ධ වූ මම දෙවැනි නොව තුන්වැනි බිරිඳ වශයෙන් පැමිණීම අදත් මට සිතාගත නොහැකි තරම පුදුමයට හේතුවකි.



## 5

**ඊයේ** උදෑසන බෙලෝ කාමරයෙන් පිටව ගිය පසු මම මොහොතක් කාමරයේ රැඳී සිටියෙමි. ජනේලයෙන් එබී බැලූ තරුණයෙක් වහා මා දුටු නිසාදෝ ආපසු හැරුණේය. මේ උදෑසන තරමක් දහවල් වී මා බෙලෝගේ කාමරයේ සිටිනු දකීම ඔහුට මහත් පුදුමයක් වන්නට ඇත. මම කඩිනමින් නිවස පිටුපසට ගොස් අමුත්තකු පැමිණ ඇති බව මුරකරුට දන්වීමි. තම පියා නික්ම යෑමට පෙර ඔහු හමුවීමේ බලාපොරොත්තුවෙන් ඒ පැමිණ තිබුණේ බෙලෝගේ වැඩිමහල් පුත්‍රයාය. ඔහු ගේ තුළ තම සහෝදර සහෝදරියන් හා කතාබහ කරනු මට ඇසිණ. එහෙත් හවුසා ජනයා අතර තිබූ චාරිත්‍රයක් ලෙසින් ඔහු තම මව හා කතා නොකළේය. හවුසා මවකට තම වැඩිමහළු පුත්‍රයා හෝ ඔහුගේ බිරිඳ සමඟ කතාබහ

www.sinhalaelibrary.com 16

කිරීම තහනම්ය. ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වුවහොත් එසේ කළ යුත්තේ අතරමැදියකු මගිනි. මෙය ඉතාමත් බොළඳ චාරිත්‍රයකි. මෙය මෙසේ පවත්වාගෙන යනු ලබන්නේ පිරිමි දරුවන් තරමක් ඈත්කර තබනු සඳහා විය යුතුය. එවිට පියවරුන්ට තම පුතුන් හා සම වයසේ හෝ ඊටත් වඩා බාල තරුණියන් දෙවැනි හෝ තුන්වැනි බිරියන් ලෙස කැන්දාගෙන ඒමට වඩාත් නිදහස ලැබෙන බැවිනි. එක එල්ලේ ඔහු දෙස බැල්මක් හෙළීමට සිතුණද මම ඒ පසුවට කල්තබා මගේ කාමරයට රිංගා ගතිමි. අපේ විවාහ මංගල්ලය දවසේ ද මා ඔහු දුටු මුත් ඔහු කවුදැයි නොදැන සිටියෙමි. එහෙත් එදා ඔහු ගැන දැන ගැනීමට මට අවශ්‍යව තිබිණ. ඔහු විශ්වවිද්‍යාලයේ උපාධි පූර්ව පාඨමාලාවක් හදාරන ශිෂ්‍යයෙකි. කලින් අවස්ථාවේ ද අප අතර සිනහවකට වැඩි දෙයක් ඇති නොවීය. ඔහු සහෝදරයන් හා කතා බහේ යෙදෙද්දී "අමාරියා" යන වචනය සඳහන් වෙනු මට ඇසිණ. නිවසේ දරුවන් පමණක් නොව මට වඩා වැඩිමහලු අයද මා ඇමතුවේ "අමාරියා" යනුවෙනි.

ඒ දවස, මා "අමාරියා" වූ දවස මා මේ නිවසට කැන්දාගෙන ආ දවස කොතරම් අමුතු දවසක්ද? මුස්ලිම් හවුසා විවාහ මංගල උත්සවයක දී සම්ප්‍රදායානුකූල පිළිවෙත් අනුගමනය කරන්නේ නම් මනාලයාගේ පැමිණීම සිදු නොවේ. මනාලයාගේ පාර්ශවයේ වැඩිහිටි නෑදෑයෙක් මනාලයා වෙනුවෙන් මනාලියට කෑම, බීම, ඇඳුම්, පැළඳුම් සපයමින් ඇය රැක බලාගන්නා බවට පොරොන්දු වෙයි.

අප මෙහි පැමිණියේ හැන්දෑවරුවේය. බෙලෝ සිය ගණනක් කෝලා ඇට මිතුරන් හා නෑදෑයින් අතරේ බෙදා දී



තිබිණි. පැරණි චාරිත්‍ර අනුව මනාලයා දින දෙකක්ම මිතුරන් සමඟ ගෙන් පිටත වාසය කළ යුතු වෙයි. ඒ තම මනාලිය නිවසේ කටයුතුවලට හුරු පුරුදු වන තුරුය. ඒ චාරිත්‍රය පිළිපැදීම දුන් සිදු නොවන අතර මනාලයා රෑ බෝ වී මනාලිය දැක ගැනීමට පැමිණෙයි. අප අතර මේ "පොරොන්දු" අවස්ථාව ඉතාමත් කෙටි එකක් වූ මුත් බෙලෝ මා වෙනුවෙන් තෑගි බෝග රැසක් ගෙනැවිත් තිබිණ. මුස්ලිම් මනාලයා මේ "පොරොන්දු" අවස්ථාව සඳහා පමණක් නොව ආසන්න පවුල් ජීවිතය සඳහා ද තෑගි බෝග ගොඩ ගැසීම සාමාන්‍ය සිරිතකි. මා වෙනුවෙන් ඇඳුම්, රන් ආභරණ, සුවඳ විලවුන්, සපත්තු හා තවත් අවශ්‍ය යැයි සැලකෙන භාණ්ඩ රැසක් ගෙනැවිත් තබා තිබිණ. ඔහු තෑගි බෝග සඳහා මෙතරම් මුදලක් වැය කරන්නේ මක්නිසාදැයි මට පුදුම හිතිණ. එය ඇත්ත වශයෙන්ම ඔහු මට ආදරය නිසාද? නැතිනම් ඔහු මටත් මගේ පවුලේ අයටත් ඔහුගේ පොහොසත්කම පෙන්වීමට දරන වෑයමක්ද? අසුම් මේ තෑගි බෝග දෙස බැලුවේ කෑදර සිතිනි. ඈ විවාහ වන අවස්ථාවේ මේ දේවල් වලින් අඩකින් අඩක්වත් ඇයට නොලැබිණ.

එදින හමටාන් සුළඟ ඉතා තදින් හැමූ දිනයකි. දූවිලි කැරලි ගසමින් සුළඟේ පාවී ගියේය. නිවස ආසන්නයට එනතුරුම අපට නිවස දැකගන්නට නොහැකි වූයේ පරිසරය දූවිල්ලෙන් වැසී ගොස් තිබූ බැවිනි. මා මගේ නෑදෑයන් විශේෂයෙන්ම කාන්තා පක්ෂය කැටුව ඔහුගේ නිවසට පැමිණෙද්දී වේලාව සවස හතරට ආසන්නව තිබිණ. මා මෙයට කලින් මේ නිවස දැක නොතිබිණි. නිවසට ඇතුළු වූ ප්‍රථම අවස්ථාවේදීම නිවස අසල සවිකර තිබූ විදුලි උත්පාදන යන්ත්‍රයේ ඝෝෂාව මගේ සවනතට පහර දෙන්නට විය. ග්‍රාමීය

www.sinhalaelibrary.com 17

ප්‍රදේශවල විදුලි බල සැපයුම රාත්‍රී කාලයට පමණක් සීමා වූ අතර සමහර විට එයද නොලැබී ගියේය.

අප නිවසට ඇතුළු වූ අවස්ථාවේදී විවිධ වර්ගවල ආහාර බඳුන් රාශියක් පිළියෙල වී තිබිණ. බදින ලද මස්, දේශීය ක්‍රමයට පිසූ කෝෂි හා මාසා වැනි මස් ව්‍යංජන, කේක්, විස්කෝතු හා පළතුරු ඒ අතර විය. කාන්තාවන්ට සංග්‍රහ කිරීම මගේ සැමියාගේ ප්‍රථම බිරිඳ වූ පාතිමා වෙතින් සිදුවිය. බෙහෝ වේලාවක් යනතුරු අමීනා දෙවැනි බිරිඳ මගේ ඇස නොගැසිණ. ඇ ප්‍රථම වරට මගේ ඇස ගැසෙද්දී තම සිත තුළ පැවැති තරහ, ආවේගය මැඩපවත්වා ගැනීමට මහත් වෙහෙසක් දරන බවක් පෙනිණ. ඇ හොඳින් හැඩ වැඩවී සිටියද කිසියම් දරදඬු පෙනුමක් එයට එක්කාසු වී තිබිණ. පළමු බිරිඳ පාතිමා මවකගේ පෙනුමෙන් යුක්ත විය. මගේ අනාගත නැදෑයන් කවර අන්දමේ අය වියහැකි දැයි මා සිත තුළ බියක් ඉපදිණ. එහෙත් සමහරක් ජ්‍යෙෂ්ඨ බිරින්දෑවරු තරුණ බිරියන්ට කරුණාවෙන් සලකන අන්දම මම දැක ඇත්තෙමි.

මට වෙන් කරන ලද කාමරයේ පිහන් කෝප්ප, සැරසිලි මෙන් තැනින් තැන ගොඩ ගසා තිබිණ. ඒ මගේ පියා මට දායාද වශයෙන් සපයන ලද ඒවාය. මගේ නෑනලාගේ කිචි කිචියත් මුණු මුණුවත් ඒකම සෝෂාවකි. ඒ රාත්‍රිය සඳහා මා අන්දවා හැඩ වැඩ කිරීමට ඔවුන් සිතවූ කලබලය මැද සිනාහඬ මෙන්ම කෙළි කවට කතාබහේ අඩුවක් නොවීය. සමහර විට මා දිගහැරුණු නාට්‍යයක් නරඹන පිටස්තරයෙකු හෝ පිටත සිට ඒ දේවල් විනිශ්චය කරන නොබැඳි සාමාජිකයකු වැන්න. ඒ අවස්ථාවේ මා සතුටින් සිටියාද මා ඇත්තටම බෙලෝට ආදරය කළා ද යන්න මටත් අදත් සිතා ගත නොහැක.



බෙලෝ වුවද මට ඇත්තටම ආදරය කළාද?

මොහොතින් මොහොත මගේ සිතට නැගුණු සිතුවිල්ල වූයේ මා අනෙක් බිරියන් සමඟ ජීවත් වන්නේ කෙසේද යන්නයි. මේ ගෙදර මගේ තැන කුමක්ද? ජ්‍යෙෂ්ඨ බිරියන්ගෙන් පුහුණුව ලැබීමට හෝ ඔවුන්ගේ අන්තේවාසිකාවක් වීමට මා දොළොස් හැවිරිදි වියේ පසුවන ළදරු මනාලියක් නොවේ.

අන්තිම මොහොත දක්වා 'ඔහුගේ රාත්‍රිය' වෙනුවෙන් මා කෙසේ සැරසිය යුතුද යන්න ගැන මට කිසිදු අදහසක් නොවීය. ඔහුගේ රාත්‍රිය "මුව පුරා ගැනීම" යනුවෙන් හඳුන්වනු ලැබීය. නුවර සිට පැමිණි අයේෂා නැන්දාගේ දුව ලුබා කැමැත්තක් දැක්වූයේ තැඹිලි හා දම් පැහැය මිශ්‍ර ඇඳුමටය. එහෙත් මා කැමතිවූයේ රෝස මල් වැටුණු සුදු ලේස් ඇඳුමටය.

මගේ තේරීමට වඩා ලුබාගේ තේරීම වඩාත් හොඳ බව කාගේත් පිළිගැනීම විය. අනෙක් හැම අවස්ථාවකදී මෙන්ම මට මේ අවස්ථාවේදීත් අනුන්ගේ තීරණයක් පිළිගැනීමට සිදුවිය. ලුබා පමණක් නොව තවත් බොහෝ දෙනෙක් මා හැඩගැන්වීම සඳහා ඉදිරිපත්ව සිටියහ. මුළුතැන්ගේ සඳහා අවශ්‍ය පිහන් හා පිත්තල භාණ්ඩ සඳහා පියා කොපමණ මුදලක් වැයකර ඇද්දැයි මට පසක් වූයේ කාමරය වටා නෙත් යවද්දීය.

"මේ සේරම අපරාදෙ. කවුද මේවා සේරම පාවිච්චි කරන්න ඉන්නෙ?"

මම කටට ආවාට මෙන් කීවෙමි.

"මේව පාවිච්චි කරන්න නෙවෙයි. පරම්පරාවට ගෙනියන්න. ඔයාගෙ දුවට දුවගෙන් දුවට ඒ විදියට අනික

www.sinhalaelibrary.com 18

තාත්ත ඔයාගෙ දැවැද්දට පිහන් බඩු ගොඩක් දුන්නෙ නැත්නම් ඔයාගෙ යෙහෙළියො දෙන්නා සිනාවේවි"

අයේෂා නැන්දා කෙටියෙන් පිළිතුරු දුන්නාය. කොහොම සල්ලි සොයා ගත්තද මන්දා. මාමල උදව් කරන්න ඇති. මට කවදත් ආදරේ බාබා මාමා සල්ලි දෙන්න ඇති. මගේ නෑනාවරු පිහන් භාණ්ඩ ලස්සනට අහුරමින් සිටියහ. මේවා පාවිච්චියට නොව සැරසිල්ලක් වශයෙන් තබන බව වැටහිණ.

බෙලෝ විසින් මනාලිය සඳහා ගෙන එන ලද ඇඳුම් ආයිත්තම් රාශියක් විය. ඇඳුම් තේරීමේ දී මා අපහසුතාවට පත්වූ ප්‍රථම අවස්ථාව මෙය විය. මීට පෙර අවස්ථාවල දී මට තිබුණේ ඇඳුම් කිහිපයක් වූ බැවින් තේරීම පහසු විය. හැමදෙනාම මට ඉරිසියා කරනවා වත්දැයි මට සිතිණ.

"ඔයාගෙ හම දිලිසෙනවා. අතගාන්නයි හිතෙන්නේ. ලලේ වතුරවල හාස්කම් තමයි නේද දාරි."

ඩෙලු කීවේ හිනැහෙමිනි.

ලලේ කොල තැම්බූ වතුරවලින් මා සතියකටත් වැඩි කාලයක් නාවනු ලැබීය. ඒ මගේ හම පැහැපත් වනු සඳහාය.

"දහලන්නෙ නැතුව ඉන්න ළමයො ඔය මොට්ටැක්කිලිය ලස්සනට හරිගස්සනකං"

බින්ටා කීවාය.

"ඇට ඉවසිල්ලක් නෑ. වෙලාව එනකං ඉන්න බැරිව ඔය"



කුලු කීවාය.

"කවුද හැට්ටෙ මැහුවෙ. හරි ලස්සනයි."

සාපියා කීවාය.

"නගරේ ඉන්න ඇඳුම් මහන්නා. ඔහු හැට්ට මහන්නම විශේෂ කෙනෙක්. එයා තමයි බාර දුන්නෙ. මං මිම්ම දුන්නා විතරයි"

බොහෝ විවාහක ගැහැනුන් මෙන් මම මගේ සැමියා නමින් නොඅමතා එයා හෝ ඔහු යනුවෙන් හැඳින්වීමි.

"හා එයාගෙ අණ ද? හරි. ඔළුව හොල්ලන්න එපා. ඔව් අද රෑට තව තව අණ ලැබෙයි. මොහොතකට කෙලින් ඉන්නකෝ."

යල් පැනගිය විහිළු කියවමින් ඔවුහු කිචි බිචි ගා හිනැහෙන්නට වූහ. ඒ මොහොතේ මට ඔබත් ජස්ටිනාත් සිහිපත් විය. වෙනත් සංස්කෘතීන්ට අයත් ඔබ දෙදෙනා හා ඇසුර කොතරම් පුදුම සහගතද? ඒත් ඒ කිසිවක විශේෂයක් දැන් මට නොපෙනේ. ඔබේ රටෙත් තරුණ ගැහැනු ළමයි පොහොසත්කම නිසා වයසක පිරිමින් හා විවාහ වෙනවද? මට හිතෙනව එහෙම කරනව ඇති කියල. ඒත් බහු භාර්යා සේවනය ඔබේ රටේ නැතුව ඇති නේද?

මනඃකල්පිතයන් පුරවාගත් මගේ සිතුවිලි බොහෝ දුර ගමන් කරයි. මම සිතට තර්ජනය කරමින් ආපසු හැරී බැලුවෙමි. ඒ අතර බෙලෝගේ ප්‍රථම රාත්‍රිය සඳහා අමිනා

www.sinhalaelibrary.com 19

සූදානම් වුයේ කුමන ආකාරයකින්දැයි සිතන්නට මම උත්සාහ ගතිමි. තව අවුරුද්දකින් හෝ දෙකකින් සිවුවැනි බිරිඳක් ගෙන එන අවස්ථාවේදී මා එය දරාගන්නේ කෙසේද?

"නැහැ, එහෙම වෙන එකක් නැහැ." මම මටම කියා ගතිමි.

ඔහු මට අවංකවම ආදරය කරනවා නම් සිවුවැනි බිරිඳක් ගේන්න හේතුවක් ඇති වෙන්නෙ නැහැ.... ආදරය කියන්නේ කුමක්ද? ඔහුට මා සමඟ නිදා ගැනීමට ඇති අවශ්‍යතාව, මා සමඟ ලිංගිකව එකතුවීමට ඇති අවශ්‍යතාව පමණක්ද? එසේ නැත්නම් එය තේරුම්ගත නොහැකි, අපැහැදිලි, තාවකාලික දෙයක් පමණක්ද?

"කෙල්ලෙ මේ ඇහුනද? ඔබේ හිනාව ලාබෙට විකුණන්න එහෙම එපා."

සෆියා කීවාය.

"ඔයගොල්ලන්ගෙ පරණ විහිළුවලට හිනාවෙන්න එපා, අර බෙලොගෙ යාළුව ඉරෝ හරි විහිළු කාරය. ඔබව ලාබෙට හිනස්සන්න මිනිහ හොඳ කතන්දර ටිකක් කියාවි බඩ අල්ලාගෙන හිනාවෙන්න."

සෆියා දිගටම කියාගෙන ගියාය.

දාරි මොකටද හිනාව ලාබෙට විකුණන්නෙ, මෙච්චර පොහොසත් මිනිහෙක් බඳින්න ලැබිච්ච එකේ."

ඉලාම් කීවේ ඉරිසියාවෙන් මෙනි.



මම බොහෝ විට විවාහයේ සමීප සබඳතා ගැන සිතන්නට වීමි. විවාහයේ ලිංගික පැත්ත ගැන මා කුතුහලයට පත් නොවුණා නම් එය ඇත්ත වශයෙන්ම අස්වාභාවිකය. මගේ අත්දැකීම් අනුව එය මා තුළ වූ දැඩි බලාපොරොත්තුවක්ද එසේ නැත්නම් එය මා සිත පිළිසිඳගත් කුතුහලයක් ද යන්න මට තවමත් පැහැදිලි නැත. ප්‍රථම රාත්‍රියේ වේදනාව ගැන මා අසා තිබූ විවිධ කතන්දර නිසා මම බෙහෙවින් කලබලයටත් බියටත් පත්ව සිටියෙමි. කායික වේදනාව පිළිබඳ සිතුවිල්ල මා බෙහෙවින් බියට පත් කළාය.

මේ නැනලා හා මිතුරියන් රැළ මට හිතවත්කම් පාමින් මා වටා රොක්වූ මුත් හදවතින් ඔවුන් මට සමීප නොවූ බැවින් ඔවුන් හා මේ කිසිවක් සාකච්ඡා නොකිරීමට මම වගබලා ගතිමි.

ලිංගික සම්බන්ධතා ගැන මා දැන සිටියේ ඉතාමත් ස්වල්පයකි. නේවාසිකාගාරයේ අහුමුළුවලට වී මේ ගැන අපි කියවූ එකම පොත "බියකින් තොර ලිංගික සම්බන්ධතා" යන්න පමණකි. එයිනුදු බොහෝ දේවල් දැන් අමතකව ගොස්ය.

මා කියවූ සමහර ප්‍රේම වෘත්තාන්තවල තිබූ "තරුණියකගේ පියයුරු මත රත්තරන් තුඩු" ගැනත් "පිරිමියකුගේ පිරිමැදීමෙන් ඒ තනපුඩු තදවන" අන්දමත් යාන්තමට මතකයට නැගේ. මගේ සිත බියෙන් වෙලා ගනී. මා කියවූ හැම පොතක්ම වාගේ අත්දැකීම් වැඩි පුරුෂයන්ට හොඳ ආදරවන්තයන් වියහැකි බව සඳහන් කර තිබුණි. එහෙත් මේ ප්‍රේම වෘත්තාන්ත එක් ගැහැනියකට හා පිරිමියෙකුට පමණක් සීමාවී තිබුණි. අපේ ගෙවතුවල එළුවන් වැනි සතුන් සිටි බැවින් ලිංගික සබඳතා අපට රහස් නොවීය.

www.sinhalaelibrary.com 20

මිතුරියන් විසින් වටකර ගනු ලබූ මම ඔවුන්ගේ තොරතෝංචියක් නැති කතාබහට කන් දෙමින් සරසන ලද කාමරයේ මුල්ලකට වී බෙලෝ ඔහුගේ මිතුරන් සමග පැමිණ මගේ සිනා මුව පුරා මිලදී ගන්නා මොහොත ළඟාවන තුරු බලා සිටියෙමි. එහෙත් මගේ සිතුවිලි ඈතට ඈතට ගමන් කරයි.

... කුමාරයා කුමාරිය හා විවාහ වී සතුටින් ජීවත් වෙයි. එලිසබෙත් බෙනට්, ඩාර්සි හා විවාහ වෙයි. සිහින් සිරුරකින් යුත් මගේ ඉතිහාස ගුරුවරයා වූ තරුණ වික්ටර් දවසක මෙසේ කීවේය. "දාරී මං ඔයාට ආදරෙයි. අපි එනගුවලට ගිහින් කසාද බඳිමු." මා ඉවෝ භාෂාව නොදන්නා බැවිනුත් ඔහු හවුසා ගෝත්‍රික භාෂාව නොදන්නා බැවිනුත් ඔහු මේ අදහස් පැවසුවේ ඉංග්‍රීසි භාෂාවෙනි.

..... අනේ අල්ලා දෙවියනේ මට අනුකම්පා කරන්න. මේ වගේ සිතුවිලි මගේ හිතට නැගීමට ඉඩදුන් මා මහා පව්කාරියක්.

මම සිතින් දෙවියන්ගෙන් සමාව අයැදිමි. මොහොතකින් මේ සියලු සිතුවිලි සිතින් ඉවත්කර දමා මම යළිත් බෙලෝගේ මිතුරන්ට මුහුණ දුන්නේ අත්දැකීම් බහුල මගේ අනාගත සැමියා ගැන සිතමිනි.

ඒ මොහොතේම වාගේ මිතුරන් විසින් පිරිවරන ලද බෙලෝ ඉතාමත් ලජ්ජාශීලීව සිහින් සිනාවක් මුවගට නගාගෙන මා ඉදිරියේ පෙනී සිටියේය. වියපත්වූ ගැහැනියක මෙන් මා තුළ ඔහු වෙනුවෙන් දැඩි අනුකම්පාවක් ඉපදිණ. ආදරය ගැන



විසිරුණු සිතිවිලි හා මනඃකල්පිතයන්ගෙන් සිත පුරවාගත් මේ ගැහැනිය තම බිරිඳ බවට පත්කර ගන්නා මේ මිනිසා ගැන මා තුළ කිසියම් බැඳීමක් ඇතිවෙමින් තිබිණ. මා ඔහුට යහපත් බිරිඳක් වන්නෙමැයි මා මගේ සිතට දිවුරුම් දුන්නෙමි. ඔහු තම ව්‍යාපාරික දියුණුවේ ගලායෑම සඳහා තවත් සෙල්ලම් බඩුවකට අත දිගුකරන දරුවකු පමණක්ද? එසේ නැත්නම් ඔහුට මා අවංකවම අවශ්‍ය වී ඇත්ද?

"ඔබ දන්නවද බෙලොයි මමයි සොකොතොවල කාමරයක් අරන් උන්නු අවදියෙ සිද්ධවුණු දේවල්."

"බෙලෝ අසලටම වී උන් අයිරෝ කියන්නට පටන් ගත්තේ මා සිනාගැන්වීමේ බලාපොරොත්තුවෙනි. ඔහුගේ විහිළු කතා ගැන සපියා කලින් වතාවක් කීවා මට මතකය. හිනාවීම තහනම් කළ අයුරකින් මට කට තදකරගෙන සිටියෙමි. හඬ නගා සිනාසීම තබා තොල් සෙලවීමටවත්, මඳ සිනාවකින් ඔවුන්ට සංග්‍රහ නො කිරීමට වත් මම උත්සාහ ගත්තෙමි. මම පිළිමයක් මෙන් නිසොල්මන්ව බලා සිටියෙමි.

"දාරි හිනාවුණොත් මං නයිරා විසි පහක් දෙනව. තිහක් දෙනවා..."

ඔහු නොනැවතී දිගටම මිල ඉහළ නංවන්නට විය. මගේ නෑනාවරු හිනැහෙමින් මුණු මුණුගාමින් මේ රංගනය රස වින්දාය.

අවසානයේදී තද කරගත් මුව විවර වී සිනාපොදක් පිට පැන්නේය. මොහොතකින් නයිරා සියයේ කොලයක් මා වෙතට විසි කළ ඔහු බෙලෝගේ අත අත ඇරියේය.

www.sinhalaelibrary.com 21

"යාළුව අපිට ගහල එලවන්න ඉස්සෙල්ල අපි මේ කාමරයෙන් එළියට පැනගමු."

"එසේ කියමින් බෙලෝ කාමරයේ තනිකර අයිරෝ හා මිතුරන් සියලු දෙනාම කාමරයෙන් පිටව ගියහ. මොහොතකින් බෙලෝ ද පිටව ගියෙන් මා තනිවූ බවක් දැනිණ. ලජ්ජාවට පත් මා තුළ ආශාවත්, උනන්දුවටත් කුතුහලයත් වැඩෙන්නට විය.

අතීතයේ මෙන් නොව මේ දිනවල බොහෝ විවාහපේක්ෂිත තරුණ තරුණියන් විවාහයට සූදානම් වන කාලපරිච්ඡේදය තුළ පවා අඹු සැමියන් වශයෙන් එක්වන බව මා අසා තිබුණි. එහෙත් සම්මතයට පිටුපා නොගිය බෙලෝ එවැනි කිසිදු යෝජනාවක් මා වෙත ඉදිරිපත් නොකළේය. සියල්ල දැන ගැනීමේ ආශාවෙන් සිටියද ඔහු එසේ කිරීම මගේ සතුටට හේතුවිය. එහෙත් මේ කාලය තුළ දෙවරක් ඔහු මා සිප ගත්තේය. මෝටර් රිය තුළදී ඔහු මා සිප ගත්තේ මට රිදුම් දෙන තරම් තදින් මා ඔහුගේ සිරුරට තද කර ගනිමිනි. එහෙත් මොහොතකින් ඔහු මා මුදා හැරියේ තමන් කරන්නේ වැරදි වැඩක් බව මතක්වීමෙන් විය යුතුය. අප ආපසු එන්නට සැරසෙද්දී මගේ සිරුර ප්‍රතික්‍රියා කළ අන්දම ගැන මම දැඩි තිගැස්මකට පත්වීමි.

මා කන්‍යාවියක් නොවූවා නම් ඇතිවිය හැකි තත්ත්වය මවා ගැනීමට මම උත්සාහ කළෙමි. කන්‍යාභාවය සිඳගත් තරුණියකගේ සිතිවිලි මා කෙසේ මවා ගන්නද? ප්‍රථම අඹුසැමි සම්බන්ධයේදී මනාලිය වේදනාවෙන් කෙදිරිගාන හඬ ඇසීමට වැඩිහිටි නෑදෑයකු විවාහ යුවළ නිදාගන්නා කාමරය අසල



නිදාගන්නා බව වරක් ලුබා කීවා මට මතකය. මනාලියගේ වේදනාත්මක කෙඳිරිය නොඇසුණේ නම් කන්‍යාවක් නොවන්නීය. අපේ කාමරය අසළට කිසිවකු නොපැමිණෙත්වායි මම ප්‍රාර්ථනය කළෙමි.

මේ මොහොතේ අමීනා කුමක් කරන්නේදැයි සිතන්නට වූ මට බියක් දැනිණ. සමහර විට ඈ නින්දට යන්නට ඇත. නැත්නම් තම මනාලිය සමඟ තම සැමියා රැය ගතකරන අන්දම ගැන සිතමින් නොනිදා සිටිනවා විය යුතුය. මේ සියළු සිතිවිලි අමතක කරමින් මම ඇඳුම් මාරු කරන්නට වීමි. මංගල ඇඳුම් මුදා හරිද්දී මගේ ඇඟ දිලිසෙන බවක් මටද පෙනිණ. ඒ සතියක්ම ලලේ වතුර ස්නානය කිරීම නිසා විය යුතුය. මේ ලලේ වතුර ස්නානය අපේ සිරුර ගැන අවබෝධයක් ලබමින් පංචකාම සම්පත්තියේ ආලෝකය තුළට අපව රිංගවීම සඳහා පසිඳුරන් සූදානම් කිරීමට ගන්නා වෑයමකි.

සිහින් සිරුරින් යුත් ආදරවන්තයින් ගැන මනඃකල්පිතයෙ: මා කතා කළ නිසා බෙලෝ ඉදිරියට නෙරා ආ බඩකින් යුත් මහල්ලකු කියා හිතන්න එපා. ඔහු හොඳ කඩවසම් පුද්ගලයෙකි. පුළුල් උරහිසින් යුත් ඔහු අඩි හයක් පමණ උසය. බාබා කබායෙන් ඔහුගේ පුළුල් උරහිස්වලට හොඳ පෙනුමක් ලැබේ. අපේ මේ කබාය ගැලපෙන්නේ උස මහත මිනිසුන්ට බව වරක් ඔබ කී අන්දම මට සිහිපත් වෙයි. හැමවිටම ඔහු කෝලා විට හපන මුත් ඔහුගේ දත්වල කහට බැඳී නැත. ඔහුගේ සිරුරේ අනවශ්‍ය මහතක් මට නොපෙනේ.

හමටාන් සුළඟ හමායන කාලය බැවින් අධිශීතකරණ

www.sinhalaelibrary.com 22

හෝ විදුලි පංකා අවශ්‍ය නොවීය. විදුලි උත්පාදන යන්ත්‍රය නවතා දමා ඇති බැවින් පරිසරය මුළුමනින්ම නිහඬය. කාමරයේ මඳ එළියක් විහිදුවන කුඩා චිමිනි ලාම්පුවක් තබා ඇත. ඒ තුළින් බිත්තිය පුරා දිගු සෙවනැලි ඇදෙයි. මම ඒ වනවිටත් කන්නාඩි මේසය ඉදිරියේ වූ සුවපහසු අසුනේ ඉඳගෙන සිටියෙමි. බෙලෝ කාමරයට පැමිණ දොර වැසුවේය. හද ගැස්ම වැඩිවී කිසිවක් කර කියාගත නොහැකිව මම අසුනේ ඉඳගන සිටියෙමි. මඳ සිනාවක් මුවගට නගාගත් ඔහු මා වෙතට පැමිණ සිටගන්නවා කැඩපතින් මම දුටුවෙමි. කබාය ගැලවූ ඔහු තවත් තරුණ වී පෙනිණ. හිස් වැසුමක් නොමැතිව මා ඔහු දුටු ප්‍රථම අවස්ථාව මෙය විය. ඔහු මගේ උරහිස් මතට අත තබා මගේ හිස ඔහුගේ ඇඟට හේත්තු කර ගනිද්දී ඔහුගේ පුරුෂ ශක්තිය කාන්දමක් මෙන් මා වෙතට ඇදී එනු මට දැනිණ. ඔහුගේ දෑතේ පහසින් මගේ ගත වෙව්ලද්දී ඔහු මගේ නිකටෙන් අල්ලා ඔහුගේ දෑස් වෙතට මගේ මුව හැරවීය.

"මගේ වස්තුව"

ඔහු සිහින් හඬින් මිමිණුවේය.

මොහොතකින් මා නැගිටුවා ගත් ඔහු මා ඇඳ වෙතට ඔසවාගෙන ගියේය.

පසුදා උදෑසන තම ප්‍රීතිය බෙදා ගැනීම සඳහා ඔහු මගේ මවට කෝලා විට හා මුදල් යවා තිබිණ.



## 6

**අද** මට රාජකාරි පැවරුණු දිනයකි. මේ දෙදිනක රාජකාරි මුරයේ දෙවැනි දිනයයි. දැන් රාජකාරි මුරය සාමාන පිළිවෙල අනුව යෙදී තිබේ. අලුත ගෙනා මනමාලිය සමග ස්වාමියා මුල් සතිය ගත කිරීමෙන් පසු රාජකාරි මුර සාමාන්‍ය ක්‍රමයට පිළියෙල වෙයි. කෑම බීම සඳහා බොහෝ දෙනෙක් පෙව් සිටින බැවින් ආහාර පිසීම ගැන සොයා බැලීම වුවද විශාල රාජකාරියකි. වස්සාන කාලයේදි ගොවිපොළට ආහාර ගෙන යාම ආදී අමතර කටයුතු ද යෙදී තිබේ. ගෑස් ලිපක් තිබුණ ද අනෙක් බිරියන් දෙදෙනා ආහාර පිසුවේ දර ලිපෙනි. සියල්ලටම පොදු බත් මුට්ටිය හෝ අල මුට්ටිය දර ලිපේ ඉවීම පහසුය. කෙසේ වුවද ඊයේ හවස බෙලෝ විසින් හිස් ගෑස් සිලින්ඩරය බාරදී අලුත් සිලින්ඩරය ගෙන එන ලදි.

www.sinhalaelibrary.com 23

ගෑස් ලිප බොහෝ කාලයක් පාවිච්චි නොකළ බවට එය සාක්ෂියකි. අලුත් සිලින්ඩරය ගෙන එනු දුටු අමීනා මුහුණ දික්කරගෙන රවා බැලුවාය. මට ඒ බැල්මෙන් ගැලවීමක් නොවීය. එය මගේ රාජකාරි දිනය වූ බැවින් ගෑස් සිලින්ඩරය ගෙන ආ බව ඈ සිතන්නට ඇත. දවල් කෑමට බෙලෝ නිවසේ සිටියේ ඉතාමත් කලාතුරකිනි. රාත්‍රී ආහාරය සඳහා මම ඔහුට විශේෂ කෑම පිඟානක් පිළියෙල කළෙමි. ඒ පොදු බත් මුට්ටියේ ඉතිරිවන කොටස ඔහු වෙනුවෙන් තැබීම මදිකමක් යැයි මා සිතූ බැවිනි. මා පාසලේදී ඉගෙනගත් කෑම වට්ටෝරුවක් අනුව කෑමක් සෑදීම සඳහා පෝරණුව පාවිච්චි කරද්දී අමීනා කුතුහලයෙන් බලා සිටියාය. මා වෙත පැමිණ මා කෑමට පිළියෙල කරන්නේ මොනවාදැයි කෙළින්ම අසන්නට නොහැකිවූ අමීනා අලුත් මුළුතැන්ගේ අසලින් කිහිප වරක්ම එහෙ මෙහෙ ගියාය.

"ගෑස්වලට පිච්චෙන්නද හදන්නෙ"

ඇගේ කුඩා දියණිය ජෙසීමා මුළුතැන්ගේ තුළට රිංගාගනු දුටු අමීනා මහ හඬින් කෑ ගැසුවාය. ඒ දැරියගේ ආරක්ෂාව පතා කී දෙයක් නොව මටත් අලුත් ගෑස් සිලින්ඩරයක් ගෙන දුන් බෙලෝටත් කළ ඇනුම් පදයකි. මව කතා කරන බව ජෙසීමාට පැවසුවද ඈ මා සමඟ මුළුතැන්ගේ තුළ සිටීම ප්‍රිය කළාය. කුඩා දැරියක වුවද තම මව අනෙක් පුද්ගලයන්ට ඇනුම්පද කීම සඳහා තමා පාවිච්චි කරන බව ජෙසීමා දැන සිටියාය.

මම ආහාර පිසීම අවසන් කොට බෙලෝට ස්නානය කිරීම සඳහා වතුර මුට්ටියක් ලිප තැබීමි. අද දින විදුලි බලය



ඇත්තේ රාත්‍රී නවය වනතුරු පමණි. ඉන් පසු විදුලි පහන් නිවී ගිය බැවින් මම සුපුරුදු චිමිනි ලාම්පුව දැල්වීමි. සියල්ලෝම නිදි ලොවට පිවිස ඇති බැවින් මුළු නිවසම දැඩි නිහැඬියාවක ගිලී තිබිණ. මට කිසියම් නිදහසක් දැනිණ. තවත් බිරියන් දෙදෙනකු සිටින නිවසක මා හැමවිටම ඔවුන්ගේ ග්‍රහණයට අසුවූවාක් මෙන් දැනේ. මට හුස්ම ගැනීමට පවා බැරි තරමිය. ඔවුන්ගේ තර්ජන ගර්ජන වලින් ඈත්වී සිටීම සඳහා ඔවුන් ඉදිරියට නොයෑමට නිතරම මගේ සිත මට බල කරයි. එහෙත් බොහෝ දෙනකු සිටිනා තැනක මට පමණක් කොන්වී සිටිය හැකිද? මා උවමනාවට වඩා සංවේදී තැනැත්තියකැයි ඔබ සිතනවා ඇත. ඒක එහෙම වෙන්න ඇති. එත් මා වෙන මොනවා කරන්නද? මා ඒ සංවේදී බවින් මිදීමට කොතෙක් උත්සාහ කළද මා තුළින් ඒ සංවේදී ගැහැනිය යළි යළිත් මතුව එයි. සමහර වෙලාවකට මට හිතෙන්නේ මේ සියල්ලටම මුල මා ලැබූ අධ්‍යාපනය විය යුතුය කියා. මා කියවූ දේවල් නිසා මා මෙසේ හැඩ ගැහෙන්න ඇති. පොතක් පතක් නොකියවා අධ්‍යාපනයක් නොලබා සිටියා නම් මේ බහුබාර්යා සේවනය මට පිළිගත හැකිව තිබිණ.

මේ විශාල නිවස තුළ මට දරාගත නොහැකි තරම් තනිකමක් දැනේ. සෙනඟ රැසක් මැද දැනෙන තනිකම වඩාත් දරුණුය. මා තුළ කිසියම් බැඳීමක් ඇත්නම් ඒ ඇත්තේ මේ නිවසේ ජීවත්වන කුඩා දරුවන් සමග පමණි. විශේෂයෙන්ම අබූ සහ ජෙසීමා මගේ මිතුරන්ය.

බෙලෝගේ මාමා කෙනෙකු වූ බැරෝද මෙහි අප සමග ජීවත්වෙයි. බිරිඳ හා එකම පුතු මියගිය පසු ඔහු තම විවාහක දියණියගේ නිවසේ ජීවත්වීමට ඇති අකැමැත්ත නිසා මෙහි

පැමිණ සිටී. ඔහු මා සමග නොයෙකුත් කතන්දර කියවයි. ඒ අනුව ඔහු සතුටින් ජීවත් වන බව මට හැඟේ. කුඩා දරුවන් හැරුණු විට වගේ තනිකම මකා දැමීමට සිටින එකම පුද්ගලයා ද ඔහු වෙයි.

සමහර අවස්ථාවලදී කාලය ගෙවා ගැනීම ඉතාමත් අපහසුය. මේ නිවසේ කියවීම සඳහා ඇත්තේ කුරානයත් කෘෂිකර්මය පිළිබඳ පත්‍රිකා කිහිපයකුත් පමණි. කියවීමට කිසිවක් නැති බැවින් දිනක් මට කෘෂිකර්මය පිළිබඳ පොතක් මුල සිට අග දක්වාම කියවීමි. වැඩි කාලය පැමිණි විට මගේ ගෙවත්තේ ඇති පුංචි ඉඩ ප්‍රමාණයේ හෝ යමක් සිටුවීමට ඒ මට උපකාරී වේ යයි පසුව සිතිණ.

කාලය ගෙවා ගැනීම සඳහාම මා යම් යම් දේවල් කළ යුතුව තිබුණි. ඊයේ දවසින් හරි අඩක්ම මම මගේ පරණ හැට්ටයක් අලුත් කිරීම සඳහා ගත කළෙමි. මැහුම් ගෙතුම්වලට මා කවදත් අදක්ෂය. ගෙදරටම කොටුවූ ගෘහණියකගේ චරිතයට මා නුසුදුසු වීමට මෙයද එක් හේතුවකි.

මට කරන්නට දෙයක් නැති තරමට ඇඳුම් පැළඳුම් ලැබී තිබේ. බෙලෝ අපේ ඇඳුම් පැළඳුම් සඳහා විශාල මුදලක් වැය කරයි. මා වෙනුවෙන් ඇඳුම් මිලදී ගන්නා අවස්ථාවලදී ඔහු එයින් අඩක් හෝ තුනෙන් එකක් පාතිමාටත් අමීනාටත් ගෙනදිය යුතුය. බිරියන් කිහිපදෙනෙකු තබා ගැනීමට නම් පුරුෂයා බෙහෙවින් පොහොසත් විය යුත්තේ එබැවිනි.

ඒ අවදිය ගැන සිතා ගැනීමටත් බැරි තරම්ය. විවාහ අපේක්ෂිත අවස්ථාවේදී මෙන්ම විවාහයේදී ඔහු මට ගෙනැවිත්



දුන් තෑගි වරුසාව ඔහුට තවත් බිරියන් සිටින බව දැනගත් අවස්ථාවේ ඇතිවූ කම්පනයෙන් මිදෙන්නට මට වක්‍රාකාරයකින් උදව් විය. බෙලෝගේ වයසේ මිනිසෙක් මගේ දෙපා මුලට එනතුරු තනිකඩව සිටියා යයි සිතන්නට තරම් මා මෝඩ වූවා නොවේදැයි ආපසු හැරී බලද්දී මට සිතෙයි.

අනෙක් බිරියන් ගැන අසන්නට ලැබීම මා මහත් සේ කම්පනයට පත් කරමින් මගේ පිටුපසට වැදුණු වෙඩි පහරක් මෙන් විය. ඒ මොහොතේ මට ඇතිවූ එකම සිතිවිල්ල වූයේ මෙය ජස්ටිනාට හෝ මගේ ගුරුවරිය වූ ජානකී මෙනෙවියට පවසන්නේ කෙසේද යන්නයි.

"දාරී ඔයා කවදාහරි දෙවැනි බිරිඳක් වශයෙන් යනවද?"

බිත්තියට සවිකර තිබූ හතරැස් කැඩපත ඉදිරියේ සිටගෙන තම මොට්ටැක්කිලිය සකස් කරමින් ජස්ටිනා කතා කරන්නට වූයේ කැඩපතේ පෙනෙන තම ඡායාවට කතා කරන්නාක් මෙනි.

"අහන්නෙ මගෙන්ද ඔයාගෙන්මද? ඔයා කියපු විදියට මට නම් තේරුණේ දෙවැනි සේවිකාව කියනව වගේ"

පාසල් නේවාසිකාගාරයේ ඇඳ උඩ වැතිර ගත්වනම මම ඇසුවෙමි.

"මෝඩි මං අහන්නෙ උඹෙන්. මං ක්‍රිස්තියානි ආගම්කාරයෙක්. නැද්ද හොඳයි: මරණයෙන් අපි වෙන් කරනා තුරු එක මිනිහයි. එක බිරිඳයි අපේ ආගමේ හැටියට"

www.sinhalaelibrary.com 25

ඈ ඇගේ අවංක අදහසට විහිළු ස්වරයක් ද එක් කරමින් පැවසුවාය.

"උඹලගෙ දකුණෙ ආගමිකාරයො තව ගෑනු පස්සෙ යන්නෙ නෑ වගේ."

මම උපහාසාත්මක ස්වරයෙන් පැවසීමි.

"ඇත්ත. ඇත්ත. ඒත් මං මගේ මිනිහට එහෙම කරන්න දෙන්නෙ නෑ."

එසේ කියමින් ඈ ඇඳට පැනගත් කල ඇඳ තොටිල්ලක් මෙන් පැද්දෙන්නට විය.

"එතකොට ඔයයි ඔයාගෙ මහත්තයයි බිත්තරේ සුදු මදෙයි කහ මදෙයි වගේ. මතකද පහුගිය ඉරිදා පත්තරේ තිබුණෙ එක බිරිඳක් ඇගේ මහත්තයට යවපු සුබ පැතුම් පණිවිඩයක් එක්ක තිබුණ උපමාව"

"මං දැක්කා. ඒත් ඒක ටිකක් පැහැදිලි මදියි. එහෙම නේද?"

එසේ කියමින් හිනැහෙන්නට වූ ඇගේ කතාව නොනැවතිණ.

"ඇත්තටම අපේ නයිජීරියන් කවියන්ගෙ උපමා කොයිතරම් අපූරුද? දෙවියනේ! නිකම් හිතන්න කහ මදෙයි සුදු මදෙයි. කවුද සුදු මදේ? කවුද කහ මදේ...?"



"හොඳම කෑල්ල ඒක නෙවෙයි. පත්තරේ අනික් පිටුවෙ තිබුණ ඒ මනුස්සයගෙම අනිත් බිරිඳ පළ කරපු තවත් සුබපැතුම් පණිවිඩයක්"

මම කීවෙමි.

"මොකක්ද ඈ කියල තිබුණේ. කටුවයි සුදු මදෙයි වගේ කියලවත්ද? ඇයි ඔබ මේ ගැන අපේ පාසල් සඟරාවට ලිපියක් ලියන්නෙ නැත්තෙ. නයිජීරියානු බිරියන් තම ස්වාමිපුරුෂයන් සම්බන්ධයෙන් මවාගත් රූපක කියල."

"මම නම් මගේ ජීවිතේ කවදාවත්ම දෙවැනි බිරිඳක් වෙන්නෙ නෑ. තවත් එක්කෙනෙක් දෙන්නෙක් එක්ක එක ගෙයි ජීවත් වෙනව කියල නිකන් හිතල බලන්න."

මා ඒ වචන පැවසුවේ එහි බරපතලකම හොඳින් තේරුම් යන අයුරිනි. ඒ මොහොතේ ඒ බිය දනවන දර්ශනය සිතින් මවාගත් මා වෙව්ලා ගිය අන්දම මට තවමත් මතකය.

"කුමාරයා ඇවිත් මාව රථයට නංවාගෙන ඔහුගෙ මාළිගාවට මාව අරගෙන යාවි. අපි ඊට පස්සෙ හැමදාම සතුටින් ජීවත්වෙනවා."

මා ඒ වචන පැවසුවේ දෑත් දෙපසට විහිදුවා රංගනයක් මවා පාන්නාක් මෙනි.

"ඒත් මේ සේරම මහා බලගතු අල්ලා දෙවියන්ගේ නියමය අනුව සිද්ධ වේවි."

www.sinhalaelibrary.com 26

ඒත් මේ මොහොතේ මා කතාව අවසන් කළේද බොහෝ දේනාගේ අදහස්වල අනුකරණයකිනි.

"තව දෙන්නෙක් පාලනය කරන ගේකට ගිහින් ජීවත් වෙන්න මට බයයි. මගේ හිතටත් හරි නෑ."

මා බෙලෝ සමග පවසද්දී ඔහු මහ හඬින් සිනා පෑවේ මගේ අදහස් බොළඳ සම්ප්‍රප්පලාපයක් යයි ඉවත දමමිනි.

"මගේ ගෙදර පාලනය කරන්නෙ මම මිසක් වෙන කවුරුවත් නෙවෙයි."

එසේ කියමින් ඔහු ගතානුගතික අදහස් උපුටා මා වෙතදමා ගැසීය.

"මිනිහෙක් ගෑනියෙකුට කෑම බීම, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම් දෙනවනං තවත් මොනවද? අනික ඕන තරම් ලොකු ගේකුත් තියෙද්දි"

ඔහු යළිත් කීවේය.

වැඩිමල් බිරියන්ට දෙවන තුන්වන බිරියන් යටත් විය යුතු බව ඉස්ලාම් ආගමේද කියා ඇති බව මට සිහිපත් විය.

"ඒ අයගෙන් වැඩක් නෑ. ඔබටයි මං ආදරේ"

ඔහු එසේ කියතැයි අසන්නට මම බලාපොරොත්තු වීමි. එහෙත් ඔහු කිසිවිටෙකත් එසේ නොකීවේය. ඔහු මට සැලකුවේ ගැහැනියකට වඩා පොඩි දරුවකුට ලෙසිනි.



බෙලෝ තම පළමුවැනි බිරිඳ වූ පාතිමා සමග විවාහ වී ඇත්තේ වයස අවුරුදු දහනවයේදීය. 'පාතිමා' පෙනුමෙන් වයසට ගොස් ඇතත් ඈ බෙලෝට වඩා අවුරුදු කිහිපයක් හෝ බාල විය යුතුය. දැන් බෙලෝගේ වයස අවුරුදු 40 ක් හෝ 42 ක් විය හැක.

මං ඔබට ආදරෙයි. කීමට කිසිවිටක හෝ බෙලෝට සිත් දුන්නා දැයි මම නොදනිමි. මනාලියගේ ගාස්තුව වශයෙන් මා වෙනුවෙන් විශාල මුදලක් ගෙවීම ඔහුගේ හැඟීම් පිළිබඳ සාක්ෂියකැයි ඔහු සිතයි. මා කැත, බකල කකුලින් යුත් වපර එකියක් වූවා නම් ණය මුදලට කුමක් සිදු වේද?

"ඔව් දාරී ඔබ යන්නෙ තුන්වැනි බිරිඳ වශයෙන්. දෙවැනි බිරිඳ වශයෙන්වත් නොවෙයි." ඔහු විවාහක බව දැනගත් මොහොතේ ඇතිවූ කම්පනය තුළින් මම මටම කියා ගතිමි. ඇඳ මත වාඩිවී හිස දණ මත ඔබාගෙන මම මටම කියා ගත්තේ අමුත්තකු අමතන ලෙසිනි. මා හිස ඔසවා බලද්දී දැස් නොපෙනී ගොස් මගේ හිස බමන්නට විය.

"ඇයි මට මේ ටික කලින් කිව්වෙ නැත්තෙ."

මම ඔහු දෙස නොබලමින් ඇසුවෙමි.

"මොකක්ද ඒකෙ අමුතුවෙන් කියන්න තියෙන්නෙ?"

ඔහු කතා කළේ එහි කිසිදු අමුත්තක් නැති බව අඟවමිනි. එය එසේමය. බෙලෝ විවාහකයකු වීමට ඇති ඉඩකඩ ගැන නොසිතූ මා මහා මෝඩියකි. මා හිතන විදියට මේ මා ඉංග්‍රීසි නවකතා කියවීමේ ප්‍රතිඵලයකි. අප්‍රිකානු නවකතාවල

වුවද බහුබාර්යා සේවනය ගැන සඳහන් වූයේ පැරැන්නන්ගේ පිළිවෙතක් වශයෙන් පමණි.

ඔහුගේ ගෝත්‍රයේ බොහෝ මිනිස්සු තමන්ට විය පැහැදම් කළ හැකි නම් බිරියන් දෙතුන් දෙනෙක් පාවා ගත්හ. කෑම බීම, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල් යන වචන කිහිපය මට දැනුණේ අපහාසාත්මක ලෙස සත්ව කොටසක් ගැන කතා කරනා සෙයකි. මගේ සිහින දාමය බිඳ වැටුණු බව ඔහු හා කෙසේ කියන්නද? ඔහු මුදල් සෙවීම සඳහා අලුත් මං හොයා ගත්, අලුතින් පොහොසත් වූ පංතියට අයත් වූවෙකි. මේ අන්දමින් මුදල් සෙවීම ඔහුගේ පියා හෝ පියාගේ පියා නොදැන සිටියේය.

බොහෝ දේවල් වෙනස් වී ඇති අන්දම සිතාගැනීමට මම වෑයම් කළෙමි. බෙලෝගේ පියා වැසි කාලයේදී බීජ වපුරමින් අස්වැන්න නෙලා ගනිමින් තම බිරියන් සමග ජීවත් විය. අස්වැන්න ලබාගත් පසු පොළොව යට කණින ලද බෙනයක තැන්පත් කළේය. වැසි නැතිව නියඟය පැමිණි විට ගමේ ආගමික ගුරුවරයාගෙන් උගත් අරාබි බසින් ශුද්ධ වූ කුරානය කියවමින් අල්ලා දෙවියන්ගේ බලමහිමය වෙනුවෙන් යාඥා කරන්නට වූහ.

ඉන්පසු ඈත ගම්වලටද පාසල් පැමිණියේය. ඒ බව අසා දැනගත් බෙලෝගේ පියා ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලැබීම සඳහා තම මාමා කෙනෙකුගේ නිවසේ බෙලෝ නැවැත්වීය. බෙලෝ ඉමි අතර මුදල් ආයෝජනය කිරීමෙන් මුදල් ඉපයීමේ ක්‍රම මාමාගෙන් උගත්තේය. එහෙත් විවාහ සිරිත් විරිත් තවමත් වෙනස්වී නැත.



මා සැහැල්ලුවෙන් සතුටින් සැලකූ වික්ටර්ගේ නම අලලා මගේ මිතුරියන් සෑම දෙනාම විහිළු කළහ. පංතියේ හැම දෙනෙක්ම සිතුවේ වික්ටර් මට අමුතු ලැදියාවක් දක්වන බවත් පාඩම් කියාදීමේදී විශේෂත්වයක් දක්වන බවත්ය.

"දාරී, දාරී, අප පහළ පංතියේ අයනේ.... ඒකයි සර්ට අපිව පේනෙන්නෙ නැත්තෙ"

වරක් ඩේලු කීවේ ඇනුම්පදයක් ලෙසිනි.

"සාමයයි සමාදානයයි උතුරයි දකුණයි එකතුවෙලා"

තවත් කෙනෙක් කීවේ කටහඬ වෙනස් කරමිනි.

"ඉබෝ ගෝත්‍රික බෑනා කෙනෙකුට අම්මා කොහොම කැමති වෙයිද?"

ඒ තව කෙනෙකුගේ සිතට නැඟුණු ප්‍රශ්නයකි. එහෙත් පංතියේ ඉතිහාස විෂයෙන් මා ඉහළම තැනක සිටි බව ඔවුන්ට අමතක වී ගොස්ය. මා හිතන විදියට නම් වික්ටර් මට විශේෂ ලැදියාවක් දැක්වූයේ එබැවිනි. මා ඉතිහාස විෂයට ඉතාමත් කැමතිය.

"වික්ටර් බෙලෝට වඩා කොයිතරම් වෙනස්ද? නයිජීරියානු විශ්වවිද්‍යාලයෙන් අප්‍රිකානු ඉතිහාසය සම්බන්ධයෙන් ඔහු උපාධියක් ලබා තිබේ. යුරෝපීය ඇඳුම් ඇඳි ඔහු විශාල පොත් පරිහරණය කළේය. වික්ටර්ගේ පවුලේ අය හවුසා ගෝත්‍රිය ලේලියකට කැමති වෙයිද? වික්ටර් හෝ ඒ හා සමාන අයකු හා විවාහ වූවා නම් මට විශ්ව විද්‍යාලයකට ඇතුළත්

www.sinhalaelibrary.com 28

වීමට ඉඩ තිබුණි. එවිට අප දෙදෙනාටම රැකියාව කරමින් නගරයේම ජීවත් වීමටත්, ගමන් බිමන් වලදී බොහෝ අත්දැකීම් මෙන් තවත් බොහෝ දේ ලබා ගැනීමටත් ඉඩ සැලසෙනවා නිසැකය.

මගේ පාසල් මිතුරියන් බෙහෝදෙනා සිතන්නේ බෙලෝ හා විවාහවීම මා ලැබූ විශිෂ්ට ජයග්‍රහණයක් ලෙසිනි. ඔහුගේ සුඛෝපභෝගී මෝටර් රථ දෙක පමණක් වුවද මගේ මිතුරියන්ගේ සසලවූ යෞවනත්වය උදුරා ගැනීමට සමත් විය. එසේ නම් ඇයි මට පමණක් මේ සියලු වටිනාකම් සතුටින් භුක්ති විඳිය නොහැකි වූයේ. ජානකී ගුරුතුමිය එක් දිනක් ඉංග්‍රීසි සාහිත්‍ය පාඩමේදී සිතට වහල්වූ පුද්ගලයන් ගැන කතා කළා මට මතකය. මාත් එබඳු පුද්ගලයෙක්ද? මට සිතා ගත නොහැක.

රාත්‍රි දහයේ කනිසම පසුවී ඇතත් බෙලෝ තවමත් ගෙදර නොපැමිණියේය. ඔහුගේ ස්නානය සඳහා උණු කළ වතුර මුට්ටියද නිවී ගොස්ය. හැම දෙනම නින්දට ගොස් ඇති බැවින් මුළු ගෙයම නිහඬතාවයේ ගිලී ගොස්ය. ඈත කැලෑවකින් වැසුණු ගම්මානයකින් නැගී එන සිහින් බෙර හඬක් මා සවනත පතිත වෙයි. බෙලෝ මෙතරම් පමාවන්නේ මක්නිසාදැයි මට සිතාගත නොහැක. මහළු මුරකරුවාද ආලින්දයේ තද නින්දක වැතිර සිටී. විමිනි ලාම්පුවේ එළියෙන් මගේ සෙවනැල්ල බිත්තියේ කොනක දිගට පෙනේ. තම සැමියා එනතුරු මෙසේ අවදියෙන් බලා සිටින එකම බිරිඳ මා පමණකැයි මට සිතේ. ඔහුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් මම ඔහුගේ කාමරයට පැමිණ සිටිමි. සාමාන්‍යයෙන් ඔහු ගෙදර නැති විටක අන් කිසිවකු ඔහුගේ කාමරයට ඇතුළු නොවෙයි. එදින රාජකාරියට



අනුමත නොවූ කිසිම බිරියක් විශේෂ ආරාධනයක් හෝ හදිසි අවස්ථාවක් නොවූයේ නම් තම සැමියාගේ කාමරයට ඇතුළුවීම වැරදි ක්‍රියාවක් සේ සැලකේ.

මෝටර් රියක අලෝකය ජනේලය තුළින් ගෙට ඇතුළු විය. අපේ කාමරවල මෙන් නොව බෙලෝගේ කාමරයේ පිටතට ඇරිය හැකි ජනේලයක් තිබේ.

www.sinhalaelibrary.com 29

## 7

මා තවමත් අවදිව සිටිනු දුටු බෙලෝ මහත්සේ පුදුමයට පත්විය. මා ඔහුගේ කාමරයේ සිටීම ඔහුගේ පුදුමය තවත් වැඩිවීමට හේතුවිය. පුදුමය සමගම සතුටක්ද ඔහුගේ මුහුණින් පෙනිණ. තම ප්‍රමාදය විස්තර කිරීමට ඔහු මහත් වෙහෙසක් ගත්තේය.

"අද බිල් හදල ගණන් හිලව් ඉවරයක් කරන්න බැරිවුණා රෑ වෙනකම්. ඒත් මං ගෙදර එන්නෙ කොයිවෙලේද කියල බල බල උන්නෙ. විශේෂයෙන්ම අද දාරීගේ දවසනෙ."

එසේ කියමින් ඔහු හිනැහුණේය.

දාරී තවම කෑවෙ නැද්ද?"

"නැහැ"



"මොනවා? එහෙනම් මං එනකන් හිටිය." ඔහුගේ කටහඬට පුදුමය මෙන්ම සතුටද එක්වී තිබිණ. අප දෙදෙනා ප්‍රථමවරට එකට එක්වී කෑම ගතිමු.

"නිහඬතාව බිඳුනේ ඇතින් ඇසුණු සියුම් බෙරහඬකින් පමණි. රාත්‍රිය පියගෙන හමා ආ මඳ සුළඟේ සුවදායක සිසිල බලාපොරොත්තුවලින් පිරී තිබිණ. ඔහු මගේ ඇඟට අත තබද්දී ඒ සිසිලෙන් මගේ හදවත ගැහෙන්නට පටන් ගත්තේය.

"ගෙදර සේරටෝම උයල දාරීට මහන්සිත් ඇති."

"නෑ උදව්වට අය ඉන්නවනෙ"

"කෑම හරි රසයි. මං හුඟක් කෑව"

ඔහු මගේ උරහිසට තැබූ අත ඉවතට නොගනිමින් කීවේය.

"එහෙනම් ඇයි ගිහින් නිදාගන්නෙ නැත්තෙ"

ලාම්පුව නිවා දැමීමට උත්සාහ කළ මම එසේ කියමින් හිනැහුනෙමි.

"එපා"

එසේ කියමින් ඔහු මගේ අත ඉවතට ගත්තේය.

"මට ඔයාගෙ ලස්සන බලන්න ඕනි"

එසේ කියමින් ඔහු ලාම්පු තිරය උස් කරමින් කාමරය

www.sinhalaelibrary.com 30

ආලෝක කළේය.

මා වෙතට යොමුවූ ඔහුගේ දෑස් ගිනි පුළිඟු දෙකක් මෙන් බැබැලිණි. ඔහුගේ දෑත ඒ දෑස පසුපස ඇදෙද්දී ඈතින් ඇසුණු බෙරහඬ මගේ දෙසවන් තුළටම විත් නද දෙන්නට විය. මොහොතකින් එහි සැඟවුණු තාලය දෝංකාරය දෙමින් පුපුරා ගියේය.

බොහෝ වේලාවක් ඔහු අසල වැතිර උන් මම කිහිපවරක්ම ඔහුගෙන් අසන්නට පුල පුලා උන් ප්‍රශ්නය වචනවලට නැගීමි.

"ඔයාව සුන්නත් කරනකොට ලොකු වේදනාවක් දැනුනද?"

"ඔව් දෙවියනේ හරියට රිදුණා. ඒ වේදනාව සිහිපත්වූ කලක මෙන් ඔහු මුහුණ ඇද කරමින් පිළිතුරු දුන්නේය.

"ඉතින් ඔයාට බය හිතුනෙ නැද්ද?"

"අපොයි බය හිතුණ. සමහර වේලාවට පිරිමි ළමයින්ට මේක දැන ගන්න තියන්නෙ නෑ. ළමයි බයවෙලා ගෙදරින් පැනල දුවයි කියල. මං දැනගත්ත මේ දේ සිද්ධවෙන බව. ඉතින් මං උත්සාහ කළා බය නැතිව ඉන්න. අවුරුදු හතක් වෙනකොට හොඳට තේරෙනව. ඉතින් බය නොවී ඉන්න අමාරුයි."

"හුඟක් රිදුනද?"

"ඔව් මට දැනුත් මතක්වෙනව මං කෑ නොගහ ඉන්න



ගත්ත උත්සාහය. එකපාරටම මට හෙල්ලෙන්නවත් බැරිවෙන්න අල්ල ගත්තා. බාබර් ආවා. කකුල් දෙක දෙපැත්තට පළල් කළා. දෙවියනේ එහෙම වේදනාවක් මට දැනුනෙ විදුලිය පිටවෙනව වගේ. එකම සහනයකට තිබුණේ සුමානයක් යනකං හොඳ හොඳ කෑම ජාති කන්න බොන්න ලැබුණු එක විතරයි. ඊට පස්සෙ මට දැනුණා මං ලොකු මිනිහෙක් වුණා වගේ."

"ඉතින් අපට පුතෙක් හම්බවුණොත් පුතාවත් සුන්නත් කළ යුතුද?"

"අපොයි ඔව්. පුතා සුන්නත් නොකර ඉන්න ඕනි කියල එහෙම මට කියන්න එන්න එපා."

"අපි බාබර්ට කියල නෙවෙයි. රිද්දන්නෙ නැති වෙන්න දොස්තර කෙනෙකුට කියල කරව ගමු. වේදනාවක් නොදැනෙන්න කරන්න දොස්තරල ළඟ ක්‍රම ඇතිනෙ."

"ඒකෙන් එයාට හානියක් නෑ. ඒ අවස්ථාවට මූණ දෙන්න තරම් පුතා නිර්භීත වෙන්න ඕනි. මං හිතනව පුතා එහෙම වේවි. අනික අපේ මිත්‍රයට බාබර්ට ඒ වැඩේ වෙන කෙනෙකුට භාර දුන්නොත් තරහ යාවි."

"ඒකට කමක් නෑ. ඔයාට පුළුවන් බාබර් කැඳවල ඒ වැඩේ නොකළත් ඒකට ගෙවිය යුතු ගාස්තුවයි තෑගි බෝගයි ඔහුට ලබාදෙන්න."

"මොකද ඔයා මේ තරම් මේ ගැන කතා කරන්නෙ. දරුවෙක් ලැබෙන්න මුල පුරලද?"

www.sinhalaelibrary.com 31

"නෑ… මට දරුවෙක් ලැබුණත් දුවෙක් වෙන්න කියල මං ප්‍රාර්ථනා කරනවා."

"හරි, අපි එහෙනම් දූන් දුවෙකුට උත්සාහ කරමු."

ඔහු හිනැහෙමින් යළිත් මා ඔහුගේ ග්‍රහණයට හසුකර ගත්තේය.

අපි කිසිම විටක දරුවන් ගැන වැඩිපුර කතා බහ නොකළෙමු. මා වඳ ස්ත්‍රියක් නොවූවානම් හැකිතරම් ඉක්මනින් මා දරුවකු බිහිකරතැයි ඔහු සිතන්නට ඇත. එහෙත් මට අවශ්‍ය වූයේ උපත් පාලන ක්‍රමයක් පිළිපැද ටික කාලයකට හෝ දරුවකු පිළිසිඳ ගැනීම ප්‍රමාද කිරීමටය.

"අපි උපත්පාලන ක්‍රමයක් පාවිච්චි කරමු."

මම එක් අවස්ථාවකදී ඔහුට යෝජනා කළෙමි.

"මොනව. මං මිනිහෙක්. මගේ පුරුෂ ශක්තියට නින්දා කරන්න එපා දාරි."

ඔහු කීවේ මහත්සේ මවිතයට පත් වෙමිනි. ඉන්පසු මම ඒ ගැන යළිත් කිසිදාක කතා නොකළෙමි. සොබාදහමට එරෙහි වීමට මට තිබූ අවශ්‍යතාව ඔහුට තේරුම් නොගියේය.

"ඒක දෙවියන්ගෙ කැමැත්ත දෙවියෝ කැමති විදියට අපට දරුවො ලබා දේවි."

ඔහු කීවේ එපමණකි.



ඇත්තටම දෙවියන් යයි කියා කෙනෙක් සිටීද? බොහෝවිට මම මේ ගැන කල්පනා කළෙමි. දෙවියන්ගේ පිළිවෙතට පයුපයින් ඇත්තේ කුමක්දැයි මට කිසිවිටකත් තේරුම් ගත නොහැකි විය. දෙවියන් වහන්සේ මට මගේ අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන යෑමට අවසර නොදුන්නේ ඇයි? මා බෙලෝගේ යෝජනාවට කැමැත්ත ප්‍රකාශ කළේ දෙවියන් වහන්සේගේ කැමැත්ත එය වූ නිසාද? බෙලෝ සමග නිදි යහනේ සතුට විඳිමින් දරුවන් බිහිකිරීම ඔහුගේ එකම පැතුම වීද? එසේ නැත්නම් දෙවියන්වහන්සේට අප ගැනත් අපේ කටයුතු ගැනත් සොයා බැලීමට ඉඩ කඩ නැතිවීද?

www.sinhalaelibrary.com 32

## 8

**වසර** ගෙවී යෑමට ඇත්තේ තව මාස දෙකකි. නැති බැරි අය බියකරු තත්ත්වයකට මුහුණ දෙමින් සිටිති. බඩු මිල ඉහළ ගොස් ඇති අතර ඉහළ පෙළේ ධනවතුන් හැර සාමාන්‍ය ජනතාව භාණ්ඩ හිඟයකට මුහුණ දී ඇත. දූෂණය හා වංචාව ගැන කතා බහ කරන ජනතාව වසර මැද පැවති මැතිවරණය ද මහා ප්‍රෝඩාවක් ලෙස දකිති. බොහෝ ධනවත්තු තම නිවාඩුව වැදගැම්මකට නැති සාප්පු සවාරි සඳහා ගත කිරීමට පිටරටවලට ඇදෙති. මගේ කන්නාඩි මේසය මත ඇති සුවඳ විලවුන් බෝතල සංඛ්‍යාව දකින විට මා තුළ ඇතිවන්නේ මාද ලොකු වරදක් කර ඇතිය යන හැඟීමකි. මේවා මගේ විවාහයේ දී බෙලෝ විසින් තෑගි කරන ලද ඒවාය.



මා මගේ මේසය අස් පස් කරන්නට ගත් මේ මොහොතේ අමීනා මිදුලේ කොනකට වී හොරෙන් ඒ දෙස බලා සිටිනු දැකිය හැකිවිය. මගේ කාමරයට ඇ කිසිවිටකත් නොපැමිණීම එක් අතකින් පුදුමයකි. මා වරක් ඔවුන්ගේ කාමරවල එළිපත්තට පා තබා ඇතත් ඉන් පසු ඔවුන්ගේ රාජධානිවලට කිට්ටුවීමට පවා බියවීමි. පිටත පෙනුමෙන් ඇ ශිෂ්ට සම්පන්න ගැහැනියක සේ දිස්වුවද ඇගේ හැම රෝම කූපයකින්ම වෛරය ගලා ගියේය. මෙවැනි වාතාවරණයක් යටතේ අපි එකම වහලක් යට එකම ස්වාමිපුරුෂයකු සමග ජීවත්වීම එක් අතකින් පුදුමයකි. ඕනෑම අහිංසක ක්‍රියාවක් විකෘති වී පෙනෙන්නට ඉඩ ඇති බැවිනි.

අපට උදෑසන වතුර ලැබෙන්නේ පැයක පමණ කාලයකි. දවසේ අතික් කාලය තුළ වතුර කරාම සිඳී යන බැවින් අපට ඒ පැය ඇතුළත වතුර රැස්කිරීමට සිදු වෙයි. එදින වැසිකිළි පිරිසිදුව ගැන මා සැහීමට පත්නොවූයෙන් අපගේ සේවක කොලුවා වූ අඩමුට මා යළි වැසිකිළි පිරිසිදු කිරීමට නියම කළේ ඒ උදෑසන සෑහෙන වතුර ප්‍රමාණයක් එක් රැස්වී තිබූ හෙයිනි.

මොහොතකින් අමීනාගේ කෝපාන්විත බැල්ම අප වෙත එල්ල විය. වතුර නාස්ති කරනවා යයි සිතූ ඇ නොරිස්සුම් සහගතව ඇනුම් පද කියන්නට විය.

"අරහෙ වතුර ටික ඉවර කරනවා. අද දූට නාන්න වෙන්නෙ නෑ..."

කපන කතුරක් වැනි වූ ඇගේ කටහඬින් මගේ සිත් වේදනාවෙන් නලියන්නට විය. මා වරදකරුය යන හැඟීම මා තුළ ඇතිකිරීම ඇගේ අභිප්‍රාය විය. පීප්පවල ඇති තරම් වතුර

www.sinhalaelibrary.com 33

එක්රැස්වී තිබූ හෙයින් මම ඇගේ කතාව වැඩි ගණනකට නොගත්තෙමි. එහෙත් මෙවැනි ඇනුම්පද නිසා ඇතිවන සිත් රිදීමෙන් මට ගැලවීගත නොහැකි විය. මම අමීනා ප්‍රථම බිරිඳ පාතිමා හා සංසන්දනය කරන්නට වීමි. අප දෙදෙනා අතර සමානතා අඩු වුවද ඈ තුළ මවකගේ පුවදායි පෙනුම දක්නට තිබිණ. පාඩම් අසා ගැනීම සඳහා තම දරුවන් මා වෙතට එවීමට ඈ මහත් උනන්දුවක් දැක්වූවාය. ලජ්ජාශීලි දරුවකු වූ අබුට මම ඉංග්‍රීසි කියා දුනිමි. ඒ අවස්ථාවන්හිදී පාසල් ජීවිතය සම්බන්ධයෙන් මා තුළ සංකා සහගත සිතිවිලි ඇතිවීම නොවැළැක්විය හැකි කරුණක් විය. මට ඇති වූ පාඩුව ගැන පුන පුනා කියමින් ආත්මානුකම්පාවේ ගැලී සිටීම අවශ්‍ය නැති බැව් මම මටම කියා ගතිමි. එහෙත් මට ඒ හැඟීමෙන් ගැලවී ගත නොහැකි අවස්ථා ඉඳහිට උදාවිය. ඊයේ මා කුණු බාල්දියෙන් අහුලාගත් සඟරාවක කාන්තාවන් හා සිවිල් සේවය ගැන ලියවුණු ලිපියක් තිබිණ. ඒ කාන්තාවන් බොහොමයක්ම ඉබෝ හා යොරුබා ගෝත්‍රිකයන්ය. මාත් එවැනි ඉහළ තනතුරක් ලබා ගැනීමට කොයිතරම් ආශාවෙන් සිටියාද? දේශ දේශයන් දැක බලා ගැනීමේ ආශාවක්ද මා තුළ විය. මා කිසිදාක මේ පළාතෙන් ඈතට නොගිය බව සිතත්ම මා සිතට මහත් වේදනාවක් ඇතිවෙයි. මා කිසි දිනක මුහුද දැක නැත. මා ලාගෝස් නුවරට කැටුව යන්නයි බෙලෝගෙන් ඉල්ලා සිටියහොත් ඔහු ඒ ඉල්ලීම ඉටුකරතැයි මම සිතමි. ඒත් මා මැවූ සිහින එයට වෙනස්ය. මට අවශ්‍යව තිබුණේ නිදහස්ව කිසිවකුගේ ඇඟිලි ගැසීමක් නැතිව මගේ තනි කැමැත්තෙන් සංචාරයෙහි යෙදීමය.

පාසලෙන් අස්වී පොහොසත් අල්හාජ් කෙනෙකු හා විවාහ වීමට පුල පුලා බලා සිටි සමහර දැරියන් තවමත් පංතිකාමරවල සිටින බව මම දනිමි. එහෙත් මේ ජීවිතයට එදා අතිශයින්ම විරුද්ධ වූ මම අද පොහොසත් අල්හාජ් කෙනකු හා විවාහ වී සිටිමි. ඇත්ත වශයෙන්ම බෙලෝ කොතරම් පොහොසතකුදැයි මම නොදනිමි. මා ඔහු පොහොසතකු යයි සිතනවා පමණි.



www.sinhalaelibrary.com 34

# 9

## "මිනිස්සු කියනවා හමුදා රජයක් පිහිටුවාගෙනලු."

වෙළෙඳපොළේ සිට පැමිණි බාරෝ මාමා කීවේය. ඒ ජනවාරි පළමුවැනිදාය.

එදින උදේ සිටම මා ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියා කරවූයේ නැත. දහවල මේ මොහොතේ මා ගුවන්විදුලි යන්ත්‍රය කරකැවූ පසු මිලිටරි ආණ්ඩුවක් පිහිටුවා ගත් බව කියවෙන නිවේදනය අසන්නට ලැබිණ. හමුදාව විසින් ආණ්ඩු බලය අල්ලාගෙන තිබුණේ පෙරදින මධ්‍යම රාත්‍රියේය. අඳුරු නීතිය ද පනවා තිබුණි. එහෙත් අප මේ සියල්ල දැන ගත්තේ මේ මොහොතේය. අද උතුරේ ජීවත් වූ අපට මේ ගැන දැනුනේ ඉතා සුළු වශයෙනි. රටේ දේශ සීමා මෙන්ම ගුවන් තොටුපළවල් ද වසා ඇති බව



දැන ගන්නට ලැබිණ. සොකොතෝවල ආණ්ඩුකාරයා අත්අඩංගුවට ගෙන තිබිණි. අපේ අසල්වැසියකු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයකු ලෙස සේවය කළ අතර ඔහුට කුමක් වූවාදැයි මම නොදනිමි. ඔහු මේ ගමේම නිවැසියකු වූ අතර ඔහුගේ නිවස පිහිටා තිබුණේ අප නිවසට යාර කිහිපයක් ඈතිනි. ඔහු අත්අඩංගුවට පත් නොවේවායි මම ප්‍රාර්ථනා කළෙමි.

අප නිවසේ කිසිවෙක් මේ ආණ්ඩු පෙරළිය ගැන උනන්දුවක් නොදැක්වූහ.

"අපට ඇති තරම් රෙදි සෝදන කුඩු තියෙනවද?"

පාතිමා ඇසුවේ එපමණකි. ඇගේ සිහියට නැඟුණේ රෙදි සෝදන කුඩු හිඟය ගැන පමණි.

"හව්සා ගෝත්‍රික කාන්තාවන් වූ අපි කිසිවිටකත් බඩුගෙන ඒමට වෙළඳපොළට නොයන්නෙමු. ගෙදර අවශ්‍ය සියලු බඩු බාහිරාදිය ගෙන එන්නේ ගෙදර ස්වාමියා හෝ ඔහුගේ සේවකයකු විසිනි. එබැවින් පසුගිය මාස කිහිපය තුළ හාල්, සීනි වැනි ද්‍රව්‍යවල මිළ ඉහළ ගිය බව පාතිමා හෝ අමීනා නොදැන සිටීම පුදුමයක් නොවේ. කිසිම දෙයක් ගැන නොදැන සිටීමත් එක් අතකින් යහපති. එහෙත් මා එවැනි යහපතක් බලාපොරොත්තු නොවේ.

බිඳ වැටුණු රජයේ නායකයන්ට කුමක් සිදු වී ඇත්ද? බාරෝ මාමා පවසන අන්දමට ජනතාව මේ ආණ්ඩු පෙරළිය ගැන බෙහෙවින් සතුටට පත්ව සිටී. කිසියම් වෙනසක් මේ අවස්ථාවේ අවශ්‍යව ඇති බව සත්‍යයකි. එහෙත් අපේ මහා

www.sinhalaelibrary.com 35

බලාපොරොත්තු බිඳ වැටෙන්නට ඉඩ තිබේ. අගනුවර තු සිදුවන්නේ කුමක්දැයි දැන ගැනීමට මා තුළ දැඩි ඕනෑකම තිබේ. ඒත් අප ජීවත් වන්නේ මේ සියලු පෙරළි සිදුවන ලාගෝ නුවරින් බොහෝ ඈතය.

බොහෝ ව්‍යාපාරිකයෝ අවුලට පත්ව ඇත. එහෙත් බෙලෙ එවැනි තත්ත්වයකට පත් නොවේවා යි මම පතමි. ම පුවත්පතක් ගෙන ඒමට අඩමු යැවූ මුත් පුවත්පත් ඉවර තිබුණි. හෙට පුවත්පත්වල තව අලුත් ප්‍රවෘත්ති තියේවි. ඒත් ම සමඟ දේශපාලනය ගැන කතා බහක යෙදීමට මේ නිවසේ කිසිවෙක් නැත.

අඳුරු නීතිය ඉවත් කර තිබූ හෙයින් බෙලෝ මොහොතක පෙර නිවසින් පිටවී ගියේය. උදාසීන බව දරා ගත නොහැකි ඇඳේ වැතිර උන් මම ඔහු පිටත්ව යන අන්දම බැලීම සඳහ කවුළුව විවර කළෙමි. මෙදින පොළ දිනය වූ බැවින් ගම්වලින් පැමිණි මිනිස්සු, ගැහැනු ළමයි උදෑසන සිට වැළ නොකැඩී පොළ දෙසට ඇදෙමින් සිටියහ. සමහරු ඔටුවන් හා බූරුවන් පිට නැගී පැමිණි අතර තවත් අය පයින් ගමන් කරමින් සිටියහ. ගවයන් රැනක්ම තම කුරවලින් දූවිලි අවුස්සමින් ජනේලය හරහා ගමන් කළහ. ඔවුන් පසුපස බූරුවන් දෙදෙනකු පිට ධාන්‍ය ගෝනි පටවාගත් ගැහැනියක් හා මිනිසෙක් ගමන් කරමින් සිටියහ. මා විශේෂයෙන්ම දකින්නට ආශා කළ දර්ශනය වූයේ ඔටුවන්ය. ඔවුන් කාලයත්, අත්දැකීමත් නිසා සර්වතෝභද්‍රතාවයට පත් වූ එහෙත් කිසිවිටකත් සටන් නොවදින ඉතාමත් විනීත සියල්ල දරා ගැනීමට සමත්වූ වයසක මහත්වරුන්ට සමානය. එහෙත් ඔවුන් පිට නැඟගත් මහත්වරු උස් අසුනක ඉඳගත් රජුන්ගේ විලාසයක් පෑහ.



ඒ අතරම පාරේ ගමන් කරන මිනිසුන්ගේ හා ගැහැනුන්ගේ කටහඬවල් මා සවනත පතිත විය.

"කොහොමද සැප සනීප?"

"හොඳින් ඉන්නවා."

ඒ බඩු ඔසවාගෙන යන ගැහැනියකි. මටත් ඔවුන් හා වෙළෙඳපොළට යා හැකිනම්, ඒත් ඒ සිතිවිල්ලක් පමණකි. මා කොහොම යන්නද? කවුරුන් සමඟ යන්නද? මා ඇඳ පැළඳ ගෙන වෙළඳපොළට යන බව පවසා ගෙන් පිටවුවහොත්? එසේනම් පාතිමා සිහි නැතිව ඇදගෙන වැටෙනු ඇත. මගේ සිත කළකිරීමට පත්වූ ඇතැම් මොහොතක බූරුවන් පිට බඩු පටවාගෙන යන ගැහැනියක පසුපස ඇදෙන්නට සිත් දුණි. ඒත් ඒ ගැහැනිය සමඟ යන මිනිසාටත් තවත් බිරියක් ගෙදර සිටිනවා විය හැක.

කටහඬවල් ඔස්සේ මගේ සිත දිව යද්දී බඩු මළු පිට උඩ තබා ගත් ඔටුවන් රැනක් කෝච්චියක් මෙන් ඉදිරියට ඇදෙනු මගේ නෙත ගැටිණ. පාරෙන් එහා පැත්තේ ඇත්තේ උමාරුගේ ගරාජයයි. බෙලෝගේ දිලිසෙන 505 පර්ජෝ රිය ඔටුවන්ට ඉඩදෙමින් ආපස්සට ඇදෙනවා මට පෙනිණ. බෙලෝ මෙතෙක් වේලා ගරාජයේ සිටින්නට ඇත.

එදින සවස බෙලෝ පුවත්පත් කිහිපයක් රැගෙන ආවේය. ඒවා අත් අඩංගුවට ගත් පුද්ගලයන් ගැනත් රටින් පැන යෑමට උත්සාහ දරණ පුද්ගලයන් ගැනත් වූ තොරතුරු වලින් පිරී තිබිණ. අල්ලස් දූෂණ චෝදනා ගැනත් ඒවා සෙවීමට පත් කළ කොමිසන් සභා ගැනත් ලියැවී තිබිණ.

www.sinhalaelibrary.com 36

පුවත්පත් ගෙන ඒමට බෙලෝට මතක තිබීම ගැ
මගේ සිතට සතුටක් දැනිණ. ඔහු පුවත්පත් රැගෙන ආවේ ම
ගැන සිතා විය යුතුය. මගේ සිත තුළ සතුට මුසු
බලාපොරොත්තුවක් මෝදු විය. මේ කුඩා පියවරවල් වුව
මගේ ජීවන රටාව වෙනස් කිරීමට ඉවහල් වනු ඇත. දැ
විවරව තිබියදීත් මේ සිරකුඩුවට පියමං කිරීම ගැන ම
බොහෝ විට මටම දොස් නගා ගත්තෙමි. මෙයට විරුද්ධවීම
මා තුළ ශක්තිය තිබිය යුතුය. මෙය මගේ ඉරණමද? නැත්න
මගේම මෝඩකමද? මා මේ තත්ත්වයට පොළඹන ලද්දේ ම
තුළ වූ සිත් කැළඹීමත්, අනුන් වෙනුවෙන් දිවි කැපකිරී
උදෙසා මා තුළ වූ ස්වාර්ථවාදී පුරාජේරු හැඟීමත් විසිනි.

මට පාසලේ දී කියවූ ජූලියස් සීසර් නාට්‍යයේ වදන
සිහිපත් වෙයි.

වැරැද්ද තියෙන්නෙඅපේ ග්‍රහචක්‍රයේ නෙවෙයි. බෲට
අප ළඟමයි. ඒ අප අනුගාමිකයන් වන නිසා. මගේ ජූලිය
සීසර් පොත් වත් මා ළඟ තිබුණානම්. ඒකත් පුස්තකා
පොතක් නිසා ආපසු දුන්නා.

පත්තරවල කියනවා සෞඛ්‍යය කොමසාරිස්වරිය
ගැහැනියක් කියල.



# 10

**මම** ටික කලකින් ලිව්වෙ නෑ. ලියන්න අමුතු දෙයක් ඇත්තෙත් නෑ. හමටාන් කාලය අවසන් වීගෙන එනවා. අපි ලයනවා. කනවා. ඔහේ ඉන්නවා. විදුලිය තියෙන වෙලාවට රූපවාහිනිය නරඹනවා. ඒත් එක්තරා දුරකට හෝ මම මගේ රාජකාරි දින පැමිණෙන තුරු බලා සිටියෙමි. මා බෙලෝ හා එක්වීමෙන් සතුටු වූවාදැයි මම නොදනිමි. එය ආදරයෙන් තොර ලිංගික ඇසුරක් පමණක්ද? කෙසේ හෝ ඒ ඇසුර මගේ සිත තුළ වූ පීඩනය මඳකට හෝ අඩු කළා යයි කීම එක් අතකින් පුදුමයකි.

සඳුදා හා අඟහරුවාදා වාරය අමීනාගේය. එහෙත් මේ සඳුදා අමීනාට උණ සැදී ඇඳට වැටුණි. පාතිමා ඉවුම් පිහුම්

www.sinhalaelibrary.com 37

කටයුතු බාරගත් අතර මම ඇයට උදවු කිරීමට නොගියේ ම
එසේ කරන්නේ රාත්‍රී වැඩ මුරය ද බලාපොරොත්තුවෙන් ය
සිතන්නට ඔවුන්ට ඉඩ තිබූ බැවිනි.

හැන්දෑවේ බෙලෝ නිවසට පැමිණි පසු අමීනා පාතිම
ද කැටුව විදේශීය වෛද්‍යවරියක හමුවීමට ගියාය. බෙලෝ
ඔවුන් සමඟ නොගිය අතර ඔහු රියැදුරු සමඟ තම මෝට
රිය යැව්වේය. ඔවුන් ගිය පසු බෙලෝ පුවත්පතත් රැගෙ
මගේ කාමරයට පැමිණියේය. වෙනදා ඔහු යමක් මගේ
කාමරයට එවන්නේ අඩුම හෝ ජෙසීමා අතය. ඔහු කිසිවිටක
මගේ කාමරයට නොපැමිණෙයි.

"අද රෑට මගේ කාමරයට එනවද?"

ඔහු ලජ්ජාවට පත් වූ කලක මෙන් මගෙන් ඇසුවේය.

"මං දන්නෙ නැනෙ අද මට රාජකාරි පැවරිලා තියෙ
බව"

හිනාවීමට ගත් උත්සාහය යටපත් කරමින් මම පහ
හඬින් කීවෙමි.

"මම දන්නව හොඳටම අද දාරීගේ දවස නොවන බව

ඔහු යළිත් කීවේය.

"සේරම ගෙදර වැඩපළ කළේ පාතිමා. ඉතින් ඇගෙ
අහන්නකෝ"



මම හිනැහෙමින් කීවෙමි.

"කාගෙන් අහන්නද කියල මට කියන්න එන්න ඕන නෑ. මං දන්නෙ නැනෙ මේක මෙච්චර දඩුවමක් කියල"

ඔහු පුවත්පත් දෙක ඇඳ මතට විසි කරමින් ඉක්මන් ගමනින් කාමරයෙන් පිටවී ගියේය. බෙහෙත් ගැනීම සඳහා ගිය ගැහැනුන් දෙදෙනා රැගත් රථය පෝටිකෝව යට නැවැත්වූ බැවින් මට ඔහු පසුපස යා නොහැකි විය.

කුමක් කළ යුතුදැයි මම නොදත්තෙමි. ඔහු වෙතට ගොස් ඔහු සමඟ කතා කිරීමට මට අවශ්‍ය විය. මා ඔහුගේ සිත රිදවූවා යැයි මට සිතෙන්නට විය. ඔහුගේ සිත රිදවීමට මට කිසිසේත් අවශ්‍ය නොවීය. එහෙත් අද මගේ දිනය නොවූ බැවින් මා ඔහු වෙත ගොස් කෙසේ කතා කරන්නද? මම හිමින් හිමින් කුස්සියට ඇදුනෙමි. පාතිමා තවමත් කලබලයෙන් වැඩ කරමින් සිටී. පාතිමාට මුළුතැන්ගෙයි වැඩ වැඩිවූ බොහෝ අවස්ථාවල එහි ගොස් ඇයට උදව් කිරීම මගේ පුරුද්දක් මෙන් විය. උදව් අවශ්‍ය නැති අවස්ථාවල පවා මම ඈ අසළට වී කතා බහේ යෙදෙමින් සිටියෙමි. ඈ මට සැලකුවේ දියණියකට මෙනි.

කෙසේ හෝ මේ අවස්ථාවේ ඇතිවූ තත්ත්වය පාතිමා විසින් විසඳනු ලැබීය.

"දාරී අරයගෙ කෑම ටික ගිහින් දෙන්න. මට තියෙනව අමීනගෙ බෙහෙත් ටික දෙන්න."

ඈ බෙලෝගේ කෑම ටික පිඟානකට බෙදමින් මට කීවාය.

www.sinhalaelibrary.com 38

ඒ අවසරයෙන් මම දොරට තට්ටු නොකරම කාමරයට ඇතුළුවීමි. මා එහි ඇතුළු වන විට ඔහු සන්ධ්‍යා කාලයේ යාඥාව අවසන් කොට ව්‍යාපාරික සඟරාවක් කියවමින් සිටියේය. ඔහු මා නොදුටුවාක් මෙන් සිටින්නට උත්සාහ කළ මුත් ඔහුගේ දෑස ඔහුටත් නොදැනී ආලෝකමත් වනු මට පෙනිණ.

"මං පිඟාන ගෙනියන්න ආපහු එන්නම්"

මම කීවෙමි.

"ඕන නෑ වෙන කවුරු හරි එවන්නකො"

ඔහු සඟරාවෙන් හිස මැත් නොකරම කීවේය. මම හිමින් හිමින් ගොස් ඔහුගේ ඇඳ මත ඉඳ ගතිමි.

"මොනවද මෙතන කරන්නෙ? මට මහන්සියි. මට කරදර නොකර යන්න"

ඔහු කීවේය.

ඇඳ උඩ වාඩිවූ මම සඟරාව පසෙකට ඇද දැමීමට උත්සාහ කළෙමි.

"වේවැලක් ගන්න ඕන. අර ස්කෝලෙ සාජන්ට්ලා ළමයින්ට ගහන්න ගන්න ජාතියේ"

ඔහුගේ දෑස ආශාවෙන් හා අපේක්ෂාවෙන් බැබලෙන්නට විය. මා ඒ ආශාවත් අපේක්ෂාවත් වැළඳ ගතිමි. මේ ප්‍රේමයයි ඔබ සිතනවාද?



එහෙත් පසුදා උදෑසන බමරය අනික් පැත්තට කැරකී තිබිණ.

"දාරී අමීනා මේ දවස්වල ඉන්නෙ ඔයා එක්ක හරි අමනාපයෙන්."

පාතිමාගේ කතාව මට එතරම් පුදුමයක් නොවීය.

"එයා මේ දවස්වල කට්ටඩියොයි මන්තරකාරයොයි ළඟට යනව ඔයා බෙලෝගෙන් වෙන්කරන්න මොනවහරි කරව ගන්න. එයාට ඕන දාරීව ගෙදරින් අයින් කරන්න. අර එදා තනියම ගියෙත් එතෙන්ට. බෙහෙත් ගන්න නෙවෙයි."

ඈ මගේ කනට ළංවී කීවාය.

"කන බොන දේවල් ගැන හොඳට පරිස්සම් වෙන්න ඕන. දන්නවද එයා බෙලෝ අල්ලාගෙන තියෙන්නෙත් මොකක්ද හූනියමක් කරල. ඒකෙ බලේ දැන් ඉවරලු. එහෙම වුණේ ඔයා හින්දලු. අනේ මන්දා මිනිස්සු මහ මෝඩයො. හූනියම හින්ද හරි මොක හරි බෙලෝ එයාට රැවටුණා. ඒත් දැන් තමයි එයාට තේරිලා තියෙන්නෙ අමීනා කවුද කියල."

විසකුරු සර්පයකු මගේ ඇඟ දෂ්ට කළ කලක මෙන් මගේ ඇඟ පුරා විස දුවවිත් පපුවට තදවිය. පාතිමා මගේ යහපත තකා මේ සියල්ල මා සමඟ පැවසූ මුත් ඒ සියල්ල මා නොදැන සිටියා නම් වඩා යෙහෙකැයි සිතිණ. මා මේ නිවසට පැමිණි දිනයේ සිටම අමීනා මා සමග වෛරයෙන් පසුවන බව මට දැනිණ. මා ඇගේ තත්ත්වයේ සිටියානම් කෙසේදැයි සිතමින් මම ඒ තත්ත්වයට හැඩ ගැසීම සඳහා උත්සාහ කළෙමි.

www.sinhalaelibrary.com 39

මම දෙවැනි බිරිඳ වුණානම් මං තුන්වැනි බිරිඳ එක්ක
අමනාප වෙන්නෙ නැද්ද?

මම මගෙන්ම අසා ගතිමි.

ඒත් දැන් මගේ සිතට බිය ඇතුළුවෙයි. මා මරා දැමීමට
උත්සාහ කරන ගැහැනියක සමග එකම වහළක් යට ජීවත්වීම
කොයිතරම් භයානකද?

කොඩිවින මන්තර හා හූනියම් ගැන නේවාසිකාගාරයේදී
ඇසූ කතන්දරවල භයානක බව හා ඒවායේ අනතුරුදායක
බව මට සිහිපත් වෙයි.

"දරුවෙක් ලැබෙන්න ඉන්න අම්ම කෙනෙකුගේ ඒ දරු
ගැබ විනාශ කරල දමන්න, ඒ වගේම කෙල්ලකගෙ සිත
ගන්න, දෙන්නෙක් විරසක කරන්න මේ සේරම කරන්න පුළුවන්
ගුරුකම් දන්න මිනිස්සුන්ට"

ඩිකෝ ඒ කතාව කීවේ නේවාසිකාගාරයේදීය.

"බෙලෝ ඔයාගේ හිත ගන්න ඉනාවක් කවන්න ඇති"

ඒ කීවේ සර්පියාය.

බෙලෝගේ ලේලියක් වූ කුලු නේවාසිකාගාරයේ උන්
බැවින් එය සිදුවන්නටද ඉඩ තිබුණි. බොහෝ විට නිවසින්
ගෙන ආ කෑම වර්ග ඈ අපට දුන්නාය. එහෙත් දැන් බෙලෝ
ගැන හොඳින් දැන ගැනීමෙන් පසු හැඟීම් අතින් ඔහුට සමීප
වීමෙන් පසු ඔහු එවැන්නක් කළා යැයි සිතීම අපහසුය.



එහෙත් ඔහු එවැන්නක් කළාදැයි ඇසීමට මා කිහිප විටක්ම
උත්සාහ ගත් මුත් මම අසාර්ථක වීමි.

බෙලෝ පාතිමා හා විවාහ වන්නට ඇත්තේ ඔහු ඉතාමත්
ලාබාල වයසේදී විය යුතුය. කෙසේ වුවද තරුණයෙකුගේ
ප්‍රථම විවාහය දෙමව්පියන් විසින් සූදානම් කරන ලද්දකි.
පාතිමා ද එසේ ඇගේ දෙමව්පියන් විසින් කැන්දන් එන්නට
ඇත.

පාතිමා තමන්ට වාසනාව උදාකළ බව බෙලෝ සිතයි.
අකුරු ලිවීම කියවීම නොදත් පාතිමාට මේ බිත්ති හතරින්
පිටත සිදුවන කිසිම දෙයක් දැන ගැනීමටද අවශ්‍ය නොවීය.
දරුවන් හැදීම හා ගේ දොර පාලනය ගැන ඈ තුළ වූයේ
තම මවගෙන් හා මවගේ මවගෙන් දැනගත් සාම්ප්‍රදායික
දැනුම පමණකි. මේ නිවසට පැමිණීමෙන් හෝ නවීන පන්නයේ
ආම්පන්න කිහිපයක් භාවිතයට පුරුදු වීමෙන් හෝ ඇගේ
ජීවිතයේ වෙනසක් ඇති නොවීය. මූලික දැන හැඳින ගැනීම්වලදී
ඇතිවූ කුලෑටිකම් මගහැරී ගියෙන් දැන් අප දෙදෙනා හොඳ
මිතුරියන්ය. ප්‍රථම බිරිඳ වශයෙන් පාතිමා එකම වහලක් යට
තවත් දෙදෙනකු සමග ගෙදර වැඩ පල කරමින් ඔවුන්ගේ
එළදා වර්ධනයටද උදව් කරමින් කිසිදු අවුලක් නැතිව සන්සුන්ව
ජීවත්වීම මට නම් සිතා ගැනීමට බැරි තරම් වෙයි. මේ තත්ත්වය
යටතේ වුවද ඉරිසියාව, කෝපය හා ද්වේෂ සහගත සිතුවිලි
ඇතිවීම නොවැලැක්විය හැකිය. ප්‍රශ්නය වී ඇත්තේ මා මේ
රාමුවට නොගැලපීමයි. අමීනාද එසේමය.

මා තුළ වූ කණස්සල්ල කෙමෙන් වර්ධනය වූ අතර
ග්‍රීෂ්ම සෘතුවේදී එය තවත් වැඩිවිය. සීතල හමටාන් සුළඟ

www.sinhalaelibrary.com 40

ග්‍රීෂ්ම ඍතුවට ප්‍රවේශයක් දී පළා ගියාක් වැන්න. සීතල හමටාන් සුළඟ එක්වරම ගිනිගෙන දැවෙන උණුසුමකට පරිවර්තනය වූයේ අද්භූත අදෘෂ්‍යමාන හස්තයකින් කළ ක්‍රියාවක් ලෙසිනි. උදේ සිට හවස් වනතුරුම අකාරුණිකව තම රැස් පැතිරවූ හිරු බැස ගිය පසුවද වේදනාකාරී උණුසුම මැකී ගියේ ඉතා සෙමිනි. නිවසේ බිත්ති කොතරම් ගිනියම් [illegible] යන් බිත්තියකට අත පවා තැබිය හැකි වූයේ හොඳටම රැ බෝ වූ පසුවය. ගෙය සිසිල් වූයේ මධ්‍යම රාත්‍රියෙන්ද පසුවය.

අපේ කාමරවල විදුලි පංකා තිබුණද ජෙනරේටරය ක්‍රියාකර වූවොත් මිස දවල් කාලයට විදුලිබලය නොලැබෙයි. උණුසුම දැඩිලෙස ගලා යද්දී විදුලි පංකාවලින් වලක් නැත. සිනිඳු රබර් මෙට්ටවලින් දරා ගත නොහැකි උණුසුමක් පිටවන බැවින් ඇඳේ වැතිර සිටීමද අපහසුය. මම බටකොළ පැදුර සිමෙන්ති පොළව මත අතුරා එහි වැතිර ගතිමි. දහවල් කාලය තුළ මිනිසුන් ගිනි අව්වේ පිච්චෙමින් වැඩ කරද්දී අප ජෙනරේටරය ක්‍රියාකර වීමෙන් විදුලි පංකා දැමීමත් බෙලෝගේ කාමරයේ වායු සම්පීඩකය දැමීමත් ගැන මා තුළ ඇති වන්නේ මහා වරදක් කළ අයකු තුළ ඇති වන හැඟීමකි. කෙසේ හෝ අල්ලා දෙවියන් වහන්සේට පින්සිදු වන්නට මට සියලු සුබ විහරන ලැබී තිබේ.

මේ දේශගුණයට වඩාත් ගැලපෙන්නේ කොළ සෙවිළි කළ නිවෙස්ය. ගිම්හානයේ ගිනියමින් පොළව නැමැති තාච්චියේ අප දැවෙද්දී ලෝකයේ තවත් කොටස්වලට හේමන්තය උදාවී තිබීම සිතා ගැනීමටත් බැරි තරම්ය.

අපේ බොහෝ අසල්වැසියෝ නවීකරණයට ගොදුරු



වෙමින් තම මැටි ගෙවල්වලට ටකරන් තහඩු සෙවිලි කළහ. මේ ටකරන් තහඩු නිසා ගිම්හානයේ උණුසුම දරා ගැනීමට බැරි තරම්ය. තම ගොවි පොළවල වැඩක් පළක් නැති බොහෝ දෙනා දහවල් හා සැන්දෑව ගත කළේ තම නිවෙස් අසල වූ ගස් යටය. තම නිවෙස තුළ මැද මිදුලක් නැත්නම් ගැහැනුන්ට එසේ ගස් යට සිටීමටද අවසරයක් නැත.

මේ දේශගුණික තත්ත්වය මිනිසුන්ගේ කෝප ගින්න ඇවිලීමටද හේතුවක් විය. දරුවෝ කලහ කර ගත්හ. පාතිමාගේ හා අමීනාගේ දරුවෝ රන්ඩු දබර කර ගනිමින් ඇඬූහ. පැමිණිලි බොහෝ විය.

පාතිමා මිථ්‍යා විශ්වාසයන්හි කොතරම් ඇලී ගැලී සිටියේද යත් එය ජීවිතයේ සෑම අංශයකටම බලපෑවේය. ඉවුම් පිහුම්වලදී, කෑම් බීම්වලදී මෙන්ම ස්නානය කිරීමේදීත් නිදා ගැනීමේදීත් මේ නිසා අත්හැරිය යුතු කුමක් හෝ දෙයක් තිබිණ.

පසුගිය දිනක අබූ සෙල්ලම් කරද්දී බෝලය වහළ මත රැඳවිණ. මා එය ගැනීම සඳහා ඉනිමගට නැගීමට උත්සාහ කළා පමණකි. පාතිමා වහා පැමිණ මා ඉන් වැලැක් වූවාය.

"ගැනියෙක් ඉනිමඟකට නැග්ගොත් ඒ ගෑනිට පිස්සු හැදෙනවා. නගින්න එපා නංගියෙ"

මට එසේ අවවාද කළ ඇ අමීනාගේ යම් ක්‍රියාවක් දෙස බැලුවේ නෝක්කාඩු ස්වභාවයෙනි.

"අර බලන්නකො අඩි උස සපත්තු දෙකක් දාගෙන ටක ටක ගගා ඇවිදින හැටි. හරියට බොරු කකුල් කාරයෙක්

www.sinhalaelibrary.com 41

වගේ...."

"දැක්කද අර කොණ්ඩ මෝස්තරේ. ඒකට නයිරා විසිපහක්ලු."

"මිනිස්සු මහ මෝඩයෝ. ගියපාර හජ්ජි වන්දනාවේ ඇරියා. මාල, වළලු, සාරි රෙදි ගෙනැත් යාළුවන්ට ලොකු ගණනකට විකුණුවා. ඔන්න වැඩ."

අමීනාගේ මක්කම් වන්දනාව ගැන ඈ කතා කළේ තරහින් සාප කරමිනි.

"තව එකක් දැක්කද? පවුලෙ බත් මුට්ටියෙන් කන්න එයා ලොකු වැඩී ඇති. දැක්කද එයාගෙ කාමරේ එයාටයි දරුවන්ටයි වෙනම උයනව"

අමීනා පොදු බත් හැලියෙන් කෑම කෑවේ කලාතුරකිනි. මගේ රාජකාරි දිනයට ඈ කෑම සඳහා පැමිණියේම නැත.

"පුලානියෙක් වගේ හැංගිල කනව"

පාතිමාගේ බොහෝ වචනවලින් මගේ සිත සසලවී යන බැවින් ඒවා මට නොඇසුණා නම් යෙහෙකැයි මට සිතේ.

රියේ සවස මම මගේ කාමරයෙන් පිටත කලම්පයක් මතට වී නියපොතු කපමින් සිටියෙමි. නියපොතු කැබලි බිම වැටී තිබිණ.

"ඇයි මෙහෙම වැඩ කරන්නෙ. කිසිම දෙයක් ගැන පරිස්සමක් නෑ."



පාතිමා කෑගසන්නට විය.

"ඇයි මොකද අක්කෙ මං කළේ ?"

"මොකද නමයි. ඇයි දන්නෙ නැද්ද නියපොතු වලිනුයි, කෙස්ගස් වලිනුයි කොච්චර දේවල් කරන්න පුළුවන්ද? ඇයි අම්මවත් කියල දුන්නෙ නැද්ද?"

පාතිමා එසේ කියමින් බිම වැටුණු නියපොතු කැබලි අහුලන්නට වුවාය.

ඈ අදහස් කළේ නියපොතුවලින් කළ හැකි කිසියම් බන්ධනයක් හෝ හූනියමක් ගැනය. මා මේ සියල්ල මගේ සිතින් ඈත් කිරීමට උත්සාහ ගතිමි. එහෙත් සිතට කාවැදුණු මේ දේවල් මසට ඇනුණු පුංචි පුංචි කටු මෙන් වරින් වර රිදුම් දෙන්නට විය.

"දාරී එන්න කලින් එයා ඉනාකාරයො ළඟට ගිහින් එක එක දේවල් කළා. පුතෙක් ලබා ගන්න. දැන් එයා හොඳටම බයවෙලා ඉන්නෙ ඔයාට පුතෙක් ලැබෙයි කියල"

පාතිමාට පුතුන් සතර දෙනෙක් සිටින අතර අමීනාගේ දරුවන් දෙදෙනාම ගැහැනු දරුවන්ය.

www.sinhalaelibrary.com 42

# 7

**යළිත්** වරක් අමීනාට රාජකාරි පැවරී තිබූ දිනයක බෙලෝ නගරයෙන් පිට ගියේය. බෙලෝ නගරයෙන් පිට යන සෑම දිනයක්ම වාගේ අමීනාගේ රාජකාරි දිනවීම ගැන මම පුදුම නොවීමි. කෙසේ වෙතත් බෙලෝ කිසිවිටකත් තම අනෙක් බිරියන් ගැන මා හා කතාබහක නොයෙදුණි. මා ගැනත් ඔහු ඒ දෙදෙනා සමග කතාබහ නොකළා යැයි සිතමි.

සමහර අවස්ථාවන්හිදී සිදුවන, බලාපොරොත්තු නොවූ සුළු සිද්ධීන් මා අමීනා හා විරසක කරවන නොපෙනෙන බලවේගයන් මෙන් විය. දරාගත නොහැකි රස්නය නිසා මම මිදුලේ කොහොඹ ගස යටටම වී පුවත්පතක් කියවමින් සිටියෙමි. ඒ මොහොතේ ගණිත ගැටළුවකට උපදෙස් පතමින් අබූ මා වෙතට පැමිණියේය.



එදින ඒ මොහොතේ බෙලෝ ගෙට ගොඩ වූයේ අබූ කොහිදැයි ජෙසීමාගෙන් අසමිනි. අමීනා ගෙදර වැඩ කරමින් ඒ අසලම සිටියාය.

"දාරි එක්ක ඉන්නව"

ජෙසීමා බෙලෝගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නාය.

"අම්ම ඔහොමද කතා කරන්න උගන්නලා තියෙන්නෙ?"

බෙලෝ ජෙසීමා වෙත කඩා පැන්නේ අනියම් ලෙස අමීනාට ද පහර ගසමිනි.

"අම්මයි කියන්න බැරි නම් නැන්ද කියලවත් කියන්න බැරිද?"

බෙලෝගේ වචනවලින් අපහසුතාවයට පත්වූ මම සිද්ධිය එතනින්ම අවසන් වේවා යයි පැතුවෙමි.

දැඩි උණුසුම අපේ ශරීර ශක්තිය මුළුමනින්ම හීනකර දමා තිබේ. ගේ තුළ එක් තැනක සිට තවත් තැනකට යාම මහා වෙහෙසකාරී අපහසු කටයුත්තක් මෙන් දැනේ. මුළු දවස පුරාම උගුර පිපාසයෙන් වියළී යද්දී යමක් පානය කළ සැනින් මුළුගතම දහදියෙන් තෙතබත් වෙයි. සුළු දෙයකින් පවා කෝප ගැන්වෙන සිත දමනය කර ගැනීමට බැරි තරම්ය.

මා අංගනයේ වූ කොහොඹ ගස යටට පැමිණියේ මේ සියල්ල දරා ගත නොහැකිවූ බැවිනි. එහෙත් මේ අංගනය ද විශාල තාප්පයක් නිසා පිටස්තර ලෝකයෙන් වෙන්වූවකි.

පිටස්තර ලෝකයට ඇරුණු එකම වියසිදුර මගේ කාමරයේ පිටුපස බිත්තියේ සෑහෙන උසකින් පිහිටි පුංචි

www.sinhalaelibrary.com 43

හතරැස් කවුළුව පමණකි. කවුළුව කොතරම් උසකින් පිහිටියේද යත් එයින් පිටත බැලීමට නම් මා පුංචි බංකුවකට නැගගත යුතු විය. ඉන් පිටත බලන මා ඇස ගැසෙන්නේ වතුර කල හිස මත තබාගෙන තම නිවෙස් බලා ඇදෙන ගැහැනුන්ය. සමහරු බූරුවන් පිට වතුර කල පටවාගෙන උන් ඉදිරියට දක්කති. මට එවන් නිදහසක් වත් නැත.

මගේ කාමරයේ ජනේලය මෙතරම් උසකින් තබා ඇත්තේ මක්නිසාද යන්න මටම තේරුම්ගත නොහැක්කකි. එය ගැහැනියකගේ පීඩිත බව කියාපාන සංකේතයක් වන්නාසේම ඇයට දුන් සිර දඬුවමකි. මගේ නිදහස බාධා වැටකඩොළුවලින් සුන්නත් කොට සීමා කොට තිබියදී මා මගේ ජීවිත කාලය පුරා අවට ලෝකය දෙස බැලිය යුත්තේ මෙවන් කුඩා වියසිදුරුවලින්ද? මේ සියළු වැටකඩොළු බිඳ දමා අවට ලෝකයට අවතීර්ණ වීමට මා තුළ ඇති ආශාව බොහෝ විට කායික වේදනාවක් බවට පත්වෙයි. කිසිම අයුරකින් බෙලෝ අයහපත් ස්වාමිපුරුෂයෙක් නොවේ. ඒත් මා විවාහ වූ හවුසා ගෝත්‍රික ගැහැනියකි. ගෙළ බැඳි කඹය කොතරම් දිගු වුවත් එය ලිහා දමන ලද නිදහසකට සමාන කළ නොහැක. තැනින් තැන ඇවිදිමින් නොයෙකුත් ස්ථාන නරඹමින් අධ්‍යාපන කටයුතුවල නිරතවන තරුණියන් ගැන මා තුළ ඇත්තේ එක්තරා ඉරිසියාවකි.

අඩ නිරුවතින් නාන ගැහැනු හා පිරිමි ස්නානය කරන දර්ශනයක් සහිත මුහුද මවා ගැනීමට මම මහත් වූ වෙහෙසක් දරීමි.

ඉස්ලාම් ආගම අනුව ගැහැනියකගේ හඬ පවා අති පෞද්ගලික දෙයකි. ඇගේ කටහඬ අනික් මිනිසුන් විසින් නෑසිය යුතුය.



## 12

**කොමෙස්** හෝ අවසානයේදී මම මගේ පාසලට යෑමට අවස්ථාවක් ලැබීමි.

"මම ඉස්කෝලෙට ගිහින් එන්නම්"

මා ඇසුවේ අනික් බිරියන් දෙදෙනා සමග යෑමට ඇති අකමැත්තත් රියැදුරා සමග යෑමට මට අවසරයක් නැති බවත් දන දනමය. මා කොතැනකට හෝ කැටුව යන්න යැයි මගේ ස්වාමියාගෙන් ඉල්ලූ ප්‍රථම අවස්ථාවද මෙය විය. මා සූදානම් වී මිදුලට පැමිණෙන විට ඔහු අලුත් මෝටර් රිය සූදානම් කරගෙන සිටියේය.

"ඇයි අපි අනිත් කාර් එකේ යන්නෙ නැත්තෙ?"

www.sinhalaelibrary.com 44

මා අසද්දී අලුත් මෝටර් රිය පරිස්සම් කිරීමට තරම් ම
මසුරු වී යැයි ඔහු සිතන්නට ඇත. අපේ අධිසුඛෝපභෝ
ජීවන තත්ත්වය ලෝකයා හමුවේ පෙන්නුම් කරන්නේ කුමකටද
ඔහුගෙන් ඇසීමට මම අපොහොසත් වීමි. අලුත් රිය පරිස්ස
කිරීම මගේ අදහස වී යැයි ඔහුට සිතන්නට ඉඩ දී මම රිය
ගොඩ වීමි.

එදින පාසල අමුත්තන් සඳහා වෙන්වූ දිනයක් නොවූව
මා හඳුනාගත් මුරකරු සැනෙකින් ගේට්ටුව විවෘත කළේ
බෙලෝ මා ගේට්ටුව අසලින් බස්සවා අසල්වැසි මිතුරන් හමුවී
බලාපොරොත්තුවෙන් රිය ආපසු හරවාගෙන ගියේය. ජාන
ගුරුතුමිය මා දැකීමෙන් මහත් සේ සතුටට පත්වූ බවක් පෙනි
මගේ කඩාකප්පල් වූ අධ්‍යාපන කටයුතු ගැන නොවිමසීමට
අතීත කතාබහ යළි අවුස්සා නොබැලීමටත් තරම් ඇ ඥානවන්
වූවාය.

"ඇයි මහත්තය එක්ක ආවෙ නැත්තෙ?"

"එයා මාව බස්සවලා තව යාළුවෙක් හමුවෙන්න ගියා
මාව ආපහු එක්ක යන්න එවි"

ඔහු දැකීමේ කුහුලකින් ඇ පසුවන බව මට ප්‍රත්‍යක්
විය. මා බෙලෝ හා විවාහ වූයේ ඔහුගේ මුදල් නිසා නොවූ
බව ජානකී ගුරුතුමියට විස්තර කිරීමට මට අවශ්‍ය විය. ම
සත්‍ය වශයෙන්ම ඔහු හා විවාහ වූ කාරණය ඇ හා පැවසීම
මට අවශ්‍ය වුවද ඒ මාතෘකාවට අවතීර්ණ වන අන්දම ම
සිතාගත නොහැකි විය. මා බෙලෝගේ එකම බිරිඳ නොවන
බව ජානකී ගුරුතුමියට දැන ගන්නට ලැබී ඇත්දැයි මම හරිහැ



නොදත්තෙමි. විදේශිකයන් මේ බහුබාර්යා සේවනය ගැන දරන අදහස් ගැන මට අවබෝධයක් තිබූ බැවින් මේ මාතෘකාව ගැන කතා බහ නොකිරීම වඩා යෙහෙකැයි මට සිතිණ. බහුභාර්යා සේවනය ගැන පැවැති විවාදයේ දී දුන් වාග් ප්‍රහාර මට දැනුදු සිහිපත් වෙයි. ඒවා කොතරම් දරුණු වීද?

"තාත්තා කිව්ව හින්දයි මං බැන්දෙ මැඩම්"

මොහොතක නිහැඬියාවකින් පසු මම එක්වරම දොඩමළුවීමි. මා මේ කියන්නේ සම්පූර්ණ සත්‍යය නොවන බව දැන දැනත් මම කටට ආ වචන පිට කළෙමි.

"ඇයි ඔබ සතුටින් නොවෙයිද ඉන්නෙ?"

ඇ ඇසුවාය.

"නෑ මැඩම්. අසතුටක් නැහැ."

"හුඟ දෙනෙක් කියනව මට ඇහිල තියෙනව. අල්හාජ් බෙලෝ හුඟක් හොඳ කෙනෙක්. ඒ වගේම හුඟක් පොහොසත් කෙනෙක් කියල"

ඇ දිගටම කියවාගෙන ගියාය.

"ඔව්. මැඩම්"

මම පිළිතුරු දුනිමි. බොහෝ දේවල් කියන්නට මට අවශ්‍යව තිබුණ ද මගේ දිව ගොත ගැසෙන්නට විය. මම හිනැහෙමින් බලා සිටියෙමි. බෙලෝගේ ප්‍රසිද්ධිය ගැන ඇ කීවූ දේවල් මම සිහිපත් කරන්නට වීමි. මගේ වාසනාවට මම සලකනවා මදිද?

www.sinhalaelibrary.com 

"කොහොම වුවත් ඔහු හිරේ විලංගුවෙ වැටුණෙ නැහැනෙ"

මම හිනැහෙමින් කීවෙමි.

හමුදා ආණ්ඩුව විසින් බෙහෝ දූෂිත රජයේ නිලධාරීන් හා ව්‍යාපාරිකයන් සිරගත කොට තිබුණි.

"ඔබට කියවන්න වෙලාවක් තියෙනවාද?"

ඈ ඇසුවාය.

"වෙලාව නම් තියෙනවා. ඒත් පොත් නෑ මැඩම්."

"ඒ පොත් ලබාගන්න ඔබ උත්සාහ නොගත් නිසා මහත්තයත් එක්ක ගිහින් පොත් ටිකක් අරගන්න. හැම මාසෙකම පොතක් මිලදී ගන්න ඔබට බැරිකමක් නැහැනෙ."

මම ඇගෙන් කියවීම සඳහා පොත් දෙකක් ඉල්ලා ගතිමි.

"ආයෙත් එන්න. අපිත් ළඟදීම ඔබේ නිවසට එන්නම්කො. ඔබ ඉන්නෙ හුඟක් කිට්ටුවනෙ"

මා යන්නට සමුගනිද්දී ඈ සමුදුන්නේ එසේ කියමිනි.

එහෙත් ඇගේ පැමිණීමට මා කෙසේ කැමැති වන්නද? ඇගේ කැමැත්ත වනුයේ මේ බහුභාර්යා සංස්ථාවේ ක්‍රියාවලිය දැකබලා ගැනීම විය යුතුය.

මා ආපසු කැටුව යෑමට බෙලෝ නේවාසිකාගාරය අසල



පැමිණි මොහොතේ නේවාසිකාගාරයේ ශිෂ්‍යාවන් බෙලෝගේ මෝටර් රිය දෙස දෑස් දල්වාගෙන බලා සිටියේ මහා පුදුමයකිනි. එක් අතෙකින් මට ලැබී ඇති මේ දේවල් අගය නොකිරීම ගැන මම මටම දොස් නගා ගතිමි. මෙහි සමහර ගැහැනු ළමයි බෙලෝගේ හතරවැනි බිරිඳ වීමට වුවද පුල පුලා බලා සිටින බව මට විශ්වාසය. මා රියට නගිද්දී ගැහැනු ළමයින් දෙදෙනෙක් කියිදු ලජ්ජාවකින් තොරව තමන් වෙතට ඔහුගේ දෑස් අද්දවා ගැනීමට වෑයම් කරනවා පෙනිණ.

"මොකෝ හිත ගිහින්ද?"

මම විහිළුවක් කළෙමි.

"බතල තියෙද්දි මයියොක්කා මොකටද?"

ඔහු කීවේය.

"කියන්න බැනෙ."

මා අසා ඇති කට කතා සිහිපත් කළ මම කීවෙ බිරියන් තුන් හතර දෙනා සිටිය ද සමහර පොහොසත් අල්හජ්ජාවරු ගණිකාවන් පසුපස යති.

"කරදර වෙන්න එපා මට මයියොක්කා ඕන නම් මං සොයා ගන්නම්. ඔයා ඒ ගැන කරදර වෙන්න එපා."

මා ඔහු තරහ ගැන්වූවා යැයි මට මොහොතකට සිතිණි. ජානකී ගුරුවරියගේ අදහස් අනුව ඔහු හා හොඳ පැවැත්මකින් කටයුතු කිරීමට සිතාගත් මම මගේ මුවින් පිටවූ ඒ වචන ගැන පසුතැවෙන්නට වීමි. එසේනම් මා කුමක් කිව යුතුද? ඔහුගේ වැඩ කටයුතු ගැන ඔහු මා සමග නොපවසන්නේ

www.sinhalaelibrary.com 46

මගේ වරදක් නිසාද? ඔහු සමග කෙළින් කතා කිරීමට මගේ පැවැත්ම වෙනස් කර ගන්නේ කවදාද? මේ මොහොතේ ඔහුගේ සිත තුළ පොරබදන සිතුවිලි දැන ගැනීමට මට ක්‍රමයක් ඇත්නම්?

ඔහු ඉතා සෙමෙන් රිය පදවයි. මීට පෙර කිසි දිනක ඔහු මෙතරම් හෙමින් රිය පදවා නැත. මා පාසලට කැටුව යන්නයි මා කී අවස්ථාවේ ඔහු කී වචන මට සිහිපත් වෙයි.

"මටත් නගරෙට යන්න තියෙනවා යාළුවෙක් මුණගැහෙන්න. ඒ ගමන් ගියහැකි"

ඔහු එසේ කීවේ අමීනාට ඇසෙන්නට විය යුතුය. මා පාසලට කැටුව යෑම සඳහා ඔහු විශේෂ ගමනක් යොදා නොගන්නා බව අමීනාට අඟවන්නට ඔහුට අවශ්‍ය වන්නට ඇත. මේ දිනය අමීනාගේ රාජකාරි දිනය වීම නිසා ඔහු මා කැටුව ඇවිදින්නට යෑම ද අමීනාගේ කෝපය ඇවිස්සීමට හේතුවකි.

අමීනාගේ රාජකාරී දිනයක පමණක් නොව වෙනත් කිසිම දිනයක ඔහු ඈ සමග මෙසේ ඇවිදින්නට ගිය බවක් මගේ සිහියට නොනැඟේ.

මා තහනම් දෙයක රස විඳින බව හදිසියේ සිහිපත් වීමෙන් මගේ සිත ප්‍රීතියෙන් කුල්මත් වී ගියේය. ඔහු සිතින් නොව කයින් මා වෙතට අද්දවා ගැනීමට මට අවශ්‍ය විය.

"තරහද?"



මම මගේ අතින් ඔහුගේ කම්මුල ස්පර්ශ කරමින් ඇසුවෙමි.

"මං මේ බලන්නෙ ඔයා කියපු මයියොක්කා හොයා ගන්නෙ කොහොමද කියල"

එසේ කියමින් ඔහු මා ඔහු වෙතට ඇදගත්තේ මගේ කම්මුල ඔහුගේ උරහිසට තදවෙන පරිද්දෙනි.

වේගය අඩු වූ රිය අපේ නිවස පසුකරගෙන යන බවක් මට පෙනිණ.

"කොහෙද අපි මේ යන්නෙ?"

පුදුමයට පත්වූ මම ඇසුවෙමි.

එය පැහැදිලි සුන්දර සන්ධ්‍යාවකි. නීලවර්ණ අහස් තිරය මත කැටිගැසුණු සුදු වලාකුළු පුළුන් කුට්ටි මෙන් වැතිර තිබිණ. වායුසමීකරණය කළ රිය තුළ වූයේ මුදු සිසිලා... ඈතින් පෙනුණු ක්ෂිතිජය දම් පැහැති අඳුරු ආලෝකයකි෴ බැබළිණ. මේ සිහිලැල් සැන්දෑවේ සඳ නැගී එද්දී ගහකොළ නැති තැනිතලාව පුරා පැතිර තිබූ දැඩි කුරිරු හිරුරැස් මුදු මොළොක් බවට පත්වෙමින් තිබිණ.

"ඔබ කවදාවත් මගේ ගොවිපළට ගිහින් නැනෙ"

ඔහු එසේ කියමින් මෛත්‍රී වගාවක් මැදින් වැටුණු දූවිලි සහිත මාවතකට රිය හැරවීය. මොහොතකින් රිය අඹ ගසින් පිරුණු ප්‍රදේශයකට ඇතුළු විය. පණ ඇති කිසිවකු

www.sinhalaelibrary.com 47

නැති පරිසරයේ නිහැඬියාව රජ කෙරිණ. නිහැඬියාව මඳකට හෝ බිඳ වැටුණේ සැඳෑ සුළඟට වතුර වැටෙන්නාක් වැනි වූ පළහැටි ගීතයකිනි. ප්‍රථම වතාවට මිනිසකු සමග තනිවූ මොහොතක මෙන් මගේ සිත මහත්සේ කැළඹීමට පත්විය.

"මේ වෙලාවේ මොකටද ගොවිපළට යන්නෙ?"

මගේම කටහඬ පිටවූයේ පුදුමය කැටිකොට ගත් දෙගිඩියාවකිනි. ඔහු රිය නවතා ගත්තේ මගේ මොට්ටැක්කිලිය ගලවා දමීය. මොහොතකින් ඔහුගේ දෙතොල් මගේ කෙහෙරොද මත වැතිරිණ.

"ඔයා ඇත්තටම හිතුවද මං ඒ ළමයි දිහා ආශාවෙන් බැලුවය කියල?"

"ඔව් මං හිතුව සිව්වැන්නියක් හොයනවය කියල"

"මට හිතෙනව තුන්වැන්නිගෙ කට වහන්න හොඳවයින් පාරක් දෙකක් දෙන්න වෙයි කියල. ඒත් දූන් කාලෙ අපි අපේ ගෑනුන්ට ගහන්නෙ නැති එක ගැන දුකයි"

එසේ කියද්දී ඔහුගේ දෙ තොල් මගේ දොතොල් හා ස්පර්ශ විය. මා ඔහු බදා ගත්තේ දියේ ගිලෙන්නට යන අයකු මෙනි. ප්‍රාණවත් වූ මගේ හැඟීම් සමුදාය මා දවාලමින් ඔහු වෙතට ඇදීම සඳහා පොර බදන්නට විය.

"මොනවද ඔය කරන්නෙ?"

ඔහුගේ දැතින් මගේ උඩුකය වැස්ම ලිහිල් වෙද්දී මම කෙඳිරිලි හඬකින් ඇසුවෙමි.

"කියන්න මං මොනවද ඔයාට කරන්න ඕන..."



හඹාගෙන ආ අඳුර තුළින් මා දුටුවේ ඔහුගේ දසන්වල දීප්තිය පමණකි.

අප ආපසු නිවසට පැමිණෙන විට රාත්‍රී අට පසුවී තිබිණ. අසම්මත ආදරයක් පතා රහසිගතව තම ආදරවන්තයා හමුවූ කලක මෙන් මගේ සිත මා වරදකරුවකු කළේය. ඒ සමඟම තව මොහොතකින් අමීනා ඔහු සමග නිදි යහනට යන අන්දම ගැන සිතත්ම මා තුළ ඇතිවූයේ කෝපාන්විත හැඟීමකි.

ටික වේලාවකට පසු මම නාන කාමරය දෙසට පියනගද්දී අමීනා පාතිමාගේ දොරට තට්ටු කරන හඬ ඇසිණ.

"අක්කේ ඇස්ප්‍රින් පෙත්තක් දෙනවද එයාට ඔළුව කැක්කුමලු"

මා ගිනි අවි කාස්ටකයේ බෙලෝ නගරය පුරා ඇවිද්දවීමෙන් හිසරදය සෑදූ බව කියැවෙන බැල්මකින් අමීනා මා දෙස රවා බැලුවාය. පාසල් දරුවකු අමාරු පාඩමක් ඉදිරියේ හිසරදය සාදාගෙන ඇස්පිරින් ගිලින අන්දම සිහියට නගාගත් මම ආයාසයෙන් සිනහව නවතා ගතිමි.

ඔහු හිසරදය හදාගන්නට ඇත්තේ අමීනා සමග නිදන්නට යෑමට අකැමැත්තෙන් විය යුතුය. මගේ සිතට නැඟුණු සියුම් සතුටත් සමඟම මුවගට මද සිනාවක් නැඟිණ.

ඔහු ඇය සමග නින්දට යනවා දකින්නට මා අකැමැතිද? ඔවුන් දෙදෙනා ගැන ඇතිවූ මේ සිතුවිලි නිසා මට නින්ද නොගියේය. කෙසේ වෙතත් මම ඒ මොහොතේ ඇයට වෛර කළෙමි.

www.sinhalaelibrary.com 48

# 13

**ඊයේ** සවස බෙලෝ ලිපියක් රැගෙන ආවේය. එය ජස්ටිනා ගෙනි. මගේ සිතට ඇතිවූ සතුට කියා නිම කළ නොහැකි තරම් ය. ලිපිය රැගෙන ආ අබුව මම බදාගත්තෙමි. ලිපියේ තිබූ ආරංචියෙන් මා කොයිතරම් ප්‍රීතියට පත් වී ද යත් ලිපිය විවෘතකර තිබීම ගැන මම ඒ මොහොතේ ම බෙලෝට සමාව දුන්නෙමි. (තම බිරිඳගේ ලිපි කඩා බැලීමට මෙහි සැමියාට සම්පූර්ණ අයිතිය තිබේ.)

ඉදිරි සති දෙක ඇතුළත ඇ අපේ නිවසට පැමිණෙන බව එහි සඳහන් කර තිබුණි. දහදියත් දූවිල්ලත් ගැන සිතිය යුතු නැත. ගබඩා කාමරයේ ඇති අමතර ඇඳන්වලින් එකක් හෙට උදේම බෙලෝ ලවා මගේ කාමරයට ගෙන්වා ගත



යුතුය. ලිපිය තැපෑලේදී නැති නොවී පැමිණීම ගැන මම දෙවියන්ට ස්තුති කළෙමි. මෙසේ රාජ්‍යයන් අතර හුවමාරු වන ලිපි බොහෝ විට තැපෑලේදී අතුරුදහන් වෙයි. මම බොහෝ දේ කිරීමටත්, බොහෝ තැන්වලට යෑමටත් සනිටුහන් කර ගතිමි. ජස්ටිනා සමග යෑමට බෙලෝ මට අවසර දෙනු ඇතැයි යන්න මගේ එකම බලාපොරොත්තුව විය.

ඇගේ පැමිණීම ගැන මා සතුටට පත්වුව ද ඒ ගමන වැළකීමට කිසිවක් සිදු වේ දැයි මා තුළ බියක් ඇති විය. එවැන්නක් සිදු නොවේවා යි මම දෙවියන් යැද්දෙමි. මා අද කෙතරම් සතුටකින් සිටියා දැයි කියතොත් අමීනා ද කාරුණික ලෙස මා සමඟ සිනහ වූවාය. ජස්ටිනාටත් මටත් කතා කිරීමට කොයිතරම් දේවල් තිබේ ද?

ජස්ටිනා තම ලිපිය ඉතා ආචාර සම්පන්නව ලියා තිබුණේ එය බෙලෝ විසින් විවෘත කරතැයි සැක සිතූ නිසා විය යුතුය. ඇ නම් පුදුම සතෙක්. ඇ ලිපිය මෙතරම් ක්‍රමානුකූලව ලීවේ කෙසේ දැයි මට සිතා ගැනීම පවා අපහසුය. ඇ බෙලෝව ඉතාමත් ගෞරවාන්විත ලෙස හඳුන්වා දී තිබුණි. ජස්ටිනා යුරෝබා ගෝත්‍රික ක්‍රිස්තියානි ලබ්ධිකයකු බව බෙලෝ දනී. ව්‍යාපාරික කටයුතුවලදී හව්සා ගෝත්‍රයට අයත් නොවූ බොහෝ දෙනා ඇසුරු කරන්නට ලැබෙන බැවින් බෙලෝට මෙය විශේෂත්වයක් නොවේ.

ව්‍යාපාරිකයන් ගැන සඳහන් කරන මේ මොහොතේ මා ඔහුගේ ව්‍යාපාරවලින් ආදායම ලැබෙන අන්දම විමසූ අන්දම මට මතක් වෙයි.

www.sinhalaelibrary.com 49

"පිරිමින්ට සීමා වෙච්ච් දේවල් ගැන මොනවට උනන්දු වෙනවද?"

ඔහු දුන් පිළිතුර එපමණකි. ඒත් හදිසියේ බෙලෝට කුමක් හෝ සිදු වුවහොත් ඔහුගේ වත්කම් ගැන අංශු මාත්‍රයක හෝ අවබෝධයක් අප කිසිවකු තුළ නොවීය. මෙය මාගේ මුසුරු සිතුවිල්ලක් නොවේ. මරණය ඕනෑම මොහොතක ඕනෑම කෙනෙකු වෙත පැමිණිය හැකි බැවිනි. එසේම ගැහැනුන්ට එරෙහි වූ නීති කොතරම් අගතිගාමී දැයි මට පසුගියදා පුවත්පතකින් කියවන්නට ලැබිණ. ඒ අනුව දේපල උරුමය පිළිබඳ නීති සැකසී ඇත්තේ ගැහැනුන්ගේ අවාසියටය.

මා මේවා ගැන විමසුම් කරද්දී ඔහු වරින් වර සුළුවෙන් ඒ ගැන කියා දුන්නේ තමා පුංචි දරුවකුගේ ආශාවක් මුදුන්පත් කරනවා යැයි සිතමිනි. අවස්ථා දෙකක දී ඔහු මා ලවා කියවා ගැනීම සඳහා ලිපි කිහිපයක් ගෙදර ගෙනාවේ ය. ඔහුගේ විශ්වාසිත ලිපි කටයුතු බාරව සිටියේ මුසා ලවාලි බව මම ඒවායින් දැනගතිමි.

"ඇයි ඔයාට බැරිද මට ලවාලිගෙ තනතුර දීල පඩියක් ගෙවන්න."

මා දිනක් ඔහුට කීවේ විශාල බලාපොරොත්තු සිත ඇතිවය.

"මොකටද ඔයාට පඩියක්. සල්ලි ඕනනම් මට කියන එක විතරයි"

"මට සල්ලි නොවෙයි ඕනි. මං සමහර වෙලාවට පොත් ටිකක් ගන්න කැමතියි."



මගේ සැබෑ අවශ්‍යතාව විස්තර කිරීමට උත්සාහ නොකළ මම එසේ කීවෙමි. මට අවශ්‍ය වූයේ මුදල් නොවේ. එහෙත් මට එය කියා ගැනීමට බැරි විය.

"වෙලාවක මාත් එක්ක වවුමට ඇවිත් ඔයාට කැමැති දෙයක් තෝරාගන්න."

ඔහු කීවේය.

බෙලෝ ලවාලි මෙම තනතුරේ තබාගෙන ඇත්තේ ඔහුගේ ඉංග්‍රීසි දැනුම පිළිබඳ අඩුපාඩුව පිරිමසා ගැනීම සඳහා ය. ලවාලි ඉංග්‍රීසි බස පිළිබඳ හසල දැනුම ඇත්තෙකි. එහෙත් බෙලෝ තම අත්සන පමණක් ගැසීමට දැන සිටි බොහෝ ව්‍යාපාරිකයන්ට වඩා ඉදිරියෙන් සිටියේය.

හවුසා ගෝත්‍රික කාන්තාවන් නැතත් ඉබෝ සහ යුරෝබා ගෝත්‍රික කාන්තාවෝ ව්‍යාපාරික කටයුතු අතින් ඉහළටම නැග සිටිති. හවුසා ගෝත්‍රික කාන්තාවන් වැඩිදෙනෙක් නිවෙස්වලටම කොටු වී සිටින අතර අතලොස්සක් දෙනා ගුරුවරියන් හා ලිපිකාරිනියන් වශයෙන් සේවය කරති. හවුසා නොවන නයිජීරියානුවන් කාන්තාවන් විසින් කරගෙන යන වැඩ කොටස ගැන හිතන්නටත් බැරි තරම්ය. බොහෝ යුරෝබා ගෝත්‍රික කාන්තාවන් මේ නගරයේ අහල පහළ ද හොඳ ව්‍යාපාරිකයන් බවට පත් වී සිටිති.

පසුගිය දිනක සොකොතෝහි හමුදා ආණ්ඩුකාරවරයා පාසල් කිහිපයකම කළ සංචාරයක් රූපවාහිනියෙන් පෙන්වනු ලැබීය. ආණ්ඩුකාරවරයා එක් ගැහැනු පාසලක ශිෂ්‍යාවන් අමතමින් තම අධ්‍යාපන කටයුතු අවසන් කිරීමට පෙර පාසලෙන් අස්වී විවාහවීමට දෙමාපියන් විසින් බලකර සිටින්නේ නම්

www.sinhalaelibrary.com 50

වහා තමන් වෙත පැමිණ පැමිණිලිකර සිටින ලෙස ඉල්ලා සිටියේය. සොකෝතෝ රාජ්‍යයේ තවමත් එකම කාන්තා වෛද්‍යවරියක හෝ බිහිකර නැති බවත් විදේශික රැකියාලාභීන් වෙනුවට ස්වදේශිකයන්ට රැකියා ලබා දෙන බවත් කියා සිටියේය. ඒ කතාවෙන් පසු මා කොතරම් පරාජිතයෙක් ද කොයිතරම් වරදකාරියක ද යන හැඟීම මා තුළ ඇති විය. මා සියල්ල අතහැර ආවේ කිසිදු සටනකින් තොරවය.

පිටරැටියන් ගැන කියන විට මට පසුගියදාක කැසපිලියෝ මහත්මිය ඇගේ සැමියා සමඟ ගරාජයේදී මුණ ගැසිණ. ඔවුන් දෙදෙනාගේ ම ඉංග්‍රීසි දැනීම ඉතාමත් දුර්වලය. එහෙත් ඇගේ සැමියාට රැකියාවක් ලැබී තිබේ. ඒ අල්ලස් දීමෙන් ලබාගත්තක් විය යුතුය. නව ආණ්ඩුක්‍රමය යටතේ මේ අල්ලස් දූෂණ අවසානයක් දකිනු ඇතැයි මම සිතමි. රැකියා ලබාදීම සඳහා අල්ලස් ගත්තවුන් සියලු දෙනාම දඬුවම් යැවිය යුතු යැයි මටසිතේ.

දින කිහිපයක් මෙහි නවාතැන් ගැනීම සඳහා මගේ මිතුරියක පැමිණෙන බව මම පාතිමා සමඟ පැවසීමි. ඈ බටහිර ක්‍රමයට හැඩගැසුණ හවුසා ගෝත්‍රයට අයත් නොවන තරුණියක බව දැනගත් පාතිමා මඳක් පසුබැවාය.

"මං ඉංග්‍රීසි දන්නැතුව කොහොමද කතා කරන්නෙ ?"

කෙසේ වුව ද ඈ ජස්ටිනා කන්නට කැමැති කෝසි සෑදීමට තරම් කාරුණික වූවාය. නිවසේ නවතින්නට එන මේ අමුත්තිය ගැන අමීනා මොනවා සිතයිද? මොනව හිතුවත් මට මොකද? ඒ ගැන සිතීම පවා මගේ සතුට නසා ගැනීමකි. පාතිමා ඉංග්‍රීසි නොදැන සිටිය ද ජස්ටිනා හවුසා බස තරමක් දනී.



## 14

**ඊයේ** ගෙතුළ තරමක කලබගැනියක් ඇති විය. බෙලෝට මේ තරම් තරහ ගිය බව මා දුටු මුල්ම අවස්ථාවයි ඒ. කාලයක් තිස්සේ හමාගිය කුණාටුවක් එකවර කඩාවැටුණාක් වැන්න. පසුගිය මාස කිහිපය තුළම අමීනාගේ හැසිරීමේ මහ අමුත්තක් තිබිණ. එය දිගින් දිගටම වර්ධනය විය. දවසක් හැර දවසක් හෝ නිවසින් පිටව යෑමට ඈ කුමක් හෝ හේතුවක් හදා ගත්තාය. මුලදී ඈ නිවසින් පිටව යන්නේ පාතිමාගේ අවසරය ඇතිව යැයි මම සිතුවෙමි. අවසර ගැනීම යයි කීම තරමක රළු වැඩි බැවින් අඩු තරමින් ඈ තමන් යන තැන පාතිමාට කියා යන්නට ඇතැයි මම අනුමාන කළෙමි. සති දෙකකට පමණ පෙර එක් දිනක් අමීනා කුලී රියකට නගිනු දුටු බව පාසලේ සිට පැමිණි හරුනා කීවේය.

www.sinhalaelibrary.com 51

"ඕක මං කිව්වෙ නැද්ද?"

පාතිමා මා දෙස බලමින් කීවාය.

එහෙත් ඈ කොහි ගියා දැයි අනුමාන වශයෙන්වත් සිතා ගත නොහැකි විය. අසල නගරයේ සිටින මිතුරියක හමුවීමට යන ඉව පාතිමා කළ විමසීමේ දී ඈ කියා තිබුණි. මිතුරියකගේ නිවසට යෑමට කුලී රියක් අවශ්‍ය නැත. කුලී රියකට නැගගත් ඈ බොහෝ දුරක යා යුතුය.

කෙසේ වුව ද අමීනා ඇඳුම් පැළඳුම් ගැන බෙහෙවින් සැලකිලිමත් වූ බැවින් ඈ සාප්පු සවාරියක යන්නට ඇතැයි මම සිතුවෙමි. මුලදී ඈ ඕනෑම ගමනක් යද්දී ලුබා කැටුව යාමට පුරුදු වී සිටියාය. එහෙත් දැන් දැන් ඈ යන්නේ තනිවමය.

ඊයේ මගේ රාජකාරි දිනය විය. බෙලෝ කඩුනාවලට යෑමට ලැහැස්ති වූ බව මට දැනගන්නට ලැබිණ. අමීනා ඒගැන දැන සිටියා දැයි නොදනිමි. සාමාන්‍යයෙන් ඔහු කඩුනාවලට ගියේ නම් ආපසු එන්නට හොඳටම රෑ බෝ වෙයි. හවස අමීනා නිවසින් පිටව යනු මා දුටුමුත් මා ඒ ගැන වැඩි තැකීමක් නොකළෙමි.

අන් සෑම දිනකදී මෙන් ම ඊයේ ද දවසේ වැදගත් කෑම වේල හැඳුනේ රාත්‍රියට ය. බෙහෝ විට බෙලෝ දහවල් කෑමට පෙර ගෙදර නොපැමිණෙයි. බෙලෝ කොතරම් පොහොසත් අයකු වුව ද නිවසේ ආහාර සැකසීමේ කිසිදු පිළිවෙළක් නොවීය. මා නිවසේ තුන්වැනි බිරිඳ වශයෙන් කෑම වේලාවල කිසියම් වෙනසක් ඇති කිරීමට උත්සාහ ගත්ත ද එය එතරම් පහසු කාර්යයක් නොවීය.



පෝෂ්‍ය පදාර්ථවලින් යුත් ආහාර වේලක් දරුවන්ගේ උදේ ආහාරය සඳහා එක් කිරීමට මම උත්සාහ ගතිමි. බොහෝ දිනවල උදෑසන ආහාරය වූයේ පාන් භාගයක් සහ තේ කෝප්පයකි. දරුවන්ගේ කෑම වේලට බිත්තරයක් එකතු කිරීමට මා යෝජනා කළ නමුත් පාතිමා එයට එකඟ නොවීය.

"ළමයින්ට බිත්තර නරකයි"

ඈ කීවේ එපමණකි.

මම බෙලෝගේ රාත්‍රී ආහාරය සඳහා විශේෂ කෑමක් පිළියෙල කරමින් සිටියෙමි.

"කෝ අමීනා?"

බෙලෝ පාතිමාගෙන් විමසන හඬ මට ඇසිණ.

"දන්නෙ නෑ"

පාතිමාගේ පිළිතුරෙන් බෙලෝ බෙහෙවින් කෝපයට පත්විය.

"දන්නෙ නෑ. ඇයි යන තැනක් කියල ගියෙ නැද්ද?"

අමීනා ගෙන් පිටව යන බව දැන සිටි බෙලෝගේ ඒ ප්‍රශ්නය නියෝගයක් මෙන් විය.

"නෑ. මොනව හරි ගේන්න යන්න ඇති"

පාතිමා ගොත ගැසුවාය.

www.sinhalaelibrary.com 52

"ගේන්න. ගේන්න. මොනව ගෙන්නද? ගෙදර කාටහරි කියල ද ගිහින් තියෙන්නෙ?"

එයින් ඔහු අදහස් කළේ මා විය යුතුය. මට දරුවකු නොවූ බැවින් මා ඇමතීමට ඔහුට නමක් නොවීය. පාතිමා අබුගේ අම්මා විය. අමීනා ජේසීමාගේ මවය.

මුලදී අදහස් කළ පරිදි බෙලෝ කඩුනාවලට ගොස් නොතිබුණි. අමීනා ගෙදර නැති බව ඔහු දැන ගත්තේ කෙසේද යන්න ගැන මා තුළ දැඩි කුතුහලයක් ඇති විය. සමහර විට ඔහු අමීනා වැරැදි තැනක, වැරැදි පුද්ගලයකු සමග සිටිනවා දකින්නට ඇත. එසේ නම් ඔහු ඈ ආපසු ගෙදර කැඳවාගෙන නාවේ මන්ද? මේ සිදුවීම ගැන ආපසු හැරී බලද්දී අමීනා බරපතල වැරැද්දක් කර නැති බව මට ඒත්තු ගියේය. එහෙත් ඒ මොහොතේ මෙතරම් සුළු සිද්ධියක් සම්බන්ධයෙන් බෙලෝ කලබලයට පත් වූයේ ඔහු පුරුෂාධිපත්‍යයට ගැති වූ පුද්ගලයෙකු නිසා බව මට අවබෝධ නොවීය. කෙනෙකුගේ බලපෑමට යටත් වූ විට ඔහුගේ හෝ ඇයගේ සිතිවිලි අගතිගාමී වන අන්දමට මේ හොඳම උදාහරණයකි. ඇත්ත වශයෙන් ම අමීනා ස්වකැමැත්ත පරිදි නිවසින් පිටව යෑමේ ඇති වරද කුමක්ද? කුරානයේ වුව ද කාන්තාවන්ට තම තමන්ගේ ඕනෑ එපාකම් සඳහා පිටත යා හැකි බව සඳහන් වෙයි. කෙසේ වුව ද මේ සිද්ධිය මා තුළ ද බියක් ඇති කරවීය. ඇගේ ආපසු පැමිණීම් ගැන සිතත්දී මගේ සිත සැලෙන්නට විය. පළමු බිරිඳ වශයෙන් තමන් වෙත තිබූ වගකීම පැහැර හැරීම නිසා බෙලෝගෙන් බැනුම් ඇසූ පාතිමා තම හිත සන්සුන් කර ගැනීමට උත්සාහ දරමින් සිටියාය. අමීනාට පෙම්වතකු සිටියහොත්? ඈ හැමදාම මෙසේ යන්නේ ඔහු හමුවීමටද?



අමීනාට රාජකාරී පැවරී තිබූ දිනවල පවා ඈ ඕනෑවට එපාවට හොද්දක් උයා තබා ඇගේ මිතුරියක සමඟ ගෙන් පිටවී යයි. අමීනාගේ ඉවුම් පිහුම් ගැන නම් කිසිවක් කිව නොහැක. ඈ පිදූ සම්ප්‍රදායික කෑම වේල පවා ඉතාමත් නීරසය. මා දක්ෂ ගෘහනියක නොවූවද මා උයන මාළු පිනි ඇගේ මාළු පිනිවලට වඩා රසවත්ය. ඉංග්‍රීසි ටිකක් දැන සිටියද ඈ වැඩිපුර අධ්‍යාපනයක් ලබා නොතිබුණි. ඇගේ ආශාවන් ඇඳුම් පැළඳුම් හා වත්සුනු තැවරුම පාවහන් ආදියෙන් මා ගැන තිබූ ඉරිසියාවද ඈ මෙසේ ගෙදරින් පිටමං කරවීමට හේතුවක් වන්නට ඇත.

ටික වේලාවකින් මේ කලබගෑනිය අහවරවීමෙන් පසු මම ඔහුගේ කාමරයට ඇතුළුවීමි. ඔහු මා දෙස බැලූ ප්‍රකෝපකාරී බැල්ම කිසිවකු දුටුවානම් ඔහු තරහ ගැන්වූයේ මා බව සිතනු නොඅනුමානය.

"බොන්න මොකක්වත් ගේන්නද?"

"එපා"

මා නොදුටුවාක් මෙන් බලාගත්වනම බලා උන් ඔහු ගිගිරුවේය. මගේ හිත රිදුණි. ඒත් ඒ ඔහු මා ගැන තැකීමක් නොකළ නිසා නොවේ. මා හැර ඔහු කෝප ගැන්වීමට හෝ ඔහුට රිදවීමට හැකි අයකු සිටිනවා යැයි සිතන්නට පවා මම අකමැති වීමි. මා සිටියදී ඔහු අමීනා ගැන මෙතරම් දුරට සිතිය යුතුද?

....ඒත් අමීනා බෙලෝගේ දරු දෙදෙනාගේ අම්ම....

www.sinhalaelibrary.com 53

මම මටම කියා ගතිමි. ඒ සමගම ගල් පොළවේ ගැටෙන ඇගේ උස් සපත්තු හඬත් ගේට්ටුව ඇරගෙන ඇ අංගනයට ඇතුළු වූ හඬත් මට ඇසිණ. කෑම ලෑහැස්ති කිරීමේ මුවාවෙන් මම මුළුතැන්ගේ දෙසට දිව ගියෙමි. මගේ කුතුහලය වැඩෙමින් තිබිණ.

.... දැන් කාලෙ මිනිස්සු ගෑනුන්ට ගහන්නෙ නෑ....

අඹගස් සෙවනේදී බෙලෝගේ මුවින් පිටවූ වදන් මට සිහිපත් විය.

ගැහැනුන් පාලනය කරගත නොහැකි පිරිමින් දුබලයන් සේ සැලකේ. නවීකරණයට හසුවූ පුද්ගලයෙක් මෙය හඳුන්වන්නේ "ගෙදර දොර විනය පටිපාටිය" යනුවෙනි.

"අබු ගිහින් ජෙසීමාගෙ අම්මට කියන්න මං කතා කළා කියලා"

අබු තම පියාගේ පණිවිඩය රැගෙන ගියේය. මොහොතකට පසු අමීනා බෙලෝගේ කාමරය වෙත ඇදෙනු පෙනිණ. මුළුතැන්ගේ පිහිටා තිබුණේ බොහෝ පිටුපසට වන්නටය. එබැවින් එහි සිටි මට බෙලෝගේ කාමරය තුළ සිදුවන කිසිවක් නො ඇසිණ. බොහෝ වේලාවක් කාමරය තුළට වී උන් අමීනා එකවරම කාමරයෙන් පිටතට පැමිණ ඉක්මන් ගමනින් ගොස් තම කාමරයට වැදී මහ හඬින් දොර වසා ගත්තාය. ඇ රාත්‍රී කෑම සඳහාවත් පිටතට නොපැමිණියාය.

ඉදිරි කාලය තුළ බෙලෝගෙ ද්වේෂ සහගත හැඟීම් සමනය කරන්නේ කෙසේදැයි මා තුළ බියක් ඇති විය.



පිරිමින්ට බිරියන් කිහිපදෙනකු තබාගැනීමට අවසර ඇත්නම් අමීනාට ආදරවන්තයකු සිටීමේ ඇති වැරැද්ද කුමක්දැයි මම මගේ ඇතුළු හදට එබී බලමින් සිතන්නට වීමි. එහෙත් එය මා වෙනුවෙන් වුවද පිළිගන්නා තර්කයකි. අමීනාත් මාත් අතර මිතුදමක් ගොඩ නගා ගත නොහැකිද? අප දෙදෙනා අතර වැඩි වයස් පරතරයක් ද නොවූයෙන් අපට කිට්ටු වන්නට ඉඩ තිබිණි. පාතිමා මෙන් නොව අමීනා කනිෂ්ඨය දක්වා අධ්‍යාපනය ලබා තිබිණි. ගැහැනුන්ට අධ්‍යාපන අවස්ථා ලබාදීමේ වැදගත්කම ගැන අපි පාසල් මට්ටමින් කොයිතරම් රචනා ලියන්න ඇත්ද? එහෙත් අමීනා පාසල් අධ්‍යාපනය අවසන් නොකළාය. කෙසේ වුවද අමීනා නිසි අධ්‍යාපනයක් ලබා ඇත්ද? අධ්‍යාපනය ලැබීමේ එකම තෝරුම පාසල් යෑම පමණක්ද? මා වුවද නිසි අධ්‍යාපනයක් ලබා තිබේද? මා මෙතරම් තිත්ත වීමට අමීනා කෙරෙහි බලපෑවේ කුමක්දැයි මට සිතාගත නොහැක. ගෘහ කටයුතුවලදී මා කරන හැම දෙයක්ම ඇගේ අවඥාවට ලක් වෙයි. ඊයේ උදේ දරුවන්ගේ ආහාරය සඳහා මම බිත්තර බැද්දෙමි. බිත්තරය තාච්චියේ නටන අන්දම පාතිමා බලා සිටියේ වශීවූ කලක මෙනි. ඇ බිත්තරයක් බදින අන්දම දුටුවේ මුල් වතාවටය. හරූනා සේනු හා අබු පුදුම සතුටකින් බිත්තර අනුභව කළ අතර ලූබාට හා ජෙසීමාට බිත්තර කෑමට අමීනා ඉඩ නුදුන්නාය. ඇ සමඟ සතුටින් සිටීමට මා ගත් සෑම උත්සාහයක්ම ව්‍යර්ථ වී ගියත් මගේ සිත හෙම්බත් වී නැත.

මා කාමරයට යන විට බෙලෝ ඇඳෙහි වැතිර සිටියේය. රාත්‍රී නවය කණිසමේ යාඥාවද අවසාන වී තිබුණෙන් මා කලින් ඔහු වෙත ගෙන ගොස් තිබූ කෑම ඇර බැලීමි. ඔහු කෑම අතින්වත් අල්ලා නොතිබිණි. දෑස් පියාගෙන ඇඳේ වැතිර සිටියද ඔහු නිදි නැති බව මට දැනිණ.

www.sinhalaelibrary.com 54

"ඔයා කන්නෙ නැද්ද?"

මම දෙගිඩියාවෙන් යුක්තව ඇසීමි.

"පස්සෙ කන්නම්. මගෙ ඔළුව රිදෙනවා"

ඔහුගේ කටහඬ සන්සුන්ය. තරහ නිවී ගොස් තිබිණ. කිසිදු අමුත්තක් සිදු නොවූ කලක මෙන් හැසිරීමට මම උත්සාහ ගතිමි.

"මං ළඟ බාම් වගයක් ඇති. මං අරන් එන්නම්."

මම බාම් කුප්පිය ගෙනවුත් ඔහුගේ නළල මත අතුරා පිරිමදින්නට වීමි. ඔහු එයට විරුද්ධත්වය ප්‍රකාශ නොකළේය. මම ඔහුගේ හිස පිරිමදිමින් බොහෝ වේලාවක් සිටියෙමි. ඒත් ඔහු තුළ කිසියම් වේදනාවක් ඇතැයි මට සිතිණ. ගෙදර කටයුතු ගැන වගකීම ඔහු සතුය. ඔහු ගෙදර ස්වාමියාය. ගෘහ මූලිකයාය.

මොහොතකින් ඔහු ආරක්ෂාව පතන්නාක් මෙන් හිස මගේ උකුළ මත තබාගෙන මට තුරුළු විය. කෝපය සංසිඳුණු කුඩා දරුවකු මෙන් ඔහු නින්දට වැටිණ.

"මිනිස්සුන්ට ඔළුව කැක්කුම හදන මේ ගෑනු...."

ඔහු වරක් තොල් මතුළේය.

ඔහු අවදිවනු දක්නට අකමැති මම බොහෝ වේලාවක් ඒ ඉරියව්වෙන්ම සිටියෙමි. කෑම සීතල වෙමින් තිබිණ. මාද තවම බඩගින්නේය. ඒත් මගේ බඩගින්න පහව ගොස් තිබිණ.



මා මුලින්ම මුළුතැන්ගෙයි වැඩ බාරගත් අවස්ථාවේ ගෙදර අන් අයට මෙන්ම බෙලෝට කෑම බෙදන්නේද බෙලෙක් පිඟන්වල බව දැකගත හැකි විය. තම බිරියන්ගේ කාමරවල වටිනා පිඟන් බඩු වැඩකට නොගෙන අහුරා තිබියදී බෙලෝටවත් එම පිඟන්වල කෑම නොදෙන්නේ මන්දැයි මට සිතාගත හැකිය. මම වටිනා පිඟන් කිහිපයක් ගෙන ඔහුගේ කෑම වෙන වෙනම බෙදූ අවස්ථාවේ ඔහු එයට විරුද්ධත්වයක් නොපෑවේය. අනෙක් දෙදෙනාම මගේ පිළිවෙත අනුගමනය කිරීම මගේ සතුටට හේතුවිය.

ඔහුත් සමගම මටද නින්ද ගොස් තිබිණ. ඔහුගේ දෑත් මා සොයද්දී මට ඇහැ ඇරිණ.

"කෑම සීතල වෙලා. කන්නෙ නැද්ද?"

මම ඇසුවෙමි.

"කෑම මෙතන තියෙද්දි තවත් කෑම මොකටද?"

ඔහු කීවේ හිනැහෙමිනි. ඔහු ආදරය කළේ බිහිසුණු දඬුවමක් විලසිනි. තම හැඟීම් සපුරා ගැනීම ඔහුට කෙතරම් වැදගත් වීද යත් කිසිදු ආරම්භයකින් තොරව ඔහු බලෙන් මෙන් ආශාවන් සංසිඳුවා ගත්තේය.

ඉන්පසු ඔහු ආහාර ගත්තේය.

"ඔයා කැමතිද නගරයට ගිහින් ජීවත් වෙන්න"

ආහාර ගන්නා අතර ඔහු ඇසුවේය.

මා වෙත පිළිතුරක් නොවීය.

"මං නගරෙ ගෙයක් හදනවා" ඔහු යළිත් කීවේය.

www.sinhalaelibrary.com 55

# 15

**ලාකොළ** පැහැති නටුවලින් කඩා හැළුණු සුදු පැහැති කොහොඹ මල් පොකුරු ඉතාමත් අලංකාර දර්ශනයක් විය. කොහොඹ මලින් පිරුණු පෝච්චියක් මගේ මේසය මත විය. ඒවා ඉක්මනින් පරවී යයි. සමහරක් මල් පෙති පෝච්චිය වටේට ඉහිරී තිබූ අතර කිහිපයක් වතුරේ පාවෙමින් තිබිණි. පරවී වැටෙන තුරු ඒවා ලස්සනට තිබේ. මේ ගසේ මල් පූදින කාලයයි. කෙසේ වුවද ගෙතුළ ඇති මල් දහවල උණුසුම මදක් හෝ අඩුකරන්නක් විය.

මම ජස්ටිනා පැමිණෙන තුරු සතුටින් බලා සිටියෙමි. එසේ වුවද තවත් බිරියන් දෙදෙනකු සිටින මේ නිවසට ඇ කැඳවීම ගැන මා තුළ එක්තරා ලජ්ජාවක්ද ඇති විය. අමීනාගේ ජීවිත අර්බුදයක් හටගෙන තිබීම තවත් කරුණකි.



අප සියලු දෙනාම කොයිතරම් දුරකට හෝ සතුටට පත්වන්නේ කිසියම් දෙයක් ගැන ඇති බලාපොරොත්තුව නිසා නොවේද? යම්කිසිවකුට ඇති බියත් වුවමනාවත් මේ බලාපොරොත්තුව තුළ සැඟවී ඇත. යම් දෙයක් ඇත්තටම සිදුවනවාට වඩා ඒ ගැන බලාපොරොත්තු තබාගෙන සිටීම කොයිතරම් රසවත්ද? ආදරය ගැන වුවද එය සත්‍යයක් යැයි සිතේ. බලාපොරොත්තුවේ අවසාන මොහොතේ එල්ලී සිටීම තරම් තවත් ප්‍රීතියක් කොයින්ද?

මා ජස්ටිනාගේ පැමිණීම බලාපොරොත්තු වූයේද එතරම්ම සතුටකිනි. ඇය කොයි මොහොතේ පැමිණේදැයි නොදන මම මෙසේ බලා සිටියෙමි. දුරකථන පහසුකම් ඇති එංගලන්තය වැනි ප්‍රදේශයක පමණක් නොව ලාගෝස් නගරයේ දී පවා මේ තත්ත්වය මීට වඩා වෙනස්වනවා නොවේදැයි මම හිතන්නට වීමි. එසේනම් ජස්ටිනා පැමිණෙන වේලාව මට හරියටම දැනගන්නට ඉඩ තිබිණ.

ජස්ටිනා පැමිණෙන බැවින් අමතර ආහාර පාන ටිකක් රැගෙන එන්නැයි මම බෙලෝට කීවෙමි. ඔහු මා නොසිතූ තරම් ප්‍රමාණයක කෑම ජාති ගෙනවිත් තිබිණ. වියළි කිරි පිටි, උදේ ආහාරය සඳහා ඇට වර්ග, ටින් කළ මස්, රස කැවිලි ආදියෙන් ශීතකරණය හා කෑම රාක්ක පිරී ගියේය. ඔහු වැඩිපුර ගෙනවිත් තිබුණේ අනවශ්‍ය දේවල්ය. මා බඩු මිලදී ගැනීමට ගියානම් අවශ්‍ය දේ පමණක් මිලදී ගන්නා බැවින් මේ නාස්තිය වලක්වන්නට ඉඩ තිබිණි. මේ සියල්ල ඔහු කළේ මා සතුටු කිරීමට වන බැවින් මම ඒ ගැන ගුණ දොස් නොපැවසීමි.

www.sinhalaelibrary.com 56

ජස්ටිනා බලාපොරොත්තුවෙන් සිටින මොහොතේ මට නගරයේ නිවස ගැන වූ අදහස හදිසියේ සිහිපත් විය. ඒ ගැන මුලින්ම ඇසූ මොහොතේ මා තුළ මහත් කම්පනයක් ඇති වූ අතර ඇත්ත වශයෙන්ම ඔහු අදහස් කළේ කුමක්දැයි මම නොදන්නෙමි. අප සියලු දෙනාම එහි යනවාද නැතිනම් එහි ස්වාමිදුව මා පමණක්ද? ස්වාමි දුව මා පමණක් වන්නේ නම් නිවස කොහි තැනුනද කම් නැත. වෙළඳ පොළට යමින් මා රිසි පරිදි වැඩ කිරීමට එවිට මට නිදහස ලැබේද?

ජස්ටිනා වෙනුවෙන් බෙලෝ විසින් ගෙන එන ලද බඩු භාණ්ඩ ආයිත්තම් දුටු අයෙකුට ඇ දේශීය හෝ සම්ප්‍රදායානුකූල කිසිවක් භාවිතා නොකරන පිටරැටියෙකැයි සිතෙනු ඇත. මේවා දකින මට අප ඉඳහිට හෝ බටහිර කෑම වේලක රස බැලිය යුතු යැයි සිතේ. පාතිමා කෝශි හා මොයිසා සාදා දෙන බවට වූ පොරොන්දුව ඉටුකරනු ඇත. එසේම දරුවන් වෙනදාට වඩා යහපත් ලෙස හැසිරෙනු ඇත. ගෙදර සිටින්නේ දරුවන් පස්දෙනකු පමණක් වුවත් රණ්ඩු දබර හා කෑකෝගැසීම්වල ඉවරයක් නැත. පාතිමාගේ වැඩිමහල් පුතු ගෙදර නොසිටි අතර දෙවැනි පුත් හරුනා ද සිටියේ නේවාසිකාගාරයේය. දරුවන් පස්දෙනකු පමණක් සිටියදී නිවසේ ඇතිවන කලබගෑනිය මේ තරම්ම වේනම් දරුවන් දහදොළොස් දෙනකු සිටීනම් ඇතිවන තත්ත්වය සිතා ගැනීමට පවා අපහසුය. අපේ නිවස වැනි නිවසක දරුවන් විසිදෙනකු පමණ සිටීමේ වුවද අමුත්තක් නැත. එසේම මේ දරුවන් ළඟ සමහර න්‍රක පුරුදු දක්නට ලැබේ. මා ඒවා පිළිකුල් කරන්නේ මා පාසල් නේවාසිකාගාරයේ සිට පැමිණ තවමත් වැඩි කලක් ගත නොවූ නිසා විය යුතුය. ඔවුහු වත්ත පිටියේ සෑම තැනක කෙළ ගැසීමටත්, මුත්‍රා කිරීමටත් පුරුදුව සිටියහ. කෙළ ගැසීම



නරක සිරිතක් නොවන බවත් එය අප්‍රිකානු සම්ප්‍රදායක් බවත් කියමින් සමහරු වාද කරති. එහෙත් මෙය ඉතාම නරක පුරුද්දක් බව මම සිතමි. ඔවුන් අංගනයේ කෙළ ගැසීම තරම් මා තරහ අවුස්සන තවත් කරුණක් නැති තරම්ය.

මගේ බලාපොරොත්තුව ඉටු කරමින් අවසානයේ ජස්ටිනා පැමිණියාය. ඇ දැකීමෙන් මගේ සිතුවිලි සී සී කඩවී විසිරී ගියේය.

ජස්ටිනා පැමිණෙන විට දහවල් එකොළහ පමණ වී තිබිණ. ඇ රථ නැවතුමේ සිට ඇවිදගෙන එන විට අවට හැමගේ නෙත් ඇ වෙත යොමු වී තිබිණ. ඇ හැඩ සායක් සහ සිල්ක් හැට්ටයක් ඇඳ සිටියාය. මොට්ටැක්කිලියකින් හිස වසා නොතිබුණි. බොහෝ දැස් ඇ වෙතට හැරුණේ ඒ නිසාය. ඇ සොකෝතෝවලට පැමිණ තිබුණේ පෙරදින හැන්දෑවේය. මේ උද්‍යසන එතැනින් පිටත් වී තිබුණි.

"මට ටිකක් විවේක ගන්න ඕන." ඇ ගෙට ඇතුළු වූයේ එසේ කියාගෙනය.

"මං ආපු වාහනේ ගහල තිබුණා. 'විවේකයක් නැති මිනිසා' කියල. එළු ගඳ ගහන ගොවියෙකුටයි සුවඳ විලවුන් ගැලුමක් විතර ගාපු 'අල්හාජ් කෙනෙකුටයි තද වෙලා මං ආවෙ. තවමත් ඒ ගඳ සුවඳින් මගේ නාසය පිරිලා. අර සුවඳ විලවුන් ගඳට වැඩිය තව එළු ගඳ ඉවසන්න පුළුවන්."

"කොහොම වුණත් විවේකයක් නැති මිනිසා ඔයාව ආරක්ෂා ඇතිව මෙහාට ගෙනාවනෙ"

www.sinhalaelibrary.com 57

මම ඇසුවෙමි.

"ඔව් කොහොමත් එහෙම වෙන්න එපායැ. ඊළඟ වාහනයේ ලියා තිබුණේ 'අප අතර තියෙන පැහැදීම විශ්වාසය' මේ ගමනේදී හොඳින් පෙනුණා. ඉතින් කෝ මහත්තය. මට එයාව දක ගන්නකං ඉවසිල්ලක් නැහැ."

ඈ එක දිගට කියවාගෙන ගියාය.

"ඔයා හිතන් ඉන්නෙ එයා නිකම් ගේ ඇතුළට වෙලා ඉන්න කෙනෙක් කියලද?"

"නැහැ. නැහැ. මං දන්නව එයා හුඟක් සල්ලි හම්බකරන කෙනෙක් බව."

"මං කිසි දෙයක් කරන්නෙ නැතිව ඉන්න එකේ එයා මටත් එක්ක සල්ලි හොයන්න එපායැ."

"මට එයා දකිනකං ඉවසිල්ලක් නැහැ."

අප ඒ වනතුරුම සිටියේ එකිනෙකාගේ දෑත් පටලවාගෙන සිටගත් ගමන්ය. එකිනෙකා දක ගැනීම නියා අප දෙදෙනා තුළම වූයේ හුස්ම ඉහළ පහළ හෙළීමට බැරිතරම් වූ කැළඹීමකි.

"එතකොට ඔයා කොහොම හරි අන්තිමට මාව බලන්න ආව."

"ඉතින් බෙලෝ නෝනා. හොඳයි ඇත්තටම ඔයා දන් බැඳපු ගෑනියෙක්."



"එන්න අපි කාමරේට යමු. ඔයාට මොනව හරි බොන්න පුළුවන්."

"අද ඔයාගෙ රාජකාරි දවසද?"

ඈ එසේ ඇසුවේ කාමරයට ඇතුළුවෙමින්ය. දෑස පුරා දඟකාරී බැල්මක් රැඳී තිබිණ.

"නැහැ කලබල වෙන්න එපා. අදත් නැහැ. හෙටත් නැහැ. අද ඉඳල දවස් හතරක්ම නැහැ. මං මාගේ වාරෙ ඉවර කළා."

"එතකොට දවස් දෙකේ වාරවල්. මට තේරෙනවා"

"නැහැ. ඔයාට මොකවත් තේරෙන්නෙ නැහැ"

"එතකොට අල්හාජ්ට මේ දවස් හතරේ කාර්තුව හරි දිගයි වගේ දනේවි"

"ඒ මොකද එහෙම වෙන්නෙ. එයාට අල්හාජ් කියල කියන්න එපා. මං කැමති නෑ."

"හරි එහෙනම් කොහොමද එයාට කතා කරන්න ඕනි."

එසේ කියමින් බැරෑරුම් ලෙස ඈ මා දෙස බැලුවාය.

"දාරී මට හංගන්න එපා. ඔහු ඔයා මත්තෙ හිසේ සිට දෙපතුල දක්වාම ආදරෙන් පිස්සු වැටිලා. ඔය ඔයා පින්නෙ පිපිච්ච මලක් වගේ ලස්සන වෙලා. ඔයාගෙ වාරේ එනකන් ඔහු නොඉවසිල්ලෙන් බලන් ඉන්නව ඇති."

www.sinhalaelibrary.com 58

"ඒ ඔයා මවා ගත්ත ප්‍රේම උන්මාදයක්. එහෙම නැත්නම් ඔයා කැමති විදිය වෙන්න ඇති.

ඒත් ඔයා හැමදාටම වැඩිය ලස්සන වෙලා. ලොකු ඇස් පිහාටුවල යටින් එක බැල්මක් හෙළුවාම ඇති. ආයෙ ගැලවීමක් නැහැ. ආයෙ ඔයාව ඉස්කෝලෙ යවන්න අකමැති වෙන එක පුදුමයක්යැ."

"ඇති ඇති මොනවද බොන්න කැමති?"

"මේ වෙලාවෙ කෝක් හොඳයි."

පාතිමාගේ හා අමීනාගේ කාමරවලට ගිය වෙලාව හැරුණු විට ජස්ටිනා ආ මොහොතේ සිට මේ දක්වාම අප දෙදෙනා නොනැවතී කතා බහේ යෙදුණෙමු. ජස්ටිනා හවුසා බස හොඳින් කතාකරනු ඇසීම පාතිමාගේ පුදුමයටත් සතුටටත් හේතු විය. ජස්ටිනා හවුසා බසේ කෙළ පැමිණියෙකු බව මා කලින් ඈ සමඟ පවසා නොතිබුණි. අමීනා ඉංග්‍රීසියෙන් කතා කළ අතර එය ද ආගිය තොරතුරු විමසීමක් පමණක් විය.

එදින පාතිමාට රාජකාරි පැවරී තිබීම හැම අතින්ම හොඳක් විය. ඈ හදන කෑම වර්ග ද විශිෂ්ඨය. ජොලෝ බත හා හොද්ද ඉතාමත් රසවත් වූ අතර පාතිමා ඒ වෙනුවෙන් ලොකු කැපවීමක්ද ද කළාය.



## 16

**ජස්ටිනාට** බෙලෝ දක ගැනීම සඳහා පුදුම නොඉවසිල්ලක් තිබිණ. හවස හතරේ සිට ඈ ඔහු හමුවීමට සූදානම් වූවාය.

"මෙච්චර පරක්කු වෙනකං ඔහු මොනවද කරන්නෙ?"

"එයා දන්නෙ නැනෙ ඔබ අද එන බව."

"ඇයි තරුණ බිරිඳ හින්ද ආපහු ගෙදර එන්න ආශාවක් නැද්ද?"

"සාමාන්‍යයෙන් වැඩ කටයුතු යෙදිල තියෙන විදියට, අද එයාට එයාගෙ තරුණ බිරිඳ දකින්නවත් ඉඩක් නැහැ"

www.sinhalaelibrary.com 59

ගෙදර කැටුව යෑමට තම හාම්පුතුන් එනතුරු බලා සිටියහ.

සතුන් අතරින් ඉදිරියට ඇදෙද්දී උන්ගේ මළ මුත්‍රා ගඳ අපේ නාස්පුඩුවලට දරාගත නොහැකි තරම් විය.

අපට ඉරිදා පොළේදී බාරෝ මාමා හමු විය.

"ඔබ දක්කද ඔබේ සහෝදරී අමීනා"

අප දුටු ඔහු ඇසුවේ අපෙන් රහසක් අසන්නාක් මෙනි.

"නෑ, අපි දක්කෙ නෑ..."

මා එසේ පැවසුවද ඇ මෙහි කුමක් කරනවාදැයි මගේ යටි සිත ප්‍රශ්න කළේය. එසේම බරෝ මාමා එය ඇසූ විලාශය ද මා තුළ පුදුමයක් ඇතිකරවීය. මා එය සිතින් ඈත් කිරීමට උත්සාහ දැරුවද මා තුළ වූ සැකය ඈත් නොවීය.

ඇ ආවේ කවුරු හරි මුණ ගැහෙන්නද? මෙහොතකට පසු අඹ ගසක් මුල වාඩි වී දියලබු ගෙඩිවලින් නොයෙකුත් සැරසිලි මවන මිනිසකු අපට හමු විය. මම ඔහු ලවා ලස්සන දියලබු මල් පෝච්චියක් කප්පවා ගත්තෙමි.

කෝවල් කරමින් මමත් ජස්ටිනාත් තවත් බඩු කිහිපයක්ම මිලදී ගත්මුත් බෙලෝ දුන් මුදලින් හරි අඩක්වත් වියදම් නොවීය.

අයිසැක් සමග වික්ටර්ද මට පොළේදී මුණ ගැසිණ. මගේ විවාහයෙන් පසු මේ ඔහු මුණගැසුණු ප්‍රථම වතාව විය. ඔහු දකීමෙන් මා සිත තුළ කිසිදු තිගැස්සීමක් ඇති



නොවීය. එහෙත් ඔහු බෙලෝ මහත්මිය යයි මා අමතද්දී මා ලජ්ජාවට පත් විය.

අප වෙළෙඳපොළ භූමිය හරහා ගොස් පටු මාවතකට අවතීර්ණ වෙද්දී අමීනා තවත් ගැහැනියක සමග ඇවිදගෙන යනු ඡායාවක් මෙන් පෙනිණ.

"අර අමීනා යාළුවෙක් එක්ක"

මම ජස්ටිනාට රහසින් කීවෙමි.

"ඉතින් මොකද?"

මගේ පහත් සිතුවිලි අවබෝධ කරගත් කලක මෙන් ජස්ටිනා තරහින් පැවසුවාය.

"මට නම් තේරෙන්නේ නෑ ඔබේ හිතේ තියෙන කහට මොකක්ද කියලා. ඇයි ඔබ අමීනාට ඔය තරම් බය?"

ජස්ටිනා යළිත් කීවාය.

www.sinhalaelibrary.com 60

## 18

ආපසු පැමිණි ජස්ටිනා තද නින්දකට වැටුණාය. එහෙත් නින්ද මා අසලකටවත් නොපැමිණියේය. ඒ අමීනා දැකීමෙන් මා සිත මුරණ්ඩු වූ නිසා විය යුතුය. පොළට යන්නට පෙර දැඩි සතුටකින් උන් මා සිතට වන් මේ උල් කටුව දැන් දිගින් දිගටම මා සිත රිදුම් දෙන්නට විය.

අප බකුරාවලට ගිය ගමනේදී ජස්ටිනාගේ මාමා කෙනකුගේ නිවසට යෑමට ද අවස්ථාව ලැබිණ. අප බකුරාවලට ළඟාවන අවස්ථාවේදී රාත්‍රි අඳුරේ ගිලෙන්නට සූදානම් වූ ඉර පැහැදිලි අහස් තලය මත තඹ පෙත්තක් මෙන් දිස් විය.

බක් මාසයේ අවසානය ළඟා වෙමින් තිබිණ. පසුගිය සතියේ වට මහ වරුසාවෙන් පසු තවත් වැසි බලාපොරොත්තුවෙන්



කුඹුරු බීජ රෝපණය සඳහා සූදානම් කොට තිබිණ. හමටාන් සුළඟින් කැඩී බිඳී කොළ හැලී ගිය ගස් වැල් සිහින් කොළ පැහැයකට හැරෙමින් තිබිණ. පංති කාමරයක ප්‍රශ්න ඇසීමකදී අති දක්ෂ දරුවන් අන් හැමට කලින් අත ඔසවන්නාක් මෙන් ඉඳ හිට තැනක කොළ පැහැති පඳුරක කහ පැහැයෙන් බබලන මලක් දෙකක් දක්නට ලැබිණ. සාමාන්‍යයෙන් මල් පූදින්නේ වෙසක් මාසයේය. එහෙත් මෙහි මල් පිබිදීම ඇරඹී ඇත. එය අදහා ගැනීමට බැරි තරම් ලස්සනකි. සතුටින් උද්දාමයට පත් ව කතා කර ගැනීමට පවා බැරි විය.

අප බකුරා පාරට හැරෙද්දී වාතාවරණය මඳින් මඳ වෙනස් විය. වාහනවලින් තොරවූ පාරේ ඉඳ හිට දක්නට ලැබුණේ පොදු මගී වාහනයක් පමණි. මුළු වටපිටාව එකම ගැමි දර්ශනයකි. ගොපලු දරුවෝ රිටි අග දවටු වතුර බෝතල් අතින් ගෙන උදාසීන ගවරැළ පසුපස ඇදුනාහ. කොටළුවකු හෝ ඔටුවකු දක්කාගෙන යන මිනිසකුගේ හෝ ගැහැනියකගේ දර්ශනයක් ඉඳහිට ඇස ගැසිණ.

බකුරා වැව අසලට යෑමට අප දෙදෙනාට අවශ්‍යව තිබිණ. බෙලෝ අකමැත්තක් නැතිව ඒ දෙසට රිය පදවාගෙන ගියේය. බැස යන හිරු අපේ දකුණු පසින්ද නැග එන සඳු අපේ වම් පසින්ද දක්නට ලැබිණ. හැම ඉරක්ම පැහැදිලිව නිරේකනය වී තිබිණ. මැකී යන හිරු රැසින් වතුර යන්තම් දිස්නය දුන්නේය. දරුවන් කිහිප දෙනෙක් ඈත දියඹේ දිය නාමින් සිටියහ. ඔවුන් නොසිටියේ නම් මුළු වැව් පියසම එකම නිහැඬියාවකි. අපි ඔහේ වතුර දෙස බලා සිටියෙමු. වතුරේ සහජයෙන්ම පවතින නිසොල්මන් බව මත ගිල්ලවූ රැළි මාලාවන් දෙස මම කුතුහලයෙන් බලා සිටියෙමි. විශාල

www.sinhalaelibrary.com 61

ජලාශ දැක නැති මට වතුර හැම විටම සතුට ගෙන දුන්නේය. වතුර හිඟයකදී වැහිවතුර එක්රැස් කරගත් අවස්ථාවක හැරුණු විට මෙතරම් වතුර සම්භාරයක් මා දුටු ප්‍රථම අවස්ථාව මෙය විය. මටම තේරුම් ගත නොහැකි අද්භූත බවක් මේ වැව තුළ ඇතැයි මට සිතිණි.

මොහොතකට පසු වැව් අංගනයෙන් ගැහැනියක් හා දරුවෙක් මතුව ආහ. ගැහැනිය ගෞරවනීය ලෙස බෙලෝට ආචාර කළාය. ඇය තමන් වෙනුවෙන් වැඩ කළ එකියක බව බෙලෝ පැවසුවාය. මටද ආචාර කළ ඇ පිටේ එල්ලාගෙන සිටි දරුවා පටිවලින් මුදා හැරියාය. දරුවා ආබාධිතයකු බව මට දිස්වූයේ ඒ මොහොතේය.

මේ මගේ අක්කගෙ දරුවා. මේ දරුවට මෙහෙම වුණේ මොකද කියල දන්නෙ අල්ලා දෙවියන් වහන්සේ විතරයි. ඇ දරුව ලැබෙන්න ඉන්දෙද්දී ඇගේ මහත්තයගේ වැඩිමල් බිරිඳ ඇට මොනවහරි මතුරාපු දෙයක් කන්න දීලා කියල ඒ අය කියනවා. අල්ලා දෙවියනේ දුකක්. මෙහෙම දුකක්"

ඇ දිගින් දිගටම කියවාගෙන යද්දී මගේ දෙපා ගැහෙන්නට විය. මම ගසට හේත්තු වුණෙමි. ගසේ එතී සිටි කුඩා හෝහපුටුවෙක් මගේ අත දෂ්ට කළේය. කිසිවකු හා නොපවසන ලද මගේ සියලු බියත් පාතිමාගේ මැතිරිලි හඬත් එකට කැටි කළාක් මෙන් වකුටු වූ දරුවා මා වෙතට පා ඔසවන්නට විය. මගේ දෙවියනි, මටත් සිදුවිය හැක්කේ මෙවැන්නක්ද? පාතිමා ස්ථිර වශයෙන් කිය කියා ඇවිදින්නේ මෙවැනි සිදුවීමක්ද? පරිසරයේ තනිකම වතුරේ වූ ගුප්ත බව, හැම තැනකම දුවන සුළඟේ මුනුමුනුව මේ සියල්ල මගේ



සිතුවිලි හා පැටලී තිබුණි. මම ජස්ටිනා සමඟ ආපසු මෝටර් රිය වෙත පිය නැගුවෙමි. බෙලෝ සිටියේ අපට මඳක් ඈතිනි. ඔහු ගැහැනියට කිසියම් මුදලක් දෙනු මට පෙනිණ. ඇ බෙලෝට ආචාර කරමින් වකුටු වූ දෙපාවලට කුඩා ලී දෙකක් සම්බන්ධ කර ඇවිදින දරුවා ඔසවා ගත්තාය. කඳ හිසෙන් වෙන් කෙරෙන බෙල්ලක් පවා නොවූ දරුවා හිස් බැල්මෙන් බලා සිටියේය. දරුවා ඔසවාගත් ඇ ඈත සිට අප දෙස බලා සිටියදී බෙලෝ අප වෙත පැමිණියේය.

"පරක්කු වෙලා අපි යමුද?"

එසේ කියමින් බෙලෝ රියට නැග්ගේය.

අපි ජස්ටිනාගේ මාමාගේ නිවසට ගියෙමු. මාමාත් ඔහුගේ බිරිඳත් අන්බරා රාජ්‍යයෙන් පැමිණි අයය. ඔවුන් දෙදෙනා අලුත විවාහ වූ යුවළකි. ඔවුන්ගේ නිවස ක්‍රමානුකූලව තැනුණු රජයේ නිවාසයකි.

"ඔබ නගරේ හදන්න යන එකත් මේ වගේ එකක්ද?"

ජස්ටිනා කිසිදු පැකිලීමක් නැතිව එකවර බෙලෝගෙන් ඇසුවාය.

"ඔව්. මං හිතන විදියට මීට වැඩිය ටිකක් ලොකුයි."

බෙලෝ පැවසීය.

මා මේ නිවස ගැන ජස්ටිනාට පැවසීමෙන් ඔහු කෝපයට පත්විණිදැයි මම සිතන්නටවීමි. එහෙත් ඔහු ඒ ගණන් ගත් බවක් පෙනෙන්නට නොතිබිණ.

www.sinhalaelibrary.com 62

අප ආපසු නිවසට යනවිට බෙහෝ රෑ බෝවී තිබිණ. පාතිමා කෑම සූදානම් කර තිබුණ ද මට කෑම ප්‍රියක් නොවීය. මගේ සිතුවිලි ආබාධිත දරුවා පසුපස ගමන් කරමින් ඒ පිටුපස ඇති කතන්දරය සිහිපත් කරවීය. රාත්‍රී ආහාර ගැනීමෙන් පසු අප දෙදෙනා සඳ එළිය වැටුණු අංගනයට වී බොහෝ වේලාවක් කතාබහ කරමින් සිටියෙමු.

"මොකද අර දරුව දැක්ක ගමන් ඔබ ඔය තරම් කලබල වුණෙ?"

මගේ සිත් පෙරළිවලට කවදත් ඔරොත්තු දුන් ඈ ඉතා සංවේදීව ඇසුවාය.

"ඔබත් දන්නවානේ අර ගැහැනු එක්කෙනා කියපු දේවල්. ඔබටත් ඇහුනනෙ. අමීනා කරන්න සැරසෙන්නෙත් ඒ වගේම දෙයක් තමයි."

"පිස්සු මරගාත. ඒක අවාසනාවන්ත සිදුවීමක්. දෙවියන්ගෙ කැමැත්ත හරි මොකක් හරි ඔබ කැමති විදියකට සිතා ගන්න. නැතුව ඒක කවුරුවත් කරපු දෙයක් නෙවෙයි."

"මටත් සමහර වෙලාවට ඔය විදියටම කියා ගන්නව. ඒත් මට බයයි මට වෙන දේවල්වලට"

"ඔබේ මනඃකල්පිතයන්ට ඔහොම අයාලේ යන්න ඉඩ දෙන්න එපා. ඕනවට වැඩිය කල්පනා කරනකොට තමයි ඔහොම වෙන්නෙ. අමීනා වෙද්දු බලන්න යන බව වත් ඔබ දන්නෙ නැහැනෙ."



"ඈ යනවා පාතිමා ඒ ගැන දන්නව. මගේ කෙස් වගයක් බිම වැටුණු වෙලාවෙ. ඈ කොයිතරම් කැගැහුවද කියල ඔබ දන්නෙ නෑනෙ. පස්සෙ ඈ මට හොඳ දේශනාවක් දුන්නා. ඔහුත් එක්ක සතුටින් ජීවත් වෙන්න තිබුණත් කොහොමද මෙහෙම ඉන්නෙ"

"ඒත් පාතිමා ඔබේ ආරක්ෂාවට ඉන්න එක කොයිතරම් හොඳ දෙයක්ද?"

"ඒත් සමහර වෙලාවට මට හිතෙනව ඈ සේරම දේවල් මට කියන්නෙ නෑ කියල. ඒ කොයික වුණත් නගරෙ හදන ගේ ගැන මං හිතන විදියට ඈ මනාපයි. ඈ ඒ ගැන මා එක්ක කොයිම වෙලාවකවත් කතා කරල නෑ."

"ඒත් ඔබනෙ ඉදිරිපෙළ බිරිඳ"

ජස්ටිනා කීවේ උපහාසාත්මක ස්වරයෙනි.

"ඉදිරිපෙළ බිරිඳ කෙහෙල්මල. මට ඔය වචනෙත් තිත්තයි. මේ විදියට වුණොත් මේ ගෙදර පිස්සන් කොටුවක්. මට මේ විදියට වේදනාවෙන් ඉන්න සිද්ධ වුණොත් මොන ඉදිරිපෙළක්ද? වේදනා විඳලම මට දැන් ඇතිවෙලා."

"මෝඩ වෙන්න එපා. ඔබ මේ තරම් මිත්‍යා විශ්වාසයන්හි ගැලී ඉන්න බවක් මම කවදාවත් දැනගෙන හිටියෙ නෑ. ඇත්තටම ඔබ මේ පිස්සු දේවල් විශ්වාස කරනවද?"

"මං සියයට සියයක්ම විශ්වාය කරනවද? නැහැ ඒත් විශ්වාස නොකරනවයි කියන්නත් බැහැ. විශ්වාසයයි

www.sinhalaelibrary.com 63

අවිශ්වාසයයි අතර ඇති ඉම බොඳ වෙලා හේදිලා ගිහින්. කොහොමද මං මේවා මුළුමනින්ම ඉවත දමන්නෙ මගේ මුළු ජීවිතය පුරාම මේවගේ සත්‍ය දේවල් ගැන අහන්න ලැබෙන කොට...."

"ඔබ ඔයිට වැඩිය බුද්ධිමත් වෙන්න ඕනි. මොනව හරි හිත් ඇදගන්නා දෙයක් කියවල ඔය පිස්සු විකාර අමතක කරන්න."

"ජස්ටිනා මට තව දෙයක් තියෙනවා ඔබ එක්ක කියන්න"

සඳ වළාකුලකට වැසී ගියෙන් අංගනය අඳුරේ ගිලිණ. කොහොඹ ගස අඳුරු පැල්ලමක් මෙන් විය. බෙලෝ පාතිමා සමග නින්දට ගොස් ඇතැයි මට සිතිණ.

"මොකක්ද?"

ජස්ටිනා සිහින් ස්වරයෙන් ඇසුවාය.

"මට හිතෙනවා මගේ මාසික ඔසප් වීම නැවතිලා කියලා. දන් ඝුමාන දෙකක් විතර වෙනවා"

"ඇයි ඔබ කිව්වෙ ඔබ පෙති පාවිච්චි කරනව කියල"

"ඔව් මං පෙති පාවිච්චි කළා. ඒත් මේ පසුගිය මාසෙ බැරිවුණා. ගෙන්න ගන්න බැරිවුණා. බෙලෝටවත් පාතිමාටවත් නොදනෙන්න ගෙන්න ගන්න එක හරිම අමාරු වැඩක්. අර ගොවිපළට ගිය දවසෙ..."

"ඉතින් ඕකට කනගාටු වෙන්න දෙයක් තියෙනවයැ. අනික ඔබේ ප්‍රේමාන්විත ගමනකින් පස්සෙනෙ. කනගාටු වෙන්න එපා. සේරම ඔබේ යහපතට සිද්ධ වේවි. අලුත් ගේත් හැදුවම."



ජස්ටිනා යමක් කිවයුතු නිසා කතා කරනවා යැයි මට සිතිණ.

"ඔය ගේ තව තව ප්‍රශ්න ඇති කරාවි. අමනාපකම් වැඩිවේවි. කොහොමත් බබෙක් හම්බවෙන්න ඉන්න කොට ඕව හුභක් දරුණු වෙනවයි කියල ඒ අය කියනව. ඕන කෙනෙක් නපුරු වෙනවලු..."

"කවුද කියන්නෙ. එහෙම කවුරුවත් කියන්නෙ නැහැ. ඔබ නිකම් හීන මවනවා"

ජස්ටිනා පැවසුවේ තරහිනි. මට මේ දේවල් ඒත්තු ගැන්වීම සඳහා ඇ මහා ප්‍රයත්නයක යෙදුණි.

නිවස දැඩි නිහැඬියාවක ගිලී තිබිණ. එය සොහොන් කොතක ඇති මරණයේ නිහැඬියාව හා සමානයයි මට සිතිණ.

.... එහෙත් නිවසේ හුස්ම ඉහළ පහළ හෙළන, නින්දේදි හීන දකින, නින්දෙන් ගොරවන මෙතරම් අය සිටියදී එය එසේ සිදු විය හැකිද?...

මම මටම දොස් කියා ගතිමි.

පාසල් නේවාසිකාගාරයේදී ගැබිනියක් වූ අඩීසා ගෙදර පිටත් කර යැවූ අන්දම ඔබට මතකද?

"අපොයි ඔව්. ඇ ආපහු ආවේ නෑ."

www.sinhalaelibrary.com 64

"ඒ මිනිහ ඇව බැන්දද දන්නෙ නෑ"

"අමීනා ගැන තියෙන බය ගැන ඔබ බෙලෝ එක්ක සාකච්ඡා කළාද?"

"නැහැ. ඒත් මං අමීනා එක්ක ඒ ගැන කතා බහ කරන්නෙ නැතුව කොහොමද එක පාරටම බෙලෝ එක්ක කියන්නෙ?"

"බෙලෝ දන්නවද ඔබ දරුවකු පිළිසිඳ ගත් බව"

"නැහැ තවම දන්නෙ නෑ. ඔහු පුදුමයට පත්වේවි."

නින්දට යෑම සඳහා අපි ගෙතුළට පිවිසියෙමු. ඇඳට වැටුණු ගමන්ම ජස්ටිනා නිදි ලොවට පිවිසුණු බව පෙනිණ. ඇ හෙට උදේ යනු ඇත. ඉන්පසු විශ්වාසය තැබිය හැකි කිසිවකු මට නැති වෙයි.



## 19

මා කුස තුළ දරුවකු පිළිසිඳ ගැනීම කවදුරටත් සැක සහිත නොවීය. උදෑසන වමනය නොදැමීමට තරම් මා වාසනාවන්ත එකියක නොවීය. උදෑසන ඔක්කාරය පමණක් නොව මම මුළු දවස පුරාම ලෙඩ ගතියෙන් පෙළුණෙමි. මගේ ගෙදර වැඩ කටයුතු සියල්ල පාතිමා බාර ගත්තාය. ඈ වෙනුවෙන් දෙවියන්ට ස්තුති වේවා. මට කිසිදු කෑමක් පිරිය නොවීය. මට අවශ්‍ය වූයේ තනිව සිටීම පමණි. මේ මැයි මාසයේ තද උණුසුමක් දැනිණ. හේතු රහිතව මගේ සිත තරහින් පිරී ගියේය.

අප පාසලේ ඉගැන්වූ විජාතික පාසල් ගුරුවරිය මට හදිසියේ සිහිපත් විය. ඈ ඇගේ මිතුරියක හා කී දෙයින් මගේ මතකය අවදි කළේය.

www.sinhalaelibrary.com 65

"මේ අප්‍රිකානු ගැනුන්ට දරුවකු පිළිසිඳ ගැනීමයි, දරුවකු බිහි කිරීමයි කියිම ගණනක් නැහැ. උදෑසන ඔක්කාර ගතිය දනෙන්නෙවත් නැහැ."

මෙය සිහිපත් කළ මගේ සිත තරහින් පුපුරන්නට විය. බොහෝ විජාතික ගැහැනු අප ගැන කතා කිරීමේදී යොදන ස්වරයම ඇගේ මුවින්ද පිටවිය. ඔක්කාරය දැමූ මොහොතක ඇගේ විවේචන සිහිපත් කරමින් මා කෝපයෙන් දත්කුරු කෑ අන්දම මහා මෝඩකමකැයි මට සිතේ. අපට වැඩිදුර ඉගැන්විය යුතු නැතැයි ඇගේ සැමියා කියා තිබිණි. එසේ කළහොත් ස්වදේශිකයන් ඔවුන්ගේ තැන ගනු ඇතැයි ද එවිට ඔවුන්ට රටින් පිටවීමට සිදුවෙතැයි ද යන්න ඔහුගේ අදහස විය.

මා ගැබ් ගැනීමේ ආරංචිය ඇසූ බෙලෝ මහත් සේ සතුටට පත් විය. ඒ සතුට කෙනකු ප්‍රථම වරට තම බිරිඳ ගැබ් ගැන්වූ කලක මෙන් විය. මා පෙත්තෙන් කළ ප්‍රාතිහාර්යයන් කිසිත් නොදත් ඔහු සිතා සිටින්නට ඇත්තේ මා වඳ ගැහැනියක කියාය. එක් අතකින් මෙය මට සැනසිල්ලක් විය. මෙය දිගින් දිගටම ප්‍රමාද කරන්නට යෑම මගේ සිත්තැවුලද වැඩි කරන්නකි. එහෙත් අනික් පැත්තෙන් මගේ සිත මූසල බයකින් වෙළාගනී. ඒ දරු ප්‍රසූතිය නිසාවත් උදෑසන ඇතිවන ඔක්කාරය නිසාවත් නොවේ. උදෑසන ඔක්කාරය සති කිහිපයකින් අවසන් වී යනු ඇත. ඒත් අනෙක් දේවල්.

* * *

ජස්ටිනා පිටත්ව ගිය පසු මගේ බියපත්වීම් හා දුක්ගැනවිලි පවසන්නට කිසිවකු නොවූයෙන් මම මහත්සේ



කනගාටුවට පත්වීමි. සමහර අවස්ථාවලදී මම කරන හැම දෙයක්ම බිය ගෙන දෙන සුළු විය. තවත් සෑහෙන කාලයක් යනතුරු මට එයින් ඈත් වීමට හෝ එය අමතක කිරීමට නොහැකි වෙයි. ඒ හරියටම මා පසුපසින් මහා බරක් මා තල්ලු කරගෙන යන්නාක් වැන්න. සමහර විට මගේ අත් පා පිළිස්සී ඒ කායික වේදනාවක් බවට පත්වෙයි. මා ඒ කල්පනාවේ නිමග්නව සිටින විට කොයි පැත්ත බැලුවත් මට පෙනෙන්නේ මගේ බිය වැඩි කරන දේවල්මය. පොතක් ගෙන කියවීමට උත්සාහ කළත් පුවත්පතක ශීර්ෂ පාඨයකට ඇස් යොමු කළත් ඒ සියල්ලම මගේ රහසිගත බිය වැඩි කරලන්නක් විය. එක් දිනක් මා පරණ පත්‍ර කැබැල්ලක් කියවන්නට ගත්විට මා තුළ ඇතිවූයේ පුදුම බියකි.

"තම සැමියාගේ වැඩිමහළු බිරිඳගේ යොවුන් දියණිය මරා දැමීම නිසා කාන්තාවක් අත් අඩංගුවට ගනී."

එහි සඳහන් වූ අන්දමට ගැහැනිය තම සැමියාගේ දියණිය නිදාගැනීම සඳහා තම කාමරයට කැඳවාගෙන ඇත. උදෑසන බලන විට දැරිය මියගොස් සිටියාය.

ජස්ටිනා පිටත්ව යෑමෙන් පසු මුළු නිවසම දැඩි පාළුවකටත් නිහැඬියාවකටත් බඳුන් වෙමින් පවතී. මා 'මුළු නිවසම' යයි සඳහන් කරන විට මෙහි සිටින දුර නෑයන් සහ නවාතැන්කාරයන් ගැන නොසිතුවෙමි. මේ මිනිසාගෙන් යැපෙමින් මෙහි ජීවත්වන දුප්පත් මාමාවරු වයසක නැන්දලා හා මස්සිනාලාගේ සංඛ්‍යාව ගැන අසන කෙනෙක් පුදුමයට පත්වනු ඇත. සමහර ලේඛකයන් විශාල පවුල් ගැන කරන විචිත්‍ර වූ වර්ණනා මට කිසිසේත් ප්‍රිය නොවීය. එහි යහපත්

www.sinhalaelibrary.com 66

පැත්තක්ද තිබිය හැක. මාදනට සිටින මානසික තත්ත්වය අනුව කිසිම දෙයක හොඳ පැත්තක් මට නොපෙනිණ. මට පෙනුණේ හැම තැනම කෙළ ගසමින් බිම අපිරිසිදු කරන අන්දමය. මේ නිසා වෙනම නිවසක ප්‍රධාන බිරිඳ වී සිටීමට ලැබීම මගේ සතුටට හේතුවිය. තම නෑසියන් සමග කතාබහ කිරීමට බෙලෝට කොහෙත්ම වේලාවක් නොවීය. ඔහු කළේ ගීතාවකින් හෝ ආචාර කිරීමකින් ඔවුන් සතුටු කිරීම පමණි. එහෙත් ඔහුට කිසියම් කාර්යයක් කරවා ගැනීමට අවශ්‍ය වූයේ නම් ඔව්හු එය ඉතා ඉක්මනින් ඉටුකර දුන්හ. අමුත්තකු නිවසට පැමිණි සමහර අවස්ථාවක කොහොඹ ගස මුල පැදුරක් එළාගෙන බෙලෝ ඔවුන් සමග ආහාර ගත්තේය.

මා බැහැ දැකීමට පැමිණි මව මා ගැබ්ගෙන ඇති බව දන මහත්සේ ප්‍රීතියට පත්වූවාය. ටික කලකට හෝ එය රහසක් වශයෙන් තබා ගැනීමට මට අවශ්‍ය වුවද මට සැඳුණු දරුණු ඔක්කාරය විසින් එය එළක්වනු ලැබිය. මා අවට බොහෝ දෙනකු සිටි බැවින් මුල් සති කිහිපය තුළම ඔවුන් ඒ බව දන ගත්හ.

මස් ගඳ ඉවසිය නොහැකි වූ අතර දින ගණනක්ම මට හරිහමන් ආහාරයක් ගත නොහැකිවිය. ඔක්කාරය කළ මුල්ම දිනයේ අමීනා අවට සැරිසරුයේ නියම තත්ත්වය දැනගන්නා අටියෙනි. එය මගේ අසනීපය වැඩි කරන්නක් විය. ඇ දකිත්ම මා බියෙන් වෙළී ගියේය. ජස්ටිනාගේ දේශනවලින් මගේ මෝඩ කල්පනා ඇත් කළ නොහැකි විය.

මගේ සිතුවිලි යළිත් මා වැව වෙතට ගෙන ගියේය. එක් රැස්වූ දිය කඳ දිලිසෙමින් සැළෙමින් තිබිණ. කටු සහිත ගස



ඔයට සෙවන දුන්නේය. වපර ඇස් ඇති බකල කකුලකින් යුත් වකුටු වී ගිය දරුවා දිය කඳ දෙසට බඩගා යන්නට විය.

"ඔය දරුවගෙ තාත්තගෙ වැඩිමල් බිරිඳ කරපු දෙයක්" දරුවාගේ මව මගේ කණට කොඳුරන්නට විය.

"හත් මාසෙදි මොකක් හරි පන්නල තියෙනවා"

වියරුවෙන් මංමුළාවූ මගේ මනස බියෙන් ඇළලී ගියේය. කුමක් කළයුතුදැයි මම නොදත්තෙමි.

"කෝ... ඔබ කියන ඔය පැසුණු බුද්ධිය, ලැජ්ජ නැද්ද ආච්චිලගෙ කතාවල් විශ්වාස කරන්න...."

ජස්ටිනා මට දොස් පවරන හඬ ඒ සමගම ඇසිණ. එවිට එතැන මා පමණක් නොවීය. මා වැනි බොහෝ දෙනෙක් එකට එතී එකට ඇලී සිටියහ. එක් පසෙකින් බාරෝ මාමාගේ මනඃකල්පිත කතා අසා සිටින මමය. අඳුරින් වැසීග- පොකුණක් අසළ නොපෙනෙන බලවේගයන් හා දෙවියන්ට වහල්වූ මම තවත් පසෙකිනි. සැඟවුණු බියකින් හා ලෙයින් නැහැවුණු පූජාවන් කරන මා වැන්නෙකුත්, පාසලේත් පංති කාමරයේත්, පාසල් පුස්තකාලයේත් විවාද ශාලාවේත් නමක් තැබූ මමත් තවත් පසෙකින් විය.

පූජාවන් සඳහා සූරු නගරයේ පිහිටි කිඹුලා ගඟ වෙත යෑමට අමීනා සූදානම් වන බවක් මට දැනගන්නට ලැබිණ. ඒ කුමක් සඳහාදැයි මම නොදත්තෙමි. පිරිමි ළමයෙකු ලැබීමේ බලාපොරොත්තුවෙන් විය හැක. ඔහුගේ ධනස්කන්ධයත්

www.sinhalaelibrary.com 67

විරුද්ධවාදීන්ට දක්වන හිතෛෂීභාවයත් නිසා සැමියා මරා දැමීමට වුවද පසුබට නොවන ගැහැනුන් ගැන මම බොහෝ විට අසා ඇත්තෙමි.

ඊළඟ සතියේ නව සඳ බැලීමත් සමඟ නෝම්බි ඇල්ලීම ඇරඹිණ. දරුවකු බලාපොරොත්තුව සිටි බැවින් මා නෝම්බි ඇල්ලිය යුතු නොවීය. මා කන්නට කැමැති යමක් ඇද්දැයි පෙරදින රාත්‍රියේ බෙලෝ මගෙන් ඇසුවේය. නොයිතූ අන්දමින් වූ බර අඩුවීම ඔහු බියට පත් කරන්නට ඇත. එහෙත් මා කැමැති මොනවාටදැයි මට සිතා ගැනීමට පවා බැරිතරම්ය.

දහවල් දවසේ වැඩි රස්නය මගේ ඔක්කාර ගතිය තව තවත් වැඩි කළේය. හිස් බඩ නිසා පිත ඉහළට එද්දී මගේ කෑම අරුචිය තව තවත් වැඩි විය. දහදියෙන් හෙම්බත් වූ ශක්තිය හීන වී ගිය මම ඉවක දැමූ පාන්කඩයක් බඳු විය. සමහර විට මම හිස් සිමෙන්ති පොළවේ කුළුණකට හේත්තු වී බලා සිටියෙමි. මගේ ශක්තිය නංවාලීමට හුළං පොදකුදු අවට නොවීය. පැසෙන සුප් හැලියේ සුවඳ නිසා මට පළා දුවන්නටද සිතිණ. කිසිවකු විසින් මගේ සුව දුක් ඇසීම පවා මා කෝප ගැන්වීය.



# 20

**සති** කිහිපයක් ගෙවී යද්දී මම සාමාන්‍ය තත්ත්වයට පත්වීමි. උදෑසන ඔක්කාර ගතිය එතරම් තදින් තිබුණු බවක් මට සිතා ගැනීමට පවා බැරි තරම්ය. දැන් මට පුදුම බඩගින්නක් තිබේ. නිතරම මොනවා හෝ හප හපා ඉන්නට මට සිතෙයි. මට නිතරම බඩගිනි වන බව මම බෙලෝ හා පැවසීමි.

"එහෙනම් ඔයාට කන්න හොයන්න මට අලුත් ව්‍යාපාරයක් පටන් ගන්න වේවි."

එසේ කියමින් ඔහු හිනැහෙන්නට විය.

"ඊයේ රාත්‍රි මහ වැස්සක් වැස්සේය. හැන්දෑවේ ආලින්දයට වී මම බොහෝ වේලාවක් අහස දෙස බලා සිටියෙමි. තියහයෙන්

www.sinhalaelibrary.com 68

පසු මුල්ම වැසි වළාව සඳහා අහස සැරසෙන අන්දම ඉතාමත් චමත්කාර ජනකය. දීප්තිමත් විදුලි රැස් දහරා පැතිර ගියේ ස්වර්ගය ඉරිතලා යන්නාක් මෙනි. එකක් පසුපස එකක් සේ විදුලි රැස් හඹා ආවේ ආලෝකය දෙදරවමිනි. ඊළඟට නොනැවතී අහස ගුගුරන්නට විය. විදුලි සැරත් අකුණු හඬත් පුපුරා යද්දී මම සිත් වශී වූ කලක මෙන් ඒ දෙස බලා සිටියෙමි. අකුණු සැරයක් වැදී මියගිය හොත් කොතරම් භයානකදැයි මට සිතිණ. මරණය පැමිණෙතැයි යන බියමුසු සිතුවිල්ලෙන් තොරව එක්වරම ජීවිතය අවසන් කරන මෙය සුවදායි මරණයක් වනු ඇත. ඒ චමත්කාරජනක සුදානමින් පසු ඇතිවූ මුල්ම වැසිවළාව ආශිර්වාදයක් මෙන් විය. එසේම වාතය දූවිල්ලෙන් හා දුගඳින් තොරව හමා ගියේය. අකුණු සැරයක් වැදී මියැදුනහොත් ඔහු ස්වර්ගයකට යන බවට මිත්‍යා විශ්වාසයක් ද අප අතර තිබේ.

අංගනයේ හරි මැද වූ පුංචි හතරැස් තිරයේ අබු හා මා එක්වී එළවළු ඇට තවාන් කළෙමු. මෙතැන ඇත්තේ පැරණි පැපායා ගසක් පමණි. මෙහි කිසිවක් පැළ කිරීමට කිසිවකුට සිතක් පහළ වී නොතිබුණි. මෙහි බෝංචි ඇට සිටවූ පසු අපි වැස්ස පැමිණෙන තුරු හැමදාම ඒවාට වතුර වත්කළෙමු. වැස්සෙන් පසු ඒවා පුංචි මොටියන් දමමින් ඉහළ නැගෙන්නට විය. වැස්ස නිසාදෝ ඒවා මේ උද්‍යාන බූහක් උස්වී තිබුණි. ඒ සමගම අප විසින් ඉසින ලද ඇට හැමතැනම පැළ වී තිබිණ. මෙහි වතුරත් තිබියදී කිසිවකු විසින් කිසිවක් පැළ නොකිරීම හැම අතින්ම පුදුමයකි.

"ගොවිරාළල දෙන්නෙක්"



අප වැඩ කරනු දුටු පාතිමා හිනැහෙමින් කීවාය. අමීනා එකම වචනයකුදු පැවසුවේ නැතත් අප අසලින් එහාට මෙහාට යමින් බැල්මක් හෙළුවේ පැළ වැඩෙන්නේද ඇය හා අමනාපයෙන් යයි සිතමිනි. එහෙත් ඇගේ දුව ජෙසීමා අප අසළම දවටුණාය. කෝපය ඉවසාගත නොහුණු තැන ඈ අප අසලින් දුව ගියේ ජෙසීමාට උස් හඬින් කෑගසමිනි.

"අරයා බලාගෙන ඉන්නකොට අබු එක්ක වුණත් සෙල්ලම් කරන්න මං එපා කියලා තියෙනව නේද? ඔය ඇඟිල්ල තුවාල වුණේ ඒකනෙ. මෙහාට එනව."

අමීනා එසේ කියමින් ජෙසීමාගේ කන හරහා පහරක් ගැසුවාය. ඉන්පසු අබු ජෙසීමාට පහර දුන් අන්දම අනුකරණය කරන්නට විය. එය තවත් රණ්ඩුවකට මුල පිරීය. ජෙසීමාට දඬුවම් කිරීමේදී හරි වැරැද්දක් හෝ අරමුණක් නොවූ අතර කිසිම දෙයක ගැලපීමක් ද නොවීය. දූරිය කළ වරදට වඩා මවගේ සිත තුළ පැවැති කෝපය දඬුවම අඩු වැඩි වීමට බලපෑවේය. සමහර විට දූරිය පිරිමි දරුවකු නොවීම ගැන ඈ සිත තුළ වෛරයක්ද පැවතුණා යයි මට සිතේ. අමීනා සූරු නදිය වෙත ගොස් කිඹුලකුට එළුවකු පූජා කළ අන්දම ගැන ගෙදර උදවිය කළ කතාබහක් මට අසන්නට ලැබිණ. පූජාව බාර ගැනීම සඳහා කිඹුලා ගඟෙන් ගොඩට ආ බවක් ද කියවිණ. එය එසේ සිදුවූ විට තම බලාපොරොත්තු ඉටුවන බවට විශ්වාසය තැබිය හැකි වෙයි. විශේෂිත කිඹුලකුට ආහාර වශයෙන් මළකුණක් ලබාදීමෙන් ගැහැනියකට දරුඵල ඇති කිරීමට හෝ දරුවාගේ ගැහැණු පිරිමි බව තීරණය කිරීමට හෝ බලපෑමක් කළ හැකිද? මෙය මට නම් තේරුම්ගත නොහැක්කකි.

www.sinhalaelibrary.com 69

මේ සිදුවීම් ගැන සිතද්දී යළිත් මගේ සිත පුදුම සහගත දේවල් කෙරෙහි ඇදී යයි. එහෙත් ටික දවසක් ගතවෙද්දී මගේ සිත ඒ දේවල්වලින් ඈත් කිරීමට හැකි විය.

ඊයේ හවස මම වයික් සහ ගංගාව නම් පොත කියවීමට අබූට උදව් කළෙමි. අබූ පමණක් නොව මම ද එයින් ආස්වාදයක් ලැබීමි. පොතේ පිටකවරයේ අබූ තම නම ලියාතිබිණ. එයට පහළින් පාසලේ නමත්, ඊටත් පහළින් නයිජීරියාව හා ලෝකය යනුවෙන් ද සඳහන් කර තිබුණි. මමද වයික් මෙන් පුළුල් කේන්ද්‍රයන් ගැන සිතන්නට වීමි. මා කුස තුළ සිටින දරුවා, මම, බෙලෝ හා ඔහුගේ පවුලේ උදවිය, මගේ ගම, ප්‍රදේශය, රට, අප්‍රිකාව, ලෝකය, ග්‍රහලෝක, විශ්වය අභ්‍යවකාශයේ නොපෙනෙන ඉම ගැන සිතත්ම ඒවායේ විශාලත්වය ගැන මා සිත බියෙන් තැති ගත් අතර ඒ සමගම අප තුළ ඇති නොවැදගත්කම ගැනද සිතන්නට වීමි. මේ හැමදෙයකටම නියමයක් සැලැස්මක් තිබේද? ඒසේ නැතිනම් මෙය මහා පරිමාණයේ අහඹු සිදුවීමක්ද? මේවා කලින් නියම කරන ලද සැලැස්මකට අනුව සිදුවේ නම් මාත් මගේ දරුගැබත් කොතැනක කවුරුන් විය හැකිද? එහෙත් මෙය අහඹු සිදුවීමක් වූවහොත් මගේ සිතට මහා බියක් දැනෙයි. මා අනාථභාවයට පත්වෙයිද? මා අඳුරු වන ලැඟැබක හෝ අති විශාල බියකරු අවිච්ඡින්න අගාධයක අතරමං වෙයිද? අප ඇත්ත වශයෙන්ම අති සූක්ෂම ජීවීන් කොටසක් පමණක්ද? එහෙත් අනෙක් පසින් බලන විට එය එසේ සිදුවිය හැකිද? ජීවිතයේ සතුට හා ශක්තිය ස්පන්දනය වන අවස්ථා ගැන කුමක් කිවහැකිද? මුළු විශ්වයම එකම හුස්මකට හසුකරගත හැකි, ජීවිතයේ අනන්ත වූ ශක්තිය ඔබ තුළම ඇති බව ඔබට දැනෙයි.

මම මෙසේ ලියන්නේ පිස්සුවෙන් දැයි ඔබ සිතන්නේද?



## 21

**පුංචි** අඹ ලෙල්ලකට මෙතරම් ලොකු කලබලයක් කළ හැකිද යන්න එක අතකින් පුදුමයට කරුණකි. පෙර දින මා අඹ ලෙල්ලක් පෑගී ලිස්සා ගොස් නොවැටී බේරුණේ වම් මැණික්කටුවට මුළු බර දී බිත්තියට හේත්තු වීමෙනි. අඹ ලෙල්ල මෙතනට පැමිණ තිබුණේ කිසිදු හේතුවක් නැතිවය. එය අහඹු සිදුවීමක් පමණි. මගේ දොර කෙළින්ම කොරිඩෝරයේ අඹ ලෙල්ල වැටී තිබීම මහා අභිරහසක් වූවාසේම එය ප්‍රයෝගකාරී ක්‍රියාවක්ද විය. පාතිමා තම දරුවන්ට කෑ ගැසූ මුත් අබූ සොහොයුරෝ කිසිම අඹයක් නොකෑ බව දිවුරා කීහ. ඒ අනුව අඹ ගෙඩිය රසබලා තිබුණේ අමීනාගේ කාමරය පැත්තෙනි. අංගනයට විරුද්ධ පැත්තේ පඩියක් උඩ ඉඳගෙන බෝංචි ඇට සුද්ධ කරමින් උන් බෙලෝගේ නැන්දා

www.sinhalaelibrary.com 70

කොනකු ජේසීමා ඇගේ මවගේ කාමරයේ සිට අඹ පෙත්තක් අතැතිව පැමිණි බවට ඇහවීමක් කළාය. මා වැටෙන්නට ගිය අන්දමත්, මා දනට සිටින තත්ත්වයත්, මගේ මැණික්කටුව උළුක්කුවීමත් යන මේ සියල්ලම එකිනෙකට සම්බන්ධ මහා කලබගෑනියකට තුඩු දුන්නේය. මෙය බෙලෝගෙන් සැඟවිය නොහැකි විය. විශේෂයෙන්ම මගේ මැණික්කටුව රිදුම් දෙන්නට වූ බැවින් එයට බෙහෙත් කළ යුතු විය. ගෙදර සිටින සියලු දෙනා සමගම තරහ උපදවා ගත් බෙලෝ ප්‍රථම වරට මා සමඟ ද තරහ උපදවා ගත්තේය.

"දෙයියන්ගෙ නාමෙට දන්වත් බැරිද යන දිහාවක පරිස්සමින් බලාගෙන ඇවිදින්න"

ඔහු කෑගසන්නට පටන් ගත්තේ මා උවමනාවෙන්ම ඔහුට කරදරයක් දීමට හෝ ගබ්සාවක් කරගැනීමට සිතා වැටෙන්නට ගිය කලක මෙනි.

බිත්තියට ඉනිමඟක් හේත්තු කර තිබෙනු දුටු ඔහු ඊළඟට අබූට කෑගසන්නට විය.

"ඊළඟට අර ඉනිමගටත් නගීවි"

මා ඉනිමගකට නැග සිටිනු ඔහු කිසිවිටකත් දුටු බවක් මට මතක නැත. දරුවන්ගේ බෝලයක් වහළට ගිය අවස්ථාවකදී හෝ දෙකකදී මා ඉනිමගේ පෙති කිහිපයක් නැග්ගා මතකය. එය ද පාතිමා බලා සිටි අවස්ථාවකදී නොවීය. මේ සියලු සිද්ධීන් හා එක් වූ බියත්, මගේ මැණික්කටුවේ වේදනාවත් නිසා මගේ දෑසින් කඳුළු වැගිරෙන්නට විය.



"දන්නෙ නැද්ද මේ ගෙදර සේරම වැරදි කරන්නෙ, වෙන කවුරුවත් නෙවෙයි ඔයා"

අමීනා හයියෙන් කෑගසමින් අනිත් අයගෙන් පළිගැනීමට මෙන් ජේසීමාට දඬුවම් කරන්නට විය.

මා උවමනාවෙන්ම වැට්ටවීම සඳහා අඹ ලෙල්ල දමා ඇති බව පාතිමාගේ අදහස විය. මා මෝඩයකු නොවෙමැයි සිතමින් කොතෙක් තර්ක කළ ද මගේ සිත තුළ වූ බියත්, තිගැස්සීමත් පලවා හැරීමට නොහැකි විය. මා සිතන විදියට නගරයේ ඉදිකෙරෙන නිවස සම්බන්ධයෙන් සියලු තොරතුරු අමීනා දනගෙන ඇත.

ඈ මේ දිනවල ඇගේ ඇඳුම් පැළඳුම් හා සුවඳ විලවුන් සඳහා විශාල මුදලක් වැය කෙරෙන බවක් පෙනිණ. පාතිමා කියන අන්දමට එය බෙලෝ හැර වෙනත් අයකුගේ හිත සුව පිණිස යැයි කීමට මම හරිහැටි නොදත්තෙමි. එක්කෝ ඈ අලුත් නිවසේ ප්‍රථම බිරිඳ වීම සඳහා කැපී පෙනෙන්නට උත්සාහ දරනවා විය යුතුය.

මගේ මැණික්කටුවේ බිඳීම මා මුලින් සිතූ තරම් සුළු එකක් නොවීය. මැණික්කටුව බිඳී තිබූ හෙයින් ඒ සම්බන්ධයෙන් විශේෂිත පුද්ගලයකු වූ දේශීය වෛද්‍යවරයකු වෙත බෙලෝ මා කැටුව ගියේය. ඔහු ඉතාමත් දක්ෂ වෛද්‍යවරයකු බව මම අසා තිබුණෙමි. මැණික්කටුව හරිගැස්සීම ඉතාමත් වේදනාකාරී දෙයක් බව මා අසා තිබුණෙන් බෙලෝ සමග එහි යෑම වැළැක්වීමට මම උත්සාහ ගතිමි.

www.sinhalaelibrary.com 71

කායික වේදනාව ගැන බියට පත් මම මා ශික්ෂණ රෝහලට කැටුව යෑම සඳහා බෙලෝ උනන්දු කළෙමි. මා දේශීය රෝහලට ගිය ද මැණික්කටුව සුව කිරීම සඳහා රජයේ ශික්ෂණ රෝහලට යන්නට සිදුවන බව බොහෝ දෙනෙක් පැවසූහ. කෙසේ වුවද, මේ අතරතුර අතේ ඉදිමුම වැඩිවී අත මහත් සේ රිදුම් දෙන්නට විය.

මා කොතෙක් විරුද්ධ වුවද බෙලෝ මා අලේරුවල පිහිටි පැරණි වෛද්‍ය කේන්ද්‍රය වෙත කැටුව ගියේය. මා ශික්ෂණ රෝහල ගැන කී හැම වචනයක්ම ඔහු විසින් ඉවත දමන ලද්දේ එය ගැහැනුන්ගේ නිකම්ම කතාබහක් සේ නොසලකා හරිමිනි. ඔහු මේ ගැන මා හා කිසිදු කතාබහක් නොකිරීම ගැන මා තුළ කෝපයක් ඇති විය. කෙසේ වුවද තුවාල වී ඇත්තේ මගේ අතය. ඔහු මා කී දේ නෑසුනාක් මෙන් සිටියදී මගේ තරහ තවත් ඇවිස්සිණ. මා අලේරුවලට ගෙනයෑමට ඔහු මේසා දැඩි උනන්දුවක් දක්වන්නේ මක්නිසාද යන්න පවා මා සමග කිව නොහැකිද? මට හිතෙන විදියට ඒ පිරිමින්ගේ උද්ධච්ඡකමෙම ලක්ෂණයකි.

ඒ උදෑසන දේශීය වෛද්‍යවරයා ළඟට යෑමට අකමැති වූ මම එයට විරුද්ධව ගතු කියමින් සිටියෙමි. මගේ විරුද්ධත්වය පිළිගෙන ඔහු මා ශික්ෂණ රෝහල වෙත ගෙන යතැයි සිතුවද ඔහු මා කී දේ ඇසීමට එක බිඳකුදු නිහතමානී නොවීය. මගේ අදහස් කපා හෙලූ අන්දම ගැන මම තරහෙන් පිපිරුවෙමි.

"මේ ගෙදර කරන්න ඕන දේවල් තීරණය කරන්නෙ ඔබද මමද?"



උස් හඬක් නොනැගුවද ඔහු තම පුරුෂාධිපත්‍යයේ තේජස පෙන්වමින් කීවේය. එහෙනම් ඒක එහෙමමයි. මා කුමක් කියන්නද?

"ඔබ විතරක් නෙවෙයි මේව අපි දෙන්නම තීරණය කළ යුතුයි."

මා එසේ කිවයුතුව තිබුණද එය නිවැරදි නැතැයි මට පසුව හැඟිණ.

එක්කෙනෙක් නොව අප තුන් දෙනෙකුම සිටියදී එවැන්නක් සිදුවිය නොහැකිය. මගේ සිත තුළ කොතරම් තරහක් ඇවිළී තිබුණද යත් මම අලේරුවලට යනතුරු එක වචනයකුදු කතා නොකළෙමි. මැණික්කටුව හරිගැස්සීම කොතරම් වේදනාකාරී විය හැකිදැයි සිතීමට පවා මම බියවීමි.

වෙදගෙදර ගමේ අනෙක් නිවෙස් මෙන්ම කුඩා නිවහනකි. වෛද්‍යවරයා මතේ අත පරීක්ෂා කළේය. මිනිසුන් කිහිපදෙනෙක් සාමාන්‍යයෙන් ගමේ විදියට පැදුරුවල වාඩි වී සිටියහ. විනාඩි කිහිපයකට පසු ඇඳි පුටුවක් ගෙනවුත් මට එහි වාඩිවීමට සැලැස්විය. තව මොහොතකින් බෙලෝ සමග තවත් මිනිසුන් දෙදෙනෙක් පැමිණ මා පුටුවට තදකොට අල්ලා ගත්හ. හෙල්ලෙන්නටවත් නොහැකිවූ මම සිදුවන්නට යන්නේ කුමක්දැයි දැන සිටියෙමි. තත්පර කිහිපයකදී වෛද්‍යවරයා මගේ මැණික්කටුව හරිගැස්සුවේය. මොහොතකට වුවද වේදනාව දරාගත නොහැකිවූ මා පිස්සු වැටුණාක් මෙන් විය. සුදු පැහැති සණ මිශ්‍රණයක් අත පුරා තවරා මැණික් කටුව කෙළින් වන සේ ගසක පොතු දෙකක් තබා වැල්පටකින් ගැට ගැසුවේය. බෙහෙත් හේත් සඳහා වෛද්‍යවරයා කිසිදු මුදලක් නොගත්තේය.

www.sinhalaelibrary.com 72

"තව ලෙඩෙකුට බේත් සඳහා මේක තියාගන්න."

වෛද්‍යාචරයා මුදල් නොඉල්ලූ මුත් බෙලෝ එසේ කියමින් කිසියම් මුදලක් ඔහු අත තැබීය.

"දන් ඉතින් අපි ආපහු යමු"

බෙලෝ එසේ කියමින් මා මෝටර් රිය වෙත කැටුව ආවේය. ඒ වන විටද මා ලද අත්දැකීමෙන් වූ කම්පනය සිඳී ගොස් නොතිබිණ. ආපසු එන ගමනේදී මා ලද ප්‍රතිකාර ගැන කතා බහ නොකිරීමට බෙලෝ වග බලා ගත්තේය. මට ඒ ගැන ආපසු කතා බහ කිරීමට හෝ කංකෙදිරි ගෑමට අවස්ථාවක් නොවන පරිදි ඒ සියල්ල රහසක් සේ තබාගැනීම ඔහුට අවශ්‍යව තිබිණ. මා පුටුවේ වාඩිවීමට සලස්වද්දීම සිදුවන්නට යන දේ මීට කලින් මෙතැනට පැමිණ සිටි ඔහු දන සිටින්නට ඇත.

ආපසු එන ගමනේදී ඔහුගෙන් ඈත් වී රියේ දොරට හේත්තු වී වාඩි වූ මම නිහඬ බව රැක්කෙමි. ඒ මොහොතේත් තීරණ ගන්නේ මමද යන්න මගේ සිතේ රැව් දුන්නේය. ඒ සමගම මා කුඩා දරුවකු සේ සැලකීම ගැන මගේ සිතේ වූයේ අමනාපයකි. ඔවුන්ගේ අදහස අනුව අප වැනි ගැහැනුන්ගේ අදහස් කිසිසේත් ගණන් නොගත යුතුය.

අප සැහෙන දුරක් ආපසු පැමිණිය යුතු විය. කිලෝමීටර් කිහිපයක් පසුකරද්දී බෙලෝ මා දෙස හොරෙන් බලන බවක් පෙනිණ. වේදනාවත්, කම්පනයත් සිතින් අතුරුදන්ව තිබූ හෙයින් මම කඳුළු නවත්වා ගැනීමට මහා ප්‍රයත්නයක් දැරීමි.

"ඔබ ශික්ෂණ රෝහලේ වෛද්‍යාවරයා වෙත එක්ක නොගිය



හින්ද තවමත් මං එක්ක තරහද?"

හුදකලා ස්ථානයක රිය නැවැත්වූ ඔහු මා ඔහු වෙතට ඇද ගනිමින් ඇසුවේය.

"මේ වෛද්‍යාවරයා හොඳද නැද්ද කියල මං දන්නෙ කොහොමද?"

මම ඔහුට තුරුළු වෙමින් කීවෙමි.

"මං හිතුව ඔබ දන්නවය කියල. ශික්ෂණ රෝහලේ ඉන්නෙත් එකම එක්කෙනයි. එයත් මේ දවස්වල නිවාඩු බව මට දනගන්න ලැබුණා."

මම කිසිවක් නොකීවෙමි.

"හුඟක් රිදුනද?"

ඔහු මගේ අත හොඳින් පිරිමදිමින් ඇසුවේය. කුඩා දරුවකු මෙන් මා සනසනු ලබද්දී මගේ දෑසින් කඳුළු වැගිරෙන්නට විය. මම එය වැළැක්වීමට උත්සාහ නොගත්තෙමි.

"මීට වැඩිය හුඟක් අමාරු ලෙඩ්ඩු මේ වෛද්‍යමහත්තය සනීප කරල තියෙනව. ඒකනෙ මම ඔයා එක්ක ගියේ. ඔයාට රිදවන්න මට ඕනවුණා කියල හිතන්න එපා...."

කෙසේ වුවද මා අලේරුවලින් ආපසු පැමිණියේ අත සුවපත් කරගෙනය. ඒ වනවිට බෙලෝ කෙරෙහි තිබූ කෝපය නිවී ගොස් තිබිණ. හැමදෙයක්ම ඉතා හොඳින් සිදුවී තිබුනද ගැහැනුන්ගේ අදහස් වැදගැම්මකට නැති හිස් ප්‍රලාපයක් සේ නොසලකා හැරීම ගැන මගේ සිත එකඟ නොවීය.

# 22

සුළු අසනීප තත්ත්වයකින් පසු බාරෝ මාමා පසුගිය සතියේ මිය ගියේය. මට මිතුරකු නැතිවිය.

ඒ සැන්දෑවේ බියකරු වැලි කුණාටුවක් හමා ආවේය. පොළොවෙන් හමා ගත් සිහින් දූවිලි තට්ටු ගෙයි හැම අස්සක් මුල්ලක් නෑරම පැතිරී ගියේය. සුළඟ විසින් අඹරවා ගත් පුංචි ලෝහ කැබලි එහෙ මෙහෙ වදිමින් පියාඹා ගියේ පුංචි පුංචි මිසයිල මෙනි. රජයේ සේවකයන් පදිංචිව සිටි ප්‍රදේශයන්හි නිවෙස්වල වහලවල් දෙකක් ගැලවී බිම ඇද වැටුණි. එක මොහොතකදී දඹ හිරු රැසින් අහස බැබලී ගත් අතර, තව මොහොතකදී දූවිලි උකහාගත් වැසි වළාකුළින් ඉරු වැසී ගියේය. සුළඟ හමා ආවේ කොතැනකින්දැයි සිතා ගැනීමට



පවා බැරිතරම්ය. එක් මොහොතකදී නිසොල්මන් වූ අහස්තලය තව මොහොතකදී අකුණු සැරින් හා විදුලි සැරින් පුපුරා ගියේය. ගස් ඇඹරෙමින් ඒ මේ අත වැනුණේ පොළවෙන් ඉදිරී බිම ඇදවැටීමට උත්සාහ දරන්නාක් මෙනි.

නිතරම වාගේ ඇදුම රෝගයෙන් පෙළුනු බාරෝ මාමාගේ රෝගය උත්සන්න වූයේ ඒ මොහොතේය. එය බලා සිටීමට බැරි තරම් විය. මෙයට පෙර කිසිම අවස්ථාවක රෝගය මෙතරම් උත්සන්න නොවූ බව හැමදෙනම පැවසූහ. හැම හුස්ම බිඳක්ම පහළ හෙළද්දී ඇදුමේ වේදනාව සිරුරට දරා ගැනීමට බැරි තරම් විය. ඔහු ඒ මොහොතේම රෝහලට ගෙනයාම සඳහා වාහනයක් සොයා ගැනීමටද නොහැකි විය. පසුව වාහනයක් සොයා ගෙන ඔහු රෝහලට ගෙන ගියද එන්නත්කිරීම සඳහා අවශ්‍ය බෙහෙත් රෝහලේ නැති බව දන ගන්නට ලැබිණ. පිටතින් එන්නත රැගෙන රෝහලට ගෙන එන විට ඔහු මියගොස් තිබිණි.

ඔහුගේ දේහය නිවසට ගෙන එන අවස්ථාවේදී ගැහැනු අපි අපේ කාමරවලට වී සිටියෙමු. අවමංගල කටයුතු සම්බන්ධයෙන් ගැහැනුන්ගේ කිසිදු සම්බන්ධයක් නොවීය. බාරෝ මාමාගේ අසල්වැසි නෑදෑයන්ට මේ ගැන දන්වන ලද අතර එදින රාත්‍රියේ මිනිය නහවා පිළියෙල කොට පසුදා උදෑසනම මිහිදන් කරන ලදි.

මට ඔහු පමණක් නොව ඔහු විසින් කියන ලද විවිධ මාදිලියේ කතන්දර ද නැතිව ගියේය. ඔහු මා සමග වෛද්‍යවරුන් බෙහෙත් නිෂ්පාදකයින් කට්ටඩියන් හා මන්ත්‍රකාරයින් ගැන කොයිතරමක් කතන්දර කියා ඇත්ද?

www.sinhalaelibrary.com 74

ඔහු වරක් ඔහුගේ නෑදෑ ගැහැනියක ගැන මා සමඟ කියා තිබුණි. සතියේ දින හයක්ම සාමාන්‍ය ලෙස කටයුතු කරන ඇය එක් දිනක් මන්තරකාරියක බවට පත්වෙයි.

හැම සතියකම පොළ දිනයට දින දෙකකට පසු ඇ මේ කටයුත්ත පටන් ගන්නා අන්දම ඔහු විස්තර කළේය.

"එකම එක දවසකට එහෙමද?" මම ඇසුවෙමි.

"ඔව් ඒ දවසට විතරයි. අනිත් දවස්වලදී ඈ ගෙදර වැඩපල කරන, හිනාවෙන, කතා බහ කරන ළමයින් හා රණ්ඩු අල්ලන සාමාන්‍ය ගැහැනියක්"

ඒ විශේෂ දවසෙ ඈ හරියටම මොනවද කරන්නෙ?"

"උදෙන්ම නැගිට්නව. කවුරුවත් එක්ක කතාබහක් නැහැ. මේ දවසෙදි ඇගේ ඇස් දෙකත් හරි අමුතුයි. ඈ කැලේට ගිහින් එක එක ජාතියෙ බෙහෙත් කොළ, අල, මුල් එහෙම ගේනව. ඒව කපල කොටල වෙනස් වෙනස් කසාය ජාති හදනව. මේ සේරම කරල ඉවර වෙනකන් ඈ කිසිකෙනෙක් එක්ක වචනයක් වත් කතා කරන්නෙ නැහැ, ඒ දවසට ගෑනු මිනිස්සු එනව මතුරපු වතුර, ඉනාබේත් ඒ වගේම වශී ගුරුකම් ඉල්ලගෙන."

"ඒව කරන්නෙ ශාන්තියක් වශයෙන්ද නැත්නන් විනයක් වශයෙන්ද?"

මම ඇසුවෙමි.



"මං හිතන්නෙ දෙපැත්තටම. හුඟක් පෝසත් මිනිස්සු එනව එයාලගෙ හිත බැඳගත් ගෑනු ළමයි දිනාගන්න ජපකරපු වතුර හොයාගෙන."

බාරෝ මාමා කීවේ කෝලා විටේ කෙළපහරක් මිදුල පුරා යවමිනි.

"ඈ ඒ වෙනුවෙන් මුදලක් ගන්නවද?"

මම ඇසුවෙමි.

"කෝබා තුනකට වැඩිය එක කාසියක්වත් ගන්නෙ නෑ"

"ඇයි කෝබා තුනක් විතරක් ගන්නෙ?"

"කවුද දන්නෙ. එයාට බලය දීපු අය අවසර දීල තියෙන්නෙ ඒ මුදල විතරක් ගන්න වෙන්න ඇති."

ඔහු ඒ සියල්ල කීවේ හේතු සහිත ලීලාවකිනි. එහෙත් ඒ සියල්ල ප්‍රතික්ෂේප කිරීමටත්, ඒ වැරැදි බව ඔප්පු කිරීමටත් ඇ‍ා අවශ්‍යව තිබුණ ද මම එහි සත්‍ය අසත්‍යභාවය පිළිබඳ කිසිදු වාද විවාදයකට නොඑළඹුනෙමි. නොදන්නා තැන්වලින් පැන නැගුණු මිත්‍යා බලවේග ගැන කියාගත නොහැකි බියකින් පසුවූ මමද ඒවාට මැදිවී වේදනා විඳින්නට වීමි. විකෘති දරුවන් පිළිබඳ දසුන්වලින්ද ගබ්සාවන් හා කලලයන් ලෙසින් දරුවන් විනාශවී යන අන්දම පිළිබඳවද මගේ මතකය පිරී තිබිණි.

දැන් බාරෝ මාමා මියගොස් ඇති බැවින් තවත් කිසිවක් මට ඔහුගෙන් අසා දැනගත නොහැක. ඔහු මියගියේ සිකුරාදා

www.sinhalaelibrary.com 75

දිනකය. සිකුරාදා දිනවල මිය යන අය දෙව්ලොව යන බවට මතයක් පවතී. මා හිතන විදියට ඔහු සමාදානයේ සැතැපෙන්නට ඇත. ඔහු මියයන විට ඔහු සමග පවුලක් නොවීය. සීතල තෙත් පොළවේ මිහිදන් කළ ඔහුගේ දේහය ගැන මම සිතන්නට වීමි. මරණයේ පාළුව හා හුදකලාව දැනෙද්දී මගේ ගත වෙව්ලන්නට විය.

කුරානය පවසන අන්දමට මරණය අවසානය නොවේ. අප කරන සියලුම ක්‍රියාවලට ප්‍රතිවිපාක ලැබේ. ඒවායින් පරමාණුවක් තරම් පුළු කොටසක් වුවද ගණන් ගනු ලැබේ. සියල්ල වැනසී ගියද මිනිසුන් යළි පුනර්ජීවනය වේ.

පරමාණුවක් තරම් පුංචි දෙයක් වුනත් අඹලෙල්ලක් තරම් වුවත් කම් නැත. පව් කළ අයගේ සිතේ මහා ගින්දරක් මහා කලබගැනියක් ඇතිවනු නිසැකය.

බාරෝ මාමා පව් නොකළ බව මට විශ්වාසය.



## 23

**යළි** වැස්ස පටන් ගෙන තිබේ. පසුගිය සති කිහිපය පුරා පැවති මහා වරුසාව අපේ පුංචි එළවළු පාත්තිය තුළ මහා පුදුමයක් සිදුකර ඇත. පැළැටි සියල්ල විශාලවී දළුලන්නට පටන්ගෙන තිබේ. ඒවා හොඳින් වැඩෙන බව ඇත්තටම අපට දැකගන්නට තිබේ. මිනිස්සු තම ගොවිපළවලට වී කඩිසරව වැඩ කරති. උදේ පාන්දරම උදළු කර තබාගත් මිනිස්සු ගොවිපළවලට ඇදෙනු දැකිය හැක. මගේ කාමරයේ උස ජනේලය ළඟට ගිය විට මට මෙනේරි හා තල හේන් පෙනේ. එහෙත් මට ජනේලයෙන් පිටත බැලිය හැක්කේ පුටුවක් තබා එයට නැග ගතහොත් පමණි. සමහර ගොවියන් තම ගොවිපොළවලට ගියේ යන්ත්‍ර මත නැග ගනිමිනි. අප බොහෝ දෙනෙක් මෙසේ යන්ත්‍ර යයි හඳුන්වන්නේ යතුරුපැදිවලටය.

www.sinhalaelibrary.com 76

අඹ ලෙලි සිද්ධියෙන් පසු මම බොහෝ පරිස්සම් වීමි. ජනේලයෙන් පිටත බැලීම සඳහා පුටුවකට නැගීමටද මම බියවීමි. සමහර හැන්දෑවක ඇඳිරි වැටුණු පසු මම දරුවන් සමග ඇවිදින්නට ගියෙමි.

ඊයේ ජස්ටිනාගෙන් ලිපියක් ලැබිණ. දරුවකු කුස පිළිසිඳ ගත් පසු මගේ හැඟීම් දැන ගැනීමට ඇයට අවශ්‍යව තිබිණ. තවමත් මගේ කුස එතරම් වැඩී නොතිබිණ. පළමු දරු පිළිසිඳ ගැනීමේදී කුස එතරම් විශාල නොවන බව පාතිමා පැවසුවාය. කායික වශයෙන් මා තුළ හොඳ සනීපයක් තිබිණ. මානසික වශයෙන්ද ඒහා සමානම සුවදායී තත්ත්වයක් මා තුළ විය. අතෘප්තිකර දේවල් ගැන නොසිතන්නට මා කොතරම් වෙහෙසක් දැරුවද මගේ සිත ආපසු ඒ සිද්ධීන් ගැනම සිතන්නට වෙයි. එහෙත් භයානක කිසිවක් සිදු නොවේවායි මම ප්‍රාර්ථනා කළෙමි.

එය නිරන්තරයෙන්ම මා බියට පත් කිරීම නිසා ඇතිවූ බියජනක හැඟීමකි. මා උවමනාවට වඩා සිතන බව ජස්ටිනා පවසයි. ඈ කියන දේවල්වලද කිසියම් සත්‍යයක් ඇතැයි මට සිතේ. මා කනගාටුවෙන් සිටීම දරුවාට බලපාන බව සිතන්නට වෙත්ම ඒ ගැනම සිතා යළිත් මම බියට පත්වීමි. මා ටික ටික කියවන්නට පටන් ගත් මුත් ඒ කෙරෙහි මගේ සම්පූර්ණ අවධානය යොමු කිරීම අපහසු විය.

ඊයේ බෙලෝ මා නාරිවේදී වෛද්‍යවරයකු වෙත රැගෙන ගියේය. දැන් මගේ කුසට පස් මාසයක් අහවරවී ඇති අතර දරුවාගේ චලනයන් මට දැනෙන්නට විය. මා පරීක්ෂා කළ වෛද්‍යවරයාට හැම දෙයක්ම නිවැරදි ලෙස පිහිටා ඇතැයි පැවසිය හැකිදැයි ඒ අවස්ථාවේදීත් මම සිතන්නට වීමි. ඔහුට කිව හැක්කේ දරුවාගේ නාඩි වැටෙන බවත් දරුවා කුස තුළ



නියම අන්දමින් සිටින බවත් පමණකැයි මට සිතේ. දරුවගේ කකුල්වල ඇඟිලි හයක් ඇත්ද, නාසය නියම අන්දමින් පිහිටා ඇත්ද, එවැනි තවත් සිය ගණනක් දේවල් වැරදියට පිහිටා ඇත්ද යන්න ඔහුට පැවසිය හැකිද? එසේම ඔහු ඉපදී මාස ගණනක් නොව අවුරුදු කිහිපයක්ම යනතුරු ඔහුට නියම ආකාරයේ පෙනීමක් හෝ ඇසීමක් ඇත්ද යන්න දැනගත නොහැක. නියත වශයෙන්ම ඔහුට සාමාන්‍ය බුද්ධියක් ඇත්ද යන්න වුවද දැනගත හැක්කේ ඉපදී අවුරුදු කිහිපයක් ගතවූවාට පසුවය. දරුවකු බලාපොරොත්තුව සිටින හැම මවක්ම මේ අන්දමින් සිතනවා විය හැකිද? මා ගැන සිතනවිට දරුවාගේ නියම තත්ත්වය දැක ගන්නාතුරු මගේ සිතට සැනසිල්ලක් නැත.

දරුවාට "ඔහු" යනුවෙන් ඇමතීම ගැන ජස්ටිනා මට හිනැහුණාය. කාන්තා අයිතිවාසිකම් හා සමානත්වය ගැන කතා කරන මම ඒ ගැන නොසිතා තවමත් පුරුෂ සර්වනාමවලට වැඩි කැමැත්තක් දක්වන බව ඈ පවසන්නීය. ඒත් කොහොමද මා දරුවා අමතන්නේ "ඈ" කියන්නද? "ඌ" කියන්නද? "ඌ" යනුවෙන් ඇමතීමට මගේ කිසිදු කැමැත්තක් නැත. "ඈ" යනුවෙන් ඇමතීමේද නොගැලපෙන බවක් තිබේ. ඇත්තවශයෙන්ම මට ඔහුට "ඒ පුද්ගලයා" කියා හැඳින්වීමද කළ නොහැක. "පුද්ගලයා" කෙල්ලක් වුවහොත් එය මගේ සතුටට කරුණකි. ඒත් බෙලෝ කොල්ලෙක් ගැන සිතන බව සහතිකය. දුවෙක් වුවහොත් විශාල දෑවැද්දක් එකතු කරගත හැකි බව මම බෙලෝ හා පැවසීමි.

"දුලගෙන් ලැබෙන දෑවැද්ද නැතිවට මට සල්ලි තියෙනව"

බෙලෝ අමනාපයෙන් මෙන් පැවසීය.

www.sinhalaelibrary.com 77

# 18

අගෝස්තු මාසය වන විට සිරිත් පරිදි මහ වැසි වසින්නට වූ අතර පෝච්චිවල මල් ගස් දලු දා මල් පිපෙන්නට විය. එහෙත් මා හිටවූ ඇට හොඳින් වැඩුනද ඒවායේ මොකක්දෝ අමුත්තක් තිබිණි. ගස් වැල් වුවත් අවසානයේදී ඵල දරන්නේ කොතරම් වෙනස් ආකාරයකින්ද? සමහරක් සරු ලෙස උස යන්නේ ආඩම්බර ලීලාවකිනි. සමහරක් විකෘති ලෙස වක්වී ඇදවී ගොස්ය. එහෙත් ඒ ගස් ද වැඩෙමින් පවතී. ඒ එසේ වුවද සමහරක් රෝග කාරකයන්ට අසුවී ඉක්මනින්ම මියැදෙයි. පොළව වැස්ස හා සංයෝග වන අන්දමත් පැළෑටි දලුලා වැඩෙන අන්දමත් දෙස බලා සිටිද්දී මගේ සිත එහි ආශ්චර්යමත් බවින් වශීවී ගියේය. තණකොළ හැමතැන වැවී තිබිණි. කෑමට ගන්නා විවිධ වර්ගයේ පලා වර්ග සරු පස මත පැළවෙමින් තිබිණි. එක රියෙන් තක්කාලි පැළ මතුවී තිබිණි. කුස්සියෙන් ඉවත දැමූ කුණු සමග ඒ තක්කාලි ඇට තිබෙන්නට ඇත. මුළු රියක් පුරා වැසි වැටුණු හිමිදිරියක තෙත පොළවෙන් පැළයක් උදුරා දැමූ විට ඒ පැළය සමග සරු පස් ගොඩක් ඉවතට ඇදී එයි. හමටාන් ප්‍රූළං හැමූ කාලයේ පැවති තද වියළි පොළවට වඩා කොතරම් වෙනසක් සිදුවී ඇත්ද? මුළු පළාතම කොළ පැහැයෙන් බබලයි. මේ ඇහිරුණු බලකොටුවට වඩා අපට සැබෑ මිදුලකින් යුත් වෙල් ඉපනැල්ලට ඇරුණු නිවසක් ඇත්නම් කොතරම් චමත්කාරජනකදැයි මම සිතන්නට වීමි.



මගේ හැසිරීම් හා ක්‍රියාවන් මුළුමනින්ම වෙනස්වෙමින් තිබිණි. බිම අත තබා ඉඳගැනීම හෝ ඉඳගත් [illegible] නැගිටීම තරමක් අපහසු කාර්යයක් විය. පුංචි එකා ගමන් කුස තුළ සිටින බව අඟවමින් දෙන දැහලිලි පහරවල් මගේ සිතට ප්‍රීතියක් ගෙන එයි.

"අනේ දෙවියනි ඔහුට කිසි වරදක් සිදු නොවේවා"

මම උදේ හවස ප්‍රාර්ථනා කළෙමි. ඔහු ඉපදෙන්නට ආසන්න වෙද්දී මගේ සිත තුළ වූ වගකීම වැඩිවූ අතර ඒ සමගම සැඟවුණු බිය යළි මතුවන්නට විය.

දින දෙකකට පෙර නාන කාමරය පිටුපස වූ පඩිපෙළ අසල පොළවෙහි මඳ වෙනසක් දක්නට තිබිණි. කිසිවකු හදිසියේ වළක් හාරා වැසුවාක් වැනි පෙනුමක් එහි විය. සමහරවිට කලින්දා සවස ළමයින් මෙතන සෙල්ලම් කළා විය හැක. එහෙත් සාතිමාට මෙය අබිරහසක් මෙන්ම ශෝකජනක සිද්ධියක් විය.

www.sinhalaelibrary.com 78

"ඔබ අහල නැද්ද වින කරන්න ඕන පුද්ගලයා යන එන තැන්වල පොළව යට මේ හූනියන් වළලන බව"

පාතිමා එසේ කියන තුරු එබඳු සිතුවිල්ලක් මා සිත තුළ ඇති නොවීය. මේ අවස්ථාවට ප්‍රථම පාතිමා මගේ ආරක්ෂාව සඳහා යන්ත්‍රයක් දම්මවා ගැනීමට මා යකැදුරකු වෙත කැඳවාගෙන යෑමට කිහිපවරක්ම උත්සාහ කළාය. ඇ අදහස් කළේ මෙබඳු බලවේගයන්ගෙන් බේරීම සඳහා තමන් වෙතද කිසියම් බලවේගයක් තිබිය යුතු බවය. කිහිපවරක්ම පාතිමා මේ ගැන මට කියා තිබුණද මේ අවස්ථාවේ ඇ මේ ගැන මට බලකර සිටියාය.

"මං ඔබව එතනට එක්ක යනවා. ඒ මනුස්සයා හරි හොඳයි. ඔබව ඕන දෙයකින් ආරක්ෂා කරන්න ඔහුට පුළුවන්" ඇ කීවාය.

"මං දන්නෙ නෑ. අපි කොහොමද දන්නෙ මොනවත් කරලද කියල" මම කීවෙමි.

"කරලද නැද්ද කියල හරියට දැනගන්නකන් ඔබ බලන් හිටියොත් පරක්කු වැඩියි"

ඇ ඒ වචන පැවසුවේ දැඩි නොඉවසිල්ලකිනි.

මගේ නාඩි වැටීම නැවතුනාක් මෙන් විය. මා කුමක් කරන්නද? මා අසා තිබූ කතන්දර සියල්ල අවතාර හොල්මන් මෙන් මා පසුපස ඇදෙන්නට විය. මගේ ඇඟ ගැහෙන්නට වූ අතර හිස කකියන්නට විය.



දරු උපත පමා කිරීමටත් දරු ගැබේ වැඩීම නැවැත්වීමටත් දරු ගැබ විනාශ කිරීමටත් මෙසේ සාප කළ හැක. ඒ සාපය කලට වේලාවට ඉවත්කර නොගත හොත් ආබාධිත දරුවකු ඉපදීමට හෝ ගබ්සාවක් සිදුවීමට ඉඩ තිබේ. මෙවැනි දේවල් බොහෝවිට සිදුවන බව බොහෝ දෙනා පවසති. පාතිමා මා කිසියම් ස්ථානයකට රැගෙන යන බව පවසමින් බාරයක් වූවාය.

එහෙත් මම අන්දුන් කුන්දුන් වීමි. කුමක් කළ යුතුදැයි මම නොදත්තෙමි. මේ මන්ත්‍රකාරයන් අපව ආරක්ෂා කරන බව පවසමින් මුදල් ගරා ගන්නා කොටසක් බව සමහරු පවසති. ඔවුහු සිදුවන්නට යන විපත්තිය ගැන අතිශයෝක්තියෙන් පවසා අපෙන් හැකි තරම් මුදල් කඩා ගනිති. බියකරු හැඟීම් මා වෙලා ගනිද්දී මගේ සිත මේ දෙසට ඇදී ගිය ද මේ දුෂ්ට පාපී චක්‍රයට මැදිවීමට මා තුළ වූයේ දැඩි අකමැත්තකි.

එක්වරක් හෝ මම මේ බියකරු සත්‍යය පිළිගෙන එයට අවශ්‍ය ප්‍රතිකර්ම කරන්නට පටන් ගතහොත් මට එයින් ගැලවීමක් නැත. මා එක් පියවරක් හෝ ඉදිරියට තැබුවහොත් මා මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන මේ දේවල් මුළුමනින්ම පිළිගත්තා වෙයි. කෙනකුට අතට අත දීමෙන් තව ඔහුගේ ජීවිතයෙන් කොටසක් අන්තර්ධාන කිරීමට පවා හැකි බව පිළිගන්නා මිනිසුන් සිටින රටක මේ අද්භූත බලවේගයන්හි ඇති ශක්තිය මා මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන්නේ කෙසේද? මේ දේවල් ගැන අසා විදේශිකයන් සිනා පහළ කරතත් මේවා අපට සිනාසීමට කරුණු නොවේ. සමහරු මේ පාපී ක්‍රියාවන් සඳහා පිල්ලි යොදා ගන්නා බවද නයිජීරියානුවෝ පවසති.

www.sinhalaelibrary.com 79

මේ සිද්ධියෙන් පසු මගේ මව මා බැලීමට පැමිණියාය. ඈ පැමිණි මොහොතේම පාතිමා ඇය සමඟ මහත් උනන්දුවකින් කතා කරන්නට වූවාය. ඒ කතාවේ ප්‍රතිඵලය වූයේ මා මගේ මව සමඟ ගොස් යකැදුරෙකු ලවා මට ආරක්ෂාවක් දමා ගත යුතු බවය. ආරක්ෂාව සඳහා වූ පූජාවටත්, බාරවීමටත් අවශ්‍ය දේවල් අඩංගු දිග ලැයිස්තුවක් යකැදුරා විසින් සපයන ලදී. (ඒ සියල්ල යකැදුරාගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා වන බව මම විශ්වාස කළෙමි.) මේ සඳහා කොතරම් මුදලක් අවශ්‍යවේද යන්න මට ප්‍රශ්නයක් විය. සිදුවන්නට යන දෑ ගැන බෙලෝ දන සිටියා දැයි මම හරිහැටි නොදත්තෙමි. එහෙත් ඔහු දනගන්නට ඇත. මුලදී ඔහු මා මගේ දෙමවුපියන් සමඟ නැවතීමට යෑම ගැන වැඩි කැමැත්තක් දක්වූයේ නැත. එහෙත් පසුව ඔහු ඒ ගැන එකඟවී එක් උදෑසනක අපව ගෙදර ගෙන ගොස් ඇරලුවේය. අමීනාගේ නොරිස්සුම් සහගත දෑසින් ඉවත් වී සිටීමට ලැබීම සුභවාදී වෙනසක් විය. එය එසේ වුවද මට මගේ සොහොයුරියන් ගැන හෝ මගේ මව ගැන විශ්වාසයක් තැබිය නොහැකි වූ අතර මගේ සිත තුළ හොල්මන් කළ බිය මට දරාගත නොහැකි තරම් විය. මට එය වචනවලට පරිවර්තනය කිරීමට ද නොහැකි විය. එය මගේ ජීවිතයට කෙසේ බලපාන්නේ ද යන වග මගේ මවට අවබෝධකර දීමට පවා මා ළඟ වචන නොවීය.

මගේ පියා තුළ මා කෙරෙහි ඇති බැඳීම නිසා මම බෙහෙවින් ඔහුට සමීප විමි. එකට ඉඳගෙන එක බත්හැලියෙන් කෑමත් ගමේ ඕපාදූප කතා ඇසීමත් ප්‍රීතිජනක කරුණක් විය. ඒ සමගම හොඳ ආරංචියක් මට අසන්නට ලැබිණි. මගේ සොහොයුරිය වූ අසුමී ආපසු තම ස්වාමියා වෙත ගොස් තිබිණි. පාසල්වලින් ගාස්තු අයකිරීමට ආරම්භ කොට තිබූ



බැවින් බොහෝ පිරිමි ළමයි පාසල් ඇරගිය අතර මූසා නේවාසික පාසලකට ඇතුළත් කර තිබිණි. එහෙත් ගැහැනු පාසල්වල මුදල් අයකරනු නොලැබිණි. ඒ කාන්තා අධ්‍යාපනය ඉහළ නැංවීමේ අරමුනිණි.

පෝලියෝ රෝගය වැළඳුණු අයිරෝ යළිත් මට දකගන්නට ලැබිණි. අවුරුද්දකට පමණ පෙර බෙලෝ අපේ මිදුලට පැමිණි අවස්ථාවේදී ඔහු මා සමඟ බැබොබ් ගස මුල කතාකරමින් සිටියදී අයිරෝ කොරගසමින් අප ඉදිරියට පැමිණි අන්දම මට සිහිපත් විය. එය අසුභ පෙරනිමිත්තක් සේ මගේ සිතේ ඇඳී තිබිණි. එය සිතින් අතුගා දැමීමට මා ගත් සෑම ප්‍රයත්නයක්ම ව්‍යර්ථ විය.

මගේ පියාගේ නිවසේ මා දුටු එකම ප්‍රශ්නය වූයේ මගේ දෙවැනි අම්මා යළිත් වරක් ගැබ්ගෙන තිබීමයි. මා ඒ වනතුරු සිතා සිටියේ දරුවන් වැදීම අප නිවසින් අභාවර වී ගිය සෙයකි. එහෙත් ඒ සිතුවිල්ල අතාර්කික බව මට දන් පැහැදිලි වෙයි. මූසාගේ මවගේ වයස අවුරුදු තිස් ගණනක් වන අතර මගේ පියා බෙලෝට වඩා වැඩිමහල් වූයේ අවුරුදු කිහිපයකිනි. දෙවියන්ගේ ආශිර්වාදය අනුව මගේ පියාට තම දෙවැනි මුණුපුරාට වඩා වයසින් බාල පුතකු හෝ දුවක ලැබෙනු ඇත. අපේ පවුල්වල මෙය අසාමාන්‍ය සිද්ධියක් නොවේ.

www.sinhalaelibrary.com 80

## 25

**දින** කිහිපයකට පසු මම ආපසු බෙලෝගේ නිවසට පැමිණියේ ආරක්ෂාව පතා තුලක එල්ලූ සුරයක් ද කර පැළඳගෙනය. මා ආපසු පැමිණෙන විට බෙලෝ ගෙදර නොසිටියේය. දින කිහිපයකට පෙර මට ඔහු අවසානවරට මුණ ගැසුණේ මා මගේ පියාගේ නිවසට ගෙන ගොස් ඇරලූ අවස්ථාවේය. මේ මොහොතේ පාතිමා ද ගෙදර නොවීය. ඈ ඇගේ අසනීපයෙන් පසුවන නැන්දා කෙනකු බලන්නට ගොස් තිබිණි. ගෙයි කොතැනක හෝ අමීනාද පෙනෙන්නට නොවීය. සමහරවිට ඈ ඇගේ කාමරයේ සිටිනවා විය හැක. මා පැමිණිවිට මා පිළිගත්තේ බෙලෝගේ නැන්දාය.

දහවල් වනවිට මුළු නිවසම නිහඬ බවේ ගිලෙන්නට විය. මට මහා කාන්සියක් දැනිණ. මා හැම දෙයකින්ම අයින්



කළාක් වැනි පුදුම හැඟීමක් මා තුළ ඇති විය. මගේ පියාගේ ගෙමිදුලේ තිබූ උණුසුම පවා මේ නිවස තුළ නැතැයි මට සිතිණ. මට මහන්සියක් මෙන්ම නිදිමතක් ද දැනිණ. නිවස පුරා පැතිරුණ නිහඬ බවට කන් දෙමින් මම මගේ ඇඳේ වැතිරී වෙහෙස නිවාගැනීමට උත්සාහ දැරීමි. ගෙදර මිනිස්සු සේරම කොහේ ගිහින්ද?

මම මගෙන්ම අසා ගනිද්දී මගේ සිත නොඉවසිල්ලෙන් හා වේදනාවෙන් පිරෙන්නට විය. ටික වේලාවකට පසු මට පාතිමාගේ කටහඬ ඇසිණි. එය මගේ සිතට පුදුම අස්වැසිල්ලක් විය. අසල්වැසි නිවසකට ගොස් තිබූ ඈ තම දරුවන් ද සමඟ ආපසු පැමිණ සිටියාය. පාතිමාට පැරණි ඕපාදූප කතා කරන්නට අවශ්‍ය වූ විට ඈ ගොඩවදින නිවෙස්වලින් මේ එකකි. උණුසුම් ලෙස මා පිළිගත්ත ද ඈ තුෂ්ණිම්භූතව ගිය බවක් පෙනිණ. මට කියන්නට සූදානම් වූ මොකක්දෝ රහසක් ඈ තුළ නලියමින් තිබිණ. මගේ සුවදුක් විමසීමෙන් පසු ඈ මගේ ඇඳ මත ඉඳගත්තේ කෙටි ගමනින් පසු ඇති වූ විඩාවෙන් හති දමමිනි. සාළුවෙන් මුහුණ පිසදැමූ ඈ සුසුමක් හෙළුවාය. දරුවෝ අප වෙතින් ඈත්වී ගියහ. මම ඉවසිලිමත්ව බලා සිටියේ ඈ තුළ වූ ගුප්ත පෙනුම ගැන පුදුමයට පත්වෙමිනි.

"අර ගෑනි ගියා"

ඈ කීවාය. ඈ ගෑනි යයි කීවේ උපහාසාත්මක ස්වරයෙනි.

"මොන ගෑනිද?"

මම ඇසුවෙමි.

www.sinhalaelibrary.com 81

"ඔබේ ආදරණීය සහෝදරී අමීනා"

ඈ හඬ නගා සිනාසුණේ ද්වේෂ සහගතවය. ඇගේ සිනාව ගේ පුරා රැව්දුන්නේය. දොරුව දිගේ ඇදුණු හූනකු මොහොතකට නැවතී නොපෙනී ගියේය.

"කොහේද ගියේ? මොකද වුණේ?"

"මං දන්නෙ නෑ මොකද වුණේ කියල. ඒත් ඔහු හදන්නෙ ඈව දික්කසාද කරන්න. ඉතින් ඈ ඇගේ දෙමවුපියන් ළඟට ගියා. ජෙසීමත් අරන් ගියා..."

එහාට මෙහාට ඇදෙමින් තිබූ අමීනාගේත් බෙලෝගේත් සම්බන්ධය ගැන යම් යම් දේ දන සිටියද මේ පුවත ඇසීමෙන් මම මහත්සේ කම්පාවට පත්වීමි. මිනිසකුට ගැහැනියක දික්කසාද කිරීම ඉතාමත් පහසුය. විශ්වාස කළ නොහැකි තරම් පහසු කාර්යයකි. අවශ්‍ය වන්නේ මේ ගැන ඇයට තුන් වතාවක් කීම පමණකි. එහෙත් දරුවන් සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණිය යුතුය.

සාමාන්‍යයෙන් දරුවන් පියා සමඟ සිටිය යුතුය. මවගේ නික්ම යෑම ගැන ජෙසීමාට මොනවා සිතෙන්නට ඇත්ද? අමීනා ගැන ඇත්ත වශයෙන්ම මා තුළ කනගාටුවක් ඇති වූවා දැයි මම නොදනිමි. ආරංචිය ඇසූ පමණින් මා මහත්සේ කලබලයටත් කම්පාවටත් පත්වීමි. මේ සිදුවීම නිසා අමීනා තුළ මා කෙරෙහි ඇති අමනාපය තව තවත් වැඩිවන්නට විය. අමීනා හා බෙලෝ අතර පැවති මතභේදය මා මෙහි පැමිණීමට බොහෝ කලකට පෙර ඇරඹුණක් බව පාතිමා පැවසුවද අමීනා මේ සියල්ල මා පිට පටවන බවට කිසිදු සැකයක්



නැත. මා අමීනාගේ තත්ත්වයේ සිටියා නම් මා ද කරන්නේ ඔය ටිකමය. ඒත් මා යකැදුරන්ගේ හෝ පේනකාරයන්ගේ උදව් ලබා ගන්නේ නැත. ඒත් මේ ගැන යළිත් කල්පනා කර බැලීමේදී අමීනා මට විරුද්ධව මෙවැනි දෙයක් කළා යැයි ස්ථිරවම කිව හැකිද? එය කටකතාවක් පමණි. මට මගේම සිතිවිලිවල ඇති පැටලුම් ලිහා ගත නොහැක. කිසිවකු මට ඒ සඳහා උදව් වන්නේද නැත. පාතිමා සෑම අනර්ථකාරී බලවේගයක් ගැනම යළි සිහිපත් කරමින් එයට දොස් පවරමින් තත්ත්වය තව තවත් දරුණු කරන්නීය. ඈ කී අන්දමට සිදුවිය හැකි භයානක දේවල් ගැන මම කොතෙකුත් සිතන්නට වීමි. මේවා සම්ප්‍රප්ප්‍රලාප බවත්, මගේ මනෝලෝකයේ ඇතිවූ විකාර සිතිවිලි බවත් මා කොතෙක් මටම කියාගත්තද මා වටා කැරකෙන සිතිවිලි ගංගාව වැලැක්විය නොහැක. මගේ සිතිවිලි වැලි කුණාටුවකට හසුවී ගලාගෙන යන කඩදාසි කැබලි වැනිය. මට අවශ්‍ය තැනක නවත්වා ගැනීමට තරම් ඒවා ශක්තිමත් නැත. එසේම කුණාටුවද බලවත්ය. අපේ සිතුවිලි පාලනය කර ගැනීමට අප වෙතම ශක්තියක් නොවීම කොයිතරම් භයානකද? අපට කිසියම් ක්‍රියාවක් පාලනය කරගත හැකි නම් ඇයි අපට අපේ සිතුවිලි පාලනය කර ගත නොහැක්කේ? මිනිස්සු පිස්සු වැටෙන්නේ ඇයි දැයි දැන් මට සිතාගත හැක. සිහි බුද්ධියේ හීන් ඉම පැනගත් විට ඔවුන්ට එසේ සිදුවෙයි. වෙනත් රටක පාසල් පරිසරයේ සිටින මගේ මිතුරියන් මේවා නොවැදගත්, පදනම් විරහිත හිස් ප්‍රලාප සේ සිතනවා විය හැක. එහෙත් මෙහි ජීවත් වන මට මේ මිථ්‍යා විශ්වාස කොතරම් භයානක දැයි සිතේ.

www.sinhalaelibrary.com 82

## 26

මා කුමක් කරන්නද? මේවා ගැන කාට කියන්නද? කොතැනකින් උපකාර බලාපොරොත්තු වන්නද? මේ ගැන තේරුම් ගැනීමට පටන් ගන්නා එකම පුද්ගලයකු හෝ මෙහි නොමැත. ගෙදර දොර කටයුතුවල යෙදෙමින් උයා පිහා දෙමින්, ළමයින්ට බැණ වදිමින්, කෝලාවට හපමින් ගලක් සේ නොසැලී සිටින පාතිමා ගැන මා තුළ ඉරිසියාවක් ඇතිවෙයි. මාත් වයසට යනවිට මේ තත්ත්වයට පත්වේද? මෙය බිය ගෙන දෙන අපේක්ෂාවකි.

අමීනා නික්ම ගිය පසු කිසිදු ආරංචියක් නොවීය. මම ඒ ගැන නොසිතා මගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂාකර ගැනීමට මා තුළ ඇති සම්පූර්ණ ශක්ති ප්‍රමාණයම වැය කළෙමි. මා



ළඟ ඇති පොත් කිහිපය මම යළි යළිත් කියවන්නට වීමි. හදිසියේ මගේ දරුගැබට නවමාසය පිරෙන අවස්ථාවේදී අමීනා අපේ නිවසට පැමිණියාය. ඈ පැමිණියේ ඈ තබා ගිය ඇඳුම් කිහිපයක් ගෙනයෑම සඳහාය. ඈ මා සමග හෝ පාතිමා සමග වචනයකුදු කතා නොකළාය. ඇයට මුහුණ දීමට අකමැත්තෙන් පසුවූ මම මගේ කාමරයට වී සිටියෙමි.

බෙලෝ මට ඈ ගැන වචනයකුදු නොපැවසීය. පාතිමා ද ඈ ගැන වැඩි විස්තරයක් දන සිටියා දැයි මම නොදත්තෙමි. සමහර විට ඈ ඔහු සමඟ ඒ ගැන යමක් පවසන්නට ඇත. දික්කසාදය හෝ සිදුවූ වෙනයම් දෙයක් ගැන හෝ ඔහු වචනයකුදු නොපැවසීම ගැන මම එක් අතකින් පුදුම වීමි. කෙසේ හෝ එය අප හැමට බලපාන සිද්ධියකි. මා සිත තුළ වූ කනස්සල්ලට අමතරව මා අමතක කොට ඉවත දමූ නොවැදගත් කෙනෙකු යැයි මට සිතිණ. ඔහු නවත් බිරිඳක් කැන්දාගෙන එන්නට තීරණය කළහොත් ඒ ගැනත් මගෙන් නොවිමසනු ඇත.

අමීනා නිවසට පැමිණ ආපසු ගිය දිනයේ මම කනගාටු නොවීමට මහත් ප්‍රයත්නයක් දැරීමි. පාතිමා ඒ ගැන යමක් පවසා මගේ සිත කනස්සල්ලට පත්කරන බව දන සිටියෙන් මම ඈ සමග කතාබහ කිරීම ද ඕනෑකමින්ම මගහැරියෙමි.

එදින හැන්දෑවේ මගේ සිතට මහා බරක් මෙන්ම අවිවේකී බවක් දැනෙන්නට විය. කාලගුණ තත්ත්වය සිහිල් බවට හැරෙමින් තිබිණ. ටික වේලාවකට පසු නින්දට වැටුණු මා මධ්‍යම රාත්‍රියේ අවදිවූයේ අසාමාන්‍ය ලෙස තුනටියේ වේදනාවක් ඇතිවූ බැවිනි. ඒ ප්‍රසූතියට පෙර ඇතිවන වේදනාව බව මම ඒ මොහොතේත් නොසිතුවෙමි.

www.sinhalaelibrary.com 83

"තව සති දෙකක් තියෙනවානෙ"

මම මටම කියා ගතිමි. මා නිදා ගැනීමට උත්සාහ කළද වේදනාව ටිකෙන් ටික වැඩි වන්නට විය. මොහොතකට පසු මම පාතිමාට කතා කළෙමි. ඇ ඒ මොහොතේම මා රෝහලට රැගෙන යෑමට සියලු කටයුතු සූදානම් කළාය.

මේ වේදනාව කුමන අන්දමේ එක්ක විය හැකිදැයි මම හැම මොහොතකම සිත සිතා සිටියෙමි. ඒ වේදනාව ආරම්භ වූ විට මගේ මුළු අවධානයම ඒ ගැන යොමුවූ අතර, එයින් නිදහස්වීම මගේ එකම පරමාර්ථය විය. මෙයට නියම වචනය වේදනාව විය හැකි ද? හැම දෙනෙක්ම එය 'විළිරුදාව' යැයි හඳුන්වද්දී ඒ වචනය නිවැරැදි යැයි මටද සිතිණ. එය එක්තරා විදියක රුදාවකි. හදිසියේම ඉස්මතුවූ යථාර්ථය කොතරම් බලවත් වීද යත් මා තුළ හොල්මන් කළ බියකරු හැඟීම් ගැන සිතන්නට හෝ අවස්ථාවක් නොවීය. අනෙකුත් කැක්කුම් හෝ වේදනාවන් මෙන් නොව, මේ වේදනාව මගේ මුළු සිරුර පුරාම ඇදෙමින් මුළු සිරුරම අඹරවන්නට විය.

මොහොතකින් අකුණු ගැසීමකින් පසු ඇතිවන මහ වරුසාවක් මෙන් වතුර බෑගය පුපුරා ගොස් දරු උපත සිදු විය. එක මොහොතකට ප්‍රමෝදයට පත්වූ මම සියල්ල යහපත් ලෙස සිදුවූ බව සිතමින් දරුවා අඬන තෙක් බලා සිටියෙමි. එහෙත් දරුවා ඇඬුවේ නැත. සියල්ල නිහැඬියාවකට පෙරළිණ. අල්ලා දෙවියනි, එය සොහොන් පිටියක නිහැඬියාවක්ම විය. මම මගේ හද පතුලින්ම නැගුණු නිහැඬියාව තුළින් අල්ලා දෙවියන්ට කෑගැසුවෙමි. ඒත් කුමකටද? හැම දෙනාම එකිනෙකාගේ මුහුණු බලා ගනිද්දී අල්ලායි කෑගසන්නට විය.



කඳුළු වැගිරෙද්දී මම ඒ අංගවිකල දරුවෙකැයි සිතන්නට වීමි. නැත. ඒ හොඳින් වැඩුණු පිරිමි දරුවෙකි. එහෙත් පිළිකුල් සහගත සර්පයකු මෙන් පෙකනිවැල ඔහුගේ ගෙල වටා එතී තිබිණ. මගේ දරුවා දරුවකු නොව, නිහඬ මළකඳකි.

මට අඬන්නට, කෑ ගසන්නට, මරහඬ තලන්නට අවශ්‍යව තිබුණ ද, මම ඒ කිසිත් නොකළෙමි. ඔවුන් මා පිරිසිදු කරනතුරු මම හුස්ම හෙළන මළකඳක් සේ ඇස් වසාගෙන වැතිර සිටියෙමි.

මා මේ දරුවා ගැන කොතරම් බලාපොරොත්තු තබාගෙන සිටියාද? පෙකණි වැළකට මෙතරම් දරුණු දෙයක් කළ හැකි වූ අන ම, දරුවා ජීවත්වුණානම් කොතරම් සුන්දරද?

කරදර කම්කටොලු නැමැති දිය දහරින් එගොඩ වීමට මා දරු උත්සාහය කොතරම් ද? මේ සියල්ල සිදුවීමට හේතුභූත වූ කාරණය මට දැන ගැනීමට හැකිනම් මෙයට හේතුව අමීනාගේ සාපය ද? නැතිනම් කායික හේතුවක් ද? එසේත් නැතිනම් හදිසි අනතුරක් ද? කෙනෙකුට මාත් බෙලෝත් බිල්ලට ගැනීමට තිබූ උවමනාව කුමක් ද? මෙය දෙවියන් වහන්සේගේ කැමැත්ත නම්, එය කොතරම් කෲර පැතුමක් ද? සියල්ල අපතේ ගියාක් වැන්න. මගේ බලාපොරොත්තුවේ ඉම නිස්සාර ප්‍රතිඵලයකි. එහෙත් මා දෙවියන් කෙරෙහි තැබූ විශ්වාසය නිසා එය දෙවියන්ගේ කැමැත්ත සේ නොසලකන්නට සිතීමි.

ප්‍රතිඵල විරහිතව මගේ ඇතුලාන්තය ඉරාගත් මම තනිවම ඇඳේ වැතිර සිටිමි. හැමදෙයක්ම ප්‍රතිඵල විරහිතය. දෛවයේ උපහාසයක් සේ පැන නැගුණු මෙය පාපකාරී විහිළුවකි.

www.sinhalaelibrary.com 84

# 27

**කොසේ** වුවද බෙලෝ මට හැම අතින්ම කරුණාවන්ත විය. පිරිමි දරුවකු මෙසේ මිය ගියා නම් සමහර පිරිමි ගැහැනියට ඉතාමත් දරුණු ලෙස සැලකූ බව මම දනිමි. තමාටත්, තම සැමියාටත් මෙතරම් විනාශයක් ළඟාකර දුන් ඈ මහා අවාසනාවන්ත එකියක සේ හංවඩු ගැසෙනු ඇත. ඒත් බෙලෝ මගේ සිත රිදෙන සේ එකම වචනයකුදු නොදෙඩුවේය. මේ නිසාම බෙලෝ බලාපොරොත්තු වූ දරුවා ඔහුට දීමට නොහැකිවීම ගැන මම දැඩි සිත්තැවුලට පත් වීමි.

මගේ ජීවිතය අවසන් වනතුරුම මේ ප්‍රශ්නයත් ඇදීයනු ඇත. මෙය අමීනාගේ පාපය ද ඇගේ කෲර පැතුම ද? නැත්නම්, හදිසියේ ඇතිවූ වැරැද්දක් ද? මෙය කිසිදාක මා විසින් නොවිසඳනු ඇත.



මම මගේ සිතුවිලි වෙනත් පැතිවලට හැරවීමට උත්සාහ ගතිමි. එය අසාර්ථක වූ විට මම මටම බැන කියා ගතිමි. විනාශකාරී දේවල් සිදු වන්නේ ගැහැනුන්ට පමණක් ද? මම මටම කියා ගතිමි. කාලය ගෙවා ගැනීම සඳහා පුවත්පතක් මා අතට පත් වූ විට මම එය මුල සිට අග දක්වාම කියවන්නට වීමි. පුවත්පත්වල වාර්තා වී ඇති විනාශකාරී සිද්ධීන් සියල්ල කියවීමෙන් පසු දරුවකු මෙලොවට බිහි නොකිරීම යහපතක් බව මටම කියා ගතිමි. එහෙත් ඉරු නැගීමත් සමගම ඇතිවන ඒකාත්මික සුන්දරත්වය ඇස ගැසෙන විට තවත් ජීවියකු මෙලොවට ගෙන ඒම සඳහා මා ජීවත්ව සිටීම ගැන මම සතුටු වීමි. හැම දෙයක්ම සිදු වීමෙන් පසු ජීවිතය සියලු සත්‍යය බවට පත්වී ඇත. මරණය ද ජීවිතයේම කොටසකි.

මා ළඟ තිබූ පොත් මම යළි යළිත් කියවන්නට වීමි. නගරයෙන් අලුත් පොත් කිහිපයක් ද ගෙන්වා ගෙන කියවන්නට වීමි. එහෙත් සමහරක් වැඩකට නැති ඕපාදූපයන්ය. හැමවිටකම මම මගේ සිත වැඩක යෙදවීමට උත්සාහ ගතිමි. එයට එකම පිළිසරණ ද කියවීම බව මට සිතිණ. වෙන මොනවා කළත් මගේ සිත වේදනාකාරී සිදුවීම් වෙත හැරී දුවයි. සමහර හවස් වරුවක මා නිදන්නට උත්සාහ කළහොත් මම පුනරාවර්තන සිහිනයන් දකිමි. මා විළිරුදාවෙන් පෙළෙන අතරම, දරුවා ජීවත්ව සිටී. ඒත් මා අවදිවන්නේ හිස් බව වැළඳ ගනිමිනි. ඉන් අසහනයට පත්වන මම කැගසා හඬමි.

කාලය විසින් මේ සියල්ල සුවපත් කරනු ඇතැයි මට සිතේ. එහෙත් කිසිදාක මට මේ අමතක කළ නොහැක. බෙලෝ මේ සිද්ධිය මගේ මතකයෙන් ඈත්කරවීම සඳහා මට නගරයේ නිවස ඉදිවන අන්දම ගැන කියන්නට වෙයි. ඔහු කියන අන්දමට එය සාදා නිමකිරීමට ආසන්නය.

"ඔබ එහි ජීවත්වීමට ගියවිට"

ඔහු වරක් එසේ කියද්දී මම එයට කන් නුදුන්නෙමි.

www.sinhalaelibrary.com 85

## 28

**ඊයේ** හවස බෙලෝ පින්තූර කිහිපයක් රැගෙන මා වෙත පැමිණියේය. ඒ අලුත් නිවසේ මුළුතැන්ගේ හා යා වන අල්මාරි ඒකකවල පින්තූරය.

"කොයි එකද වැඩිය හොඳ?"

ඔහු අසද්දී මොහොතකට ඉවක් බවක් නැතිව ගිය මගේ හෘද ස්පන්දනය නැවතුණාක් මෙන් විය. පින්තූර දෙස බැලූ මම වඩාත් ගැලපෙන සුදුසු එක තේරීමට පෙර ඒ සම්බන්ධයෙන් මා සිත තුළ පහළ වූ සිතුවිලි ගොනු කරන්නට වීමි.

"මේව මොකටද?"



කිසිවක් නොදත්තාක් මෙන් මම හුරතල් ලෙස ඇසුවෙමි.

"අලුත් ගෙදරටනෙ"

ඔහු පිළිතුරු දුන්නේය.

.... කුස්සියේ අල්මාරි ගැන විතරක් මගෙන් අහන්නෙ මොකටද?

මගේ සිතට නොරිස්සුම් සහගත සිතිවිල්ලක් ඇති විය. ඒත් මම හඬ නොනැඟුවෙමි.

"මේක හොඳයි වගේ."

වෙනත් කෙනෙකුගේ නිවසක් සේ සිතමින් මම පැවැසුවෙමි.

.... ඇයි ගේ දොර අනික් බඩුමුට්ටු ගැන හරි සැලසුම් ගැන හරි මගෙන් අහන් නැත්තෙ....

මම සිතන්නට වීමි. ඒවා ගැන මා තුළ වැඩි දැනීමක් ද නොවීය. එසේ නම් ඒ ගැන මා තුළ තරහක් ඉපදුනේ මක්නිසාද?

"එතකොට අනික් ගෘහ භාණ්ඩ?"

වචන ගොත ගසද්දී මම සෙමෙන් ඇසුවෙමි.

"ඒවා ගෙනාවා අල්හාජ් මූසා. ආණ්ඩුකාරයාගෙ සහෝදරය ගෙනාපුව වගේමයි"

www.sinhalaelibrary.com 86

මගේ ප්‍රශ්නය සමච්චලයක් සේ සැලකූ ඔහු හිනැහෙමින් කීවේය.

අල්හාජ් මූසා නගරයේ ප්‍රසිද්ධ පුද්ගලයෙකි. ඔහුට බිරින්දෑවරු සිව් දෙනෙක් සිටින අතර ඔවුන් සඳහා නගරයේ වෙනම ගෙවල් හතරක් ද තිබේ. එක් බිරියක් අමෙරිකාවේ උපන් පිලිපීන ජාතිකයෙකි.

අනෙක් දේවල් අතින්ද බෙලෝ අල්හාජ් මූසා අනුකරණය කරන්නට පටන් ගනී දෝයි මම මවිතයට පත්වීමි.

අලුත් ගෙදර කොයි වගේ ඇත්ද? ගෙනාපු ඇඳ, පුටු, මේස කොයි වගේ ඇත්ද? ඒ නිවසට මා පමණක් කැන්දාගෙන යන්නේ ද නැතිනම් ඔහු වෙන කවුරුන් සමග ඒ නිවසට යන්නේද? යන්න ඇසීමට තරම් ශක්තියක් මා තුළ නොවීය. නවකතාවල කියවා ඇති පරිදි මගේම ආධිපත්‍යය පතුරුවා ගත හැකි ස්ථානයක් ගැන මම සිහින මැව්වෙමි. අලුත් නිවස බැලීමට මා කැඳවාගෙන යන්නැයි බෙලෝට කියන්නට මට සිත් විය. එහෙත් මම ඒ නොපැවසීමි. සමහර විට ඒ නිවස මා සඳහාම වන්නේ නම් පාතිමා තුළ වෛරයක් ඇතිවීමට ඉඩ තිබේ. හොඳම දෙය පාතිමාගෙන් මේ ගැන ඇසීමත් ඒ ගැන ඈ සමග සාකච්ඡා කිරීමත්ය.

මම ඊයේ හවස මේ ගැන ඇගෙන් ඇසුවෙමි.

"ඇත්තටම ඔයයි අලුත් ගෙදරට යන්නෙ. මම නෙවෙයි"

ඈ හිස හරවා හිනැහෙමින් කීවාය.



"මං ඔයාව බලන්න විතරක් අලුත් ගෙදරට එන්නම්. ඒත් ඒ බෙලෝ මාව කැටුව ආවොත් විතරයි"

නගරයේ ජීවත්වීමට තමා කැමැති නැති බවද ඈ පැවසුවාය.

"අපේ අල්ලපු ගෙදර ඉන්නෙ අල්හාජ් මූසාගෙ ඉංග්‍රීසි නෝනා. මාත් ඒ වගේ මෙහේ ඉන්න කැමැතියි"

මොහොතකට කුමක් කිවයුතුදැයි මට සිතාගත නොහැකි විය. පාතිමා කොතරම් ගුණ යහපත් හොඳ චාම් ගති ගුණ ඇති කාන්තාවක් දැයි මම සිතන්නට වීමි.

"ඇයි මටත් ඒ වගේ වෙන්න බැරි? මං මෙහේ ඉන්නෙ සතුටින් කියල ඈ කීවේ කොයිතරම් විශ්වාසවන්ත ලෙසද? බෙලෝ ගැනද ඈ තුළ ඇත්තේ දැඩි විශ්වාසයකි. අමීනා මෙන් තරහින් පුපුරමින් ඈ බෙලෝ සමග දබර කළේ නැත. මා ඇගේ තත්ත්වයේ සිටියා නම් කුමන අන්දමේ සිතුවිලි මා තුළ පහළ වේද? මගේ සැමියාගේ ප්‍රථම බිරිඳට මගේ ආශිර්වාදය ලැබේවා....!

www.sinhalaelibrary.com 87

## 29

ඊයේ මම නව නිවස බැලීමට ගියෙමි. මෙහි ඇති නිවෙස් හා සංසන්දනය කරන විට මෙය මට සිතා ගැනීමට බැරි තරම් විය. එහි වැඩ නිම කිරීමට ආසන්නව තිබිණ. මෙය නාගරික පරිසරයක ගොඩනැගුණද එහි එතරම් නාගරික බවක් දක්නට නොවීය.

සොකෝතෝවල මුළුමනින්ම වාගේ ඇත්තේ රජයේ නිවෙස්ය. ඒවායේ වැඩි හරියක් පදිංචිව සිටියේ විදේශිකයන්ය. රජයේ නිවෙස්වලට යාබද ඉඩම් කැබැල්ලක් මිලදී ගැනීමට බෙලෝ සමත් වූයේ කෙසේද යන්න මට සිතා ගැනීමට බැරි තරම් විය.



මා ගෙවත්තට පියමන් කළ විට මට එක් පැත්තකින් දකගත හැකිවන්නේ අල්හාජ් මූසාගේ නිවසය. අනෙක් පසින් වූයේ පේළි පේළි වශයෙන් ගොඩනැගුණු රජයේ නිවෙස්ය. මෙහි කුඩා මාවත් හයක් හෝ අටක් වේ. ඒ හැම මාවතකම නිවෙස් දොළහක් පමණ ඉදිවී තිබේ. ඒවා නිදන කාමර දෙකකින් හෝ තුනකින් යුත් ඒවා විය යුතුය. ඒවායේ ඉන්දියානුවෝ, පාකිස්තාන්වරු, ඊජිප්තියන්වරු හා ශ්‍රී ලාංකිකයෝ ජීවත් වෙති. සුදු හම ඇත්තවුන්ද කිහිප දෙනෙකි. නයිජීරියානු රජයේ නිලධාරීන්ද කිහිප දෙනෙක්ම විය.

යාබද නිවසේ ජීවත්වන්නේ ශ්‍රී ලාංකිකයන් විය යුතුය. සැමියා බිරිඳ හා දරු දෙදෙනා මෝටර් රියකට නැගී යනු මම දුටුවෙමි. පෙනුමෙන් සැමියා ඉන්දියානුවකුට සමානය. එහෙත් බිරිඳ දැකීමෙන් පසු ඔවුන් ශ්‍රී ලාංකිකයන් බව මට පසක් විය.

අද අලුත් නිවස බැලීම සඳහා පාතිමාද මා සමග පැමිණියාය. මෝටර් රියෙන් අප නිවසේ සිට නගරයට යන අතරමගදී පසුගිය අවුරුදු කිහිපය තුළ මගේ ජීවිතය වෙනස් වී ඇති අන්දම ගැන සිතන්නට වීමි. මැටි බිත්තියෙන් කළ නිවෙස් හා අතරින් පතර වූ සෙනඟ වටවූ ළිං ඇය ගැසෙද්දී මට අපේ මිනිස්සුන්ගේ ජීවිත ගැන නොසිතා සිටිය නොහැකි විය. ඔවුන් හැමවිටම දුප්පත්කමේත්, බඩගින්නේත් අගාධයට හසුවූවන්ය. මෙවරත් නයිජීරියානු සමූහාණ්ඩුවෙන් ජනතාව මෙහි ඇදී එමින් සිටිති. වැල් කෝටුවක් වැනි ගැහැනියක්, දරුවන් සිවු දෙනෙක් තම සැමියා සමග තමන් සතු සියලු බඩුබාහිරාදිය ඔසවාගෙන පැලක් අටවා ගැනීමට තැනක් සොයමින් ඇවිදිනු දක්නට ලැබිණ.

www.sinhalaelibrary.com 88

මගේ මිතුරියන් විස්තර කොට තිබූ අන්දමට මට සූඩානයේ සාගතය සිහිපත් වෙයි. ඈ ඒ තත්ත්වය දක තිබුණේ රූපවාහිනියෙනි. එහෙත් මෙහි මේ කිසිවක් රූපවාහිනියෙන් නොපෙන්වයි. මොවුන්ද සාගතයට හසුවූවන් වැන්න. මා කියවා ඇති භයානක සිදුවීම් මට සිහිපත් වෙයි. හැම දෙයක්ම දේශගුණය, පස හා වැසි නොලැබීම පවා ඔවුන්ගේ ජීවිතවලට බලපා තිබේ.

මගේ සිතට උසුලාගත නොහැකි තරම් වූ වේදනාවක් ඇතිවෙයි. මේ සියල්ලටම වගකිව යුත්තේ දේශපාලනඥයන්ය. ඔවුන්ගේ නොසැලකිලිමත්කම නිසා සියල්ල අර්බුදයක් වී මහා ව්‍යසනයක තත්ත්වයට පත්වී ඇත. මේ රටේ තත්ත්වය හැමදාමත් මෙසේමය. පසුගිය රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය පැවති අවදියේ පැතිරුණු නින්දිත කතා මට සිහිපත් වෙයි. ආණ්ඩුකාරයා කාමරයක් පුරා මුදල් සමග අතට අසුවී ඇත. ඔහු අතට හසු වූයේ ලිහිල් ක්‍රමයකට මුදල් හොරකම් කළ බැවිනි. සමහරෙක් තම බැංකු ගිණුම් පිටරටවලට ගෙන ගියහ. කොතරම් විශාල යෝජනා ක්‍රම දියත් කළ ද දුප්පතුන්ටත් නූගත් ගොවියන්ටත් ලැබුණේ බිංදු මාත්‍ර යහපතකි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් හෝ මිලිටරි ආණ්ඩුවක් යටතේ ඊළඟ කෑමවේල ගැන සහතික විය නොහැකි වූ මිනිසුන්ට ලැබුණේ මොනවාද?

තෙල් උද්ධමනය ඇතිවූ අවස්ථාවේ සිදු වූයේ කුමක්ද? ශුභසාධන යෝජනා ක්‍රම වශයෙන් හැඳින්වුණු රෝහල්, කර්මාන්ත ශාලා ගොඩනැගිලි ආදිය සඳහා ඒ මුදල් යොදවන ලදී. ඉන් බොහොමයක් නඩත්තු නොකර අත්හැර දමා ඇත. මා පළමුවැනි ශ්‍රේණියේ උන් අවදියේ පවා පාසලට යම් යම්



පරිත්‍යාගයන් කළ අන්දම මට සිහිපත් වෙයි. විශාල මෝටර් රියකින් හෝ විවෘත ට්‍රක් රථයකින් පැමිණි පුද්ගලයා කවුරුන්දැයි මට අවබෝධ වූයේ මේ දන්ය. පාසල් කෑමවේල බඩුබාහිරාදිය ඇතුළු අනෙක් සෑම දේම සැපයීමේ කොන්ත්‍රාත්කරුවා අතරමැදියා ඔහුය. මේ සමාජ රටාවේ නියම බලපුළුවන්කාරයා ඔහුය. මේ කොන්ත්‍රාත්කාර අල්හජ්ජිවරු අද මසුරුකම ඉහවහා ගිය අධිපොහොසතුන්ය. බොහෝ වෙළඳ ව්‍යාපාර ඔවුන් සතුය. ඒත් අද දරුවන්ට කිසිවක් නැත. ඔවුන් බොහෝ දෙනෙක් පාසල් එන්නේ කුසගින්නේ ඉරුණු ඇඳුම් ඇඳගෙනය. මුළු සමාජ ව්‍යුහයම අල්ලස් හා දූෂණ මත රැඳී තිබේ. නැදෑයන් සඳහා බොහෝ රැකියා ලබාදී ඇති අතර කප්පම් අතින් අත මාරුවීම් සාමාන්‍ය සිද්ධියක් වී තිබේ.

මේ කලබගැනිවලින් ඈත්වී සිටියද අප කියවා අසා ඇති දේ අනුව ලාගෝස් නුවරත් අගනුවරට නොදෙවෙනිය. සොයිනිකාගේ "පරිවර්තකයෝ" නම් කෘතිය මම කියවන්නට වීමි. එය කියවා තේරුම් ගැනීමට තරමක් අපහසු පොතකි. එහෙත් ලාගෝස් නුවර නියම තත්ත්වය පොත කියවීමෙන් පසු මම නියමාකාරයෙන් අවබෝධ විය. පොතට පසුබිම් වී ඇත්තේ මීට වසර දෙකකට පමණ පෙර සිදු වූ සිදුවීම්ය. එහෙත් අද තත්ත්වයද මෙයට වඩා නොවෙනස්ය. කුණු කසල, අසූචි, අඩපණ විදුලිබලය, මුල්බැසගත් වරප්‍රසාද හා පුරාණ මිනිස්සු මෙන්ම දූෂණයද එසේම පවතී. අලුත් රෙජිමේන්තුවට මේවා වෙනස් කළ හැකිද?

මා සොකොතෝ හරහා පැමිණෙද්දී ලාගෝස් නුවර මහා පරිමාණයෙන් මේ තත්ත්වය පවතින බව හැඟිණ. නා

www.sinhalaelibrary.com 89

නා ජාතිකයන්ගෙන් පිරී උත්කර්ෂවත් නුවරක් වුවද තැන තැන කැළිකසල හා අසූචි විසිරුණු හිඟන්නන් හා පියාවයන්ගෙන් පිරුණු නුවරකි. දෙපාර්තමේන්තු සංකීර්ණවල ගබඩා අසල ගිණිය නොහැකි තරම් හිඟන්නන්ය. විවිධ භාණ්ඩයන්ගෙන් පිරී සුඛෝපභෝගී වෙළෙඳ සැලකින් පිටතට එන පුද්ගලයකු ගයාකෑමට සැරසුනු ගැහැනුන් හා මිනිසුන් හැම තැනම සිටී. ඒ සමග හිස නමාගෙන යාඥා කරන මුස්ලිම් බැතිමතුන්ද දක්නට ලැබේ. මේ බොරු මායාව එළිදක්වීමට ලාගෝස් නුවර මුස්ලිම් බැතිමතුන් මෙන්ම ක්‍රිස්තියානි ආගමිකයන්ද හරි හරියට පේවී සිටී.

මුළු ලෝකයේම තත්ත්වය මෙයට සමානද? එසේ නැත්නම් ආසියාවේ තත්ත්වයට වඩා අප්‍රිකාවේ තත්ත්වය අයහපත්ද? කොයි රටේ වුවත් පූරාජේරුව සඳහා කෙරෙන ආගමික කටයුතුවල වෙනසක් නැතැයි සිතේ.

අලුත් නිවසේ පදිංචියට ගිය විට මේ තත්ත්වයෙන් මට තරමක් දුරට හෝ ගැලවී ගත හැකිවනු ඇත. මෙහිදී මෙන් මන්දපෝෂණයෙන් හා කුසගින්නෙන් පෙළුණු දරුවන් මට කෙළින්ම ඇස නොගැසෙනු ඇත.

ඒත් මගේ මානසික තත්ත්වය වෙනස් කිරීමට එයින් බලපෑමක් ඇතිවේ යැයිද මට නොසිතේ. කෙසේ හෝ මා වියපත් වූ බවක් මට දැනේ.

රාමසාන් උපවාසය ආරම්භ කිරීමට ආසන්නව තිබියදී අපි අලුත් නිවසේ පදිංචියට පැමිණියෙමු.

අප පදිංචි වන මේ අවස්ථාව වන විට නිවස



සම්පූර්ණයෙන්ම සාදා නිමකර තිබුණි. ගේ දොර බඩු බාහිරාදිය මෙන්ම මුළුතැන්ගෙයි උපකරණ දිස්නය දෙමින් බැබලිණ. නිරන්තරයෙන් වතුර නොලැබුණද නාන කාමරය ඉතාමත් සිත්ගන්නාසුළු අන්දමින් නිමකර තිබුණි. මෙහි නැවුම් අලංකාරය හා එක්වීමට මට තවමත් බැරුවාක්.මෙන් විය. මගේ පියාගේ නිවහනෙන් බෙලෝ වෙත පැමිණි මම දැන් තවත් අලුත් නිවසක ජීවත්වෙමි. පාතිමා කී අන්දමට අසල්වැසියකුට සිටින්නේ අල්හාජ් මුසාගේ වැඩිමහළු බිරිඳ පමණි.

මගේ පැරණි නිවසේ වටපිටාව තුළින් මට අහිමි වූ සමීපතම දර්ශනය වූයේ යාඥාවේ හඬයි. බෙලෝගේ නිවසට යාර කිහිපයක් ඈතින් වූ ගහක් මුල මිනිස්සු යාඥා පැවැත්වූහ. මේ නගරයේ වුවද මිනිසුන් යාඥා කරන තැන් තිබිය හැකි වුවද මගේ නිවසට පෙනෙන තෙක් මානයක එවැන්නක් ඇති බවක් නොපෙනේ. ඉංග්‍රීසි යූ අකුර උඩට හැරුනාක් මෙන් බිමට තැබුණු මිනිසුන් උදෑසනත්, දහවලත් දෙවියන් වහන්සේ උදෙසා නගන හඬ කරුනාවේත්, දයාවේත් උල්පතකි. මා යාඥා කරන්නවුන් දුටුවේ මගේ ජනේලයෙනි. ඒ ඝෝෂාකාරී හඬ නොඇසීමෙන් මා කිසියම් සැනසීමක් ලැබූවා යයි කෙනකු සිතන්නට ඉඩ තිබේ. එහෙත් තම ගැහැනු සංහතිය නිවසේ තබාවිත් මිනිසුන් එකට එක්වී කරන ඒ හඬ ඝෝෂාකාරී හඬක්මදැයි මම සිතන්නට වීමි. මා එහිදී උදෑසන අවදි වූයේ ඒ යාඥා හඬ ඇසීමෙනි. මේ නගරයේත් මිනිසුන් යාඥා කරනවා ඇත. මෙසේ ඔවුන් යාඥා කරන්නේ එකම දෙවියන් වහන්සේටදැයි මා තුළ විචිකිච්ඡාවක් ඇති වෙයි.

මේ නිවසට පැමිණි පසු මගේ සිතට දැනුනු පාළු කාන්සිය දෙගුණ තෙගුණ විය. මගේ මිතුරියන් විසින් එවූ මා විසින්

www.sinhalaelibrary.com 90

ආරක්ෂා කරන ලද ලියුම් මම යළි යළිත් කියවන්නට වීමි. මා ගැනත් මගේ පරිසරය ගැනත් ලියන්නැයි එක් මිතුරියක් කියා තිබුණි. දැන් මේ කිසිදු වැඩක් නැතිව තනිව සිටින මේ මොහොතේ මම මගේ සිතුවිලි කඩදාසිවල සටහන් කිරීමට උත්සාහ ගතිමි.

මා කෙටිකතා කිහිපයක්ම ලියුවද ඒවා පුවත්පතකට හෝ යැවීමට නොසිතෙයි. කෙසේ හෝ මම කෙටිකතා දහයක් පමණ එකතු කොට ප්‍රකාශකයකු හොයා යා යුතුය. මට ඒ ගැනද හරි අවබෝධයක් නැත. මගේ මිතුරියන් සිටියා නම් මට ඔවුන්ගෙන් උපදෙස් ගැනීමට ඉඩ තිබුණි. අප නව නිවසට පැමිණි බව මා ජානකී ගුරුතුමියට ලියා යැවූ පසු ඈ මා බැලීමට මෙහි පැමිණියාය. මගේ කෙටි කතා ගැන මා ඈ සමග දෙගිඩියාවෙන් යුතුව පැවසුවද ඈ ඒ ගැන කතාබහ කළේ මහත් උනන්දුවකිනි. මේවා කළුනාවල හෝ ලාගෝස්වල ප්‍රකාශකයකු වෙත රැගෙන යන්නැයි ඈ මට අවවාද කළාය. එහෙත් මා ගන්නා උත්සාහය සපලවේදැයි මට සිතාගත නොහැක. මම මගේ සිතුවිලි එක්කාසු කරමින් මා අවට සිටින පුද්ගලයන් ගැනද කුඩා කතන්දර ලියන්නට වීමි. මුරකාරයා වැනි මිනිසුන් ගැනද බෙලෝගේ නිවසට විරුද්ධ පැත්තේ වූ ගරාජය අසල කෑමට යමක් ලැබෙන තුරු බලා සිටින කුඩා දරුවන්ද මගේ කෙටි කතාවලට වස්තු බීජ විය. මගේ දරුවා මිය ගිය පසු මේ සියල්ල අරුත්සුන් දේවල් යයි මට සිතුණි. ඒ කෙසේ වුවද මේ කතා ප්‍රකාශකයකුට දී ප්‍රතිඵලය කුමක්දැයි දැනගනීමටද මා තුළත් කැමැත්තක් තිබිණ. බෙලෝ සමග මේ ගැන පැවසුවහොත් ඔහු මෙය ගැහැනුන්ගේ විකාරයයි හිනාවට භාජනය කෙරෙනු ඇත. ඒ නිසාම මම මේ ගැන ඔහු සමග කතා නොකළෙමි.



තම මුල් අත්පිටපත ගැන සිය අත්දැකීම් ප්‍රකාශ කළ නයිජීරියානු ලේඛිකාවක මගේ සිහියට නැගෙයි. ඈ තම අත්පිටපත ගැන සාර්ථක පිළිතුරක් බලාපොරොත්තුවෙන් උන් අවස්ථාවකදී එම අත්පිටපත ආපසු පැමිණ තිබේ. මටත් ඒ ටිකම සිදුවුවහොත්, මා මෙය ලාගෝස්වලට හෝ කළුනාවලට යවන්නේ කෙසේද? මා මෙය යැවිය යුත්තේ බෙලෝගේ මාර්ගයෙනි. කඩදාසි ගෙන්වා ගැනීමට වුවද මා ඔහුට කිව යුතුය. මට කඩදාසි අවශ්‍ය වන්නේ මිතුරියන්ට ලිපි ලිවීමට පමණක් යයි ඔහු සිතයි. ඒ නිසාම මම මගේ ජීවිතයේ එක් පියවරක් ඉදිරියට යමින් තනිවම සාප්පු ගියෙමි. අහමදු බෙලෝ මාවතේ කුණු කානු අතරින් ගමන් කළ මා හැමතැනකම දුටුවේ ප්ලාස්ටික් බඳුන්ය. අපේ පාරම්පරික දියලබු බඳුන් කිසිම තැනක නොවීය. තවත් දවසක යනායා බාන් මාවත ඔස්සේ ගමන් කළ මට රෝල් රෝලවලට එතී තිබූ බුමුතුරුණු ඇස ගැසිණ. ඒ බුමුතුරුණු බකුරා වැව අසල මහා දියලබු ගෙඩියක පාවුණු මිනියා පිළිබඳ සිහිනය මට සිහිපත් කළේය. ඒ සමගම මගේ සිතිවිලි දුවගියේ අංගවිකල දරුවා හා ගැහැනිය වෙතටය.

ඉර බැස යන මොහොතේ වැව අසල වූ අඳුරු බියකරු නිහැඬියාව සිහිපත් වූ මට ඇඳුම් පැළඳුම් හෝ වෙනත් කිසිදු භාණ්ඩයක් මිල දී ගැනීමේ ආශාව තුරන්වී ගිය බවක් දැනිණ. මම පොත් කිහිපයක් මිල දී ගත්තෙමි. එහෙත් තෝරා ගැනීමට තරම් පොතපත එහි නොවීය. කළුනාවලට, ඉබදාන්වලට හෝ ලාගෝස්වලට යෑමට හැකි වුවහොත් තව පොත් කිහිපයක් ගැනීමට හැකිවනු ඇත. මා මිලදී ගත්තේ මොනවාදැයි බෙලෝ ඇසූ විට මා පොත් යයි පවසද්දී ඔහු පුදුමයට පත්විය. මේ කඩ සාප්පු පිරී තිබුණේ හොරෙන් ගෙනඑන ලද ඇඳුම්

www.sinhalaelibrary.com 91

ආයිත්තම් ඇතුළු විවිධ භාණ්ඩවලිනි. මේ සාප්පු පිටතට පෙනුණේ නොවැදගත් මුඩුක්කු ලෙසිනි. ඒවා මැදින් ගලාගිය කාණුවල තැනින් තැන අසූචි ගොඩවල්ය. කඳුනාවල සාප්පු මීට වඩා හුඟක් වෙනස් බව මා අසා තිබිණි.

මේ අතර තම නැද්දා හා මාමා සමග අපි "කඳුනා" සල්පිලට යමු යැයි යෝජනා කරමින් ජස්ටිනා ලිපියක් එවා තිබිණ. බෙලෝ මේ ගැන කුමක් කියාවිද? ජස්ටිනා සමග මට යෑමට අවසර ලැබේවිද? මට සිතාගත නොහැකි විය. ඔහු අවසර දේවි. එහෙත් ඔහුගේ තුන්වැනි බිරිඳ වශයෙන් මට මෙතරම් සැප සම්පත් ලබාදී තිබියදී මා තැන තැන ඇවිදින්නට යන්නේ කුමකටදැයි ඔහු සිතන්නට ඉඩ තිබේ.

මගේ සහෝරියන් විශේෂයෙන්ම අසූමී මා ගැන ඉරිසියා කරන්නට වූවාය. සහෝදරියන් මෙන්ම නැදැයින්ද මෙහි පැමිණි අතර ඔවුහු කිහිප දිනක් හෝ මෙහි නවතින්නට යැයි මා ආරාධනා කරතැයි සිතූහ. එහෙත් බෙලෝගෙන් නොඅසා මා ඔවුන්ට කෙසේ ආරාධනා කරන්නද?

කඳුනා සල්පිලට යන අවස්ථාවේදී මගේ කෙටිකතා කිසියම් ප්‍රකාශකයකුට දීමට අවස්ථාව ලැබෙතැයි මම සිතන්නට වීමි. මා කිසි දිනක මෙවැනි දිගු ගමනක් ගොස් නැත. මගේ සිතට මහත් සේ ප්‍රීතියක් ඇතිවෙයි.

දින කිහිපයකට පසු ජස්ටිනා කඳුනා සල්පිලට යන ගමන ස්ථිර කරමින් තම නැන්දා අත පණිවිඩයක් එවා තිබිණ. අවසානයේදී වැඩි අදි මදි කිරීමක් නොකර බෙලෝ මේ ගමන යෑමට මට අවසර දුන්නේය.



"කොහොමද ඔය යන වාහනේ? මගදි කැඩෙන එකක් නැහැ නේද?"

ඔහු ඇසුවේය. මම හිනැහුනෙමි.

කඳුනාවලට ගොස් දින දෙකක් එහි නැවතීමට ජස්ටිනා සූදානම් කර තිබිණ. "කඳුනා" සල්පිල වැනි විශාල සල්පිලකට මා කිසි දිනක පිවිස නොතිබීමත්, මෙතුවක් කාලයකට මෙතරම් දිගු ගමනක් ගොස් නොතිබීමත් නිසා මගේ සිතට දැඩි චකිතයක් ඇති විය. දහවල් කෑමෙන් පසු ගමන යෑමට සූදානම් කර තිබිණ. බෙලෝට එදින උදේ ව්‍යාපාරික කටයුත්තක් යෙදී ඇති බැව් ඔහු පැවසීය. උදේ යාඥාවෙන් පසු කිරි වීදුරුවක් පානය කළ ඔහු උදේ ආහාර සඳහා වෙනත් කිසිවක් නොගත්තේය. උදේම වැඩට යන දිනවල ඒ ඔහුගේ පුරුද්ද විය.

"අද 'කඳුනා' සල්පිලට යනව නේද? අතේ සල්ලි තියෙනවද?" හදිසියේ මතක් වූ කලක මෙන් ඔහු යන්නට පෙර මගෙන් ඇසුවේය.

"සල්ලි නැහැ" මම පසුව කීවෙමි.

"මොනව මොනවද ගන්න යන්නෙ.... රෙදිනෙ.. වෙන මොනවද?"

"රෙදි ටිකක් නොවෙයි"

මම ඔහු දෙස නොබලාම පැවසීමි.

"රෙදි නැතිව වෙන මොනවද? මට මොනවද අරන් දෙන්නෙ?"

www.sinhalaelibrary.com 92

සල්පිලට යන කුඩා දරුවකුගෙන් පියකු අසන්නාක් මෙන් ඔහු ඇසුවේය.

"මොනවද ඔයාට ඕනි. ඔයාගෙ සල්ලිවලින්මයි මට අරන් දෙන්න වෙන්නෙ"

"කොච්චර සල්ලි ඕනිද? 500 ක්?"

මට හුස්ම ගැනීමට අපහසු බවක් දැනිණ. මට එතරම් මුදලක් අවශ්‍ය නොවීය.

"එච්චර ඕනි නෑ"

මම කීවෙමි.

ඔහු මුදල් නෝට්ටු මිටියක් මා වෙත දිගු කළේය. මම එය අතට ගතිමි.

"අල්ලා දෙවියන්ගෙ පිහිටෙන් පරිස්සමින් ගිහින් එන්න."

එසේ කියා හිනැහුණු ඔහු ගමන පිටත් වෙමින් යළි මෙසේ කීවේය.

"හැම තිස්සෙම සල්ලි ගන්නකොට ගණන් කරල ගන්න. ගිහින් ගණන් කරලා බලන්න"

ඔහුගේ මෝටර් රිය ඈතට යනු බලා උන් මම වමතේ ගුලිකරගත් නයිරා මුදල් මිටියක් ඇතිව ආපසු හැරුණෙමි. ඔහු කී නිසාම එය ගණන් කර බලන්නට මට සිත් විය. එතැන නයිරා දහසක් විය. කිසිදු හේතුවක් නොමැතිව ඔහු



වෙනුවෙන් මා තුළ මහත්වූ කනගාටුවක් උපන්නේය. ඔහු ඇත්තටම මට ආදරය කරන්නේද? ආදරය කියන්නේ කුමක්ද? එය රටින් රටට වෙනස් වේද? අප්‍රිකාවට වඩා යුරෝපයේදී ආසියාවේ හෝ ඇමරිකාවේ දී එය වෙනස්වේද? බෙලෝට ඇත්ත වශයෙන්ම අවශ්‍ය වූයේ මාව සතුටු කිරීමද? එසේ නැත්නම් තමන්ට ඕනෑ තරම් වියදම් කිරීමට හැකි බව පෙන්වීමට ඔහු විසින් යොදා ගත් උපක්‍රමයක්ද? මුදලින් හරි අඩක් නිවසේ තබා නයිරා 500 ක් පමණක් රැගෙන යෑම මගේ අදහස විය. මම ඒ මුදල් තැබීම සඳහා මගේ කාමරයට ගියෙමි. මගේ සිත පුරා කිසියම් වේදනාවක් ඔඩු දුවන්නට විය. ඒ සමගම මා වරදක් කර ඇතැයි යන හැඟීමක්ද මා තුළ ඇති විය. මොහොතකින් මා ඔහුත් කැටුව යන්නේ නම් කොතරම් හොඳදැයි මට සිතිණ.

අලුත් නිවසට පැමිණියද අප ජීවත් වන්නේ වෙනම කාමර දෙකකය. මේ නිවසට පැමිණි පසු බෙලෝ තම කාලය මේ නිවසත්, පාතිමාගේ නිවසත් අතර බෙදා ගත්තේය. මා මුදල් රැගෙන කාමරයට ඇතුළු වන විට මගේ වැස්ලින් බෝතලය කණ්ණාඩි මේසය කොනේ තබා ඇති බව දුටුවෙමි. අපි අපේ අත් පාවල වැස්ලින් ඇතිල්ලීමට පුරුදුව සිටියෙමු. ග්‍රීෂ්ම කාලයේ හම වියළී යන විට එය විශේෂිත කාර්යයක් විය. උදේ පාන්දර බෙලෝ තමාගේ වැස්ලින් බෝතලය අහවර වී ඇති බව පවසමින් මගේ කාමරයට ඇතුළු වූවා මට මතකය. මේ නිවසේ අප දෙදෙනාගේ කාමර ළං ළංව පිහිටා තිබූ මුත් බෙලෝ මගේ කාමරයට ආවේ කලාතුරකිනි.

තරමක් දහවල් වී ජස්ටිනා ඇගේ නැන්දා මාමා, හා මම පුංචි මෝටර් රියෙන් කඳුනා බලා පිටත්වීමු. මා බෙලෝ

www.sinhalaelibrary.com 93

සමග පැමිණියා නම් ගමන මීට වඩා විනෝදජනක වනු ඇතැයි මට සිතිණ. පාර දෙපස තැන, තැන හදිසි අනතුරු වලට භාජනය වූ මෝටර් රථ කැබලි මළකඩකමින් තිබෙනු පෙනිණ. සමහරක් උඩු යටිකුරු වී ගොස්ය. අප ගමන් කරන රථය හා සමාන රථයක් හදිසි අනතුරකට බඳුන් වී තිබෙනු දුටු මගේ සිත බියෙන් ගැහෙන්නට විය. මෝටර් රියක් තුළ හිරවී මියයන්නට සිදු වුවහොත්.

අපි එදින සවස කඳුනාවලට පැමිණ ජස්ටිනාගේ නෑ ගෙදරක රාත්‍රිය ගත කළෙමු. පසුදා අපි පොළට ගියෙමු. කඩසාප්පුවල ඇවිද්දෙමු. මගේ අත්පිටපත ප්‍රකාශකයකුට බාරදීමටද අවස්ථාවක් ලැබිණ. දෙදිනකට පසු අපි සාරියා හරහා ආපසු එන්නට වීමු. ඒ එද්දී මට විශ්වවිද්‍යාලය දැකගත හැකි විය.

වැලි කුණාටුවකට අසුවීම නිසා අපේ ගමන බොහෝ ප්‍රමාද විය. අප ආපසු ආවේ පාතිමාගේ නිවස පිහිටි ප්‍රදේශය හරහාය. එබැවින් පාතිමාගේ නිවසට ගොඩවැදී යාමට අපි තීරණය කළෙමු. අප නිවස දෙසට රිය හරවද්දී විශාල සෙනඟක් ගෙතුළත් ගේ අවටත් රැස්ව සිටිනු දක්නට ලැබිණි.

සෙනඟ පිරී සිටි අන්දම නිසා යම් කිසිවකුට අසනීපයක් සෑදී හෝ කිසිවකු අනතුරකට භාජනය වී හෝ ඇතැයි මට සිතිණ. මට නිවසේ සිටින දරුවන් ගැන සිහිපත් විය. මම රියෙන් බැස ගෙට ඇතුළු වෙද්දී මගේ පියා ද එහි සිටිනු මට පෙනිණ.

"බෙලෝ නැති වුණා දුවේ. ඔව් පෙරේදා රිය අනතුරකින් එතනම. එදාම ඔහුව මිහිදන් කළා"

මගේ පියා සිදුවූ සියල්ල එකවර කියා අවසන් කළේය.



මෙය විශ්වාස කිරීමට උත්සාහ ගනිමින් මම පාතිමා අසළින් ඉඳ ගතිමි. සියලූ දෙනාම අල්ලා අල්ලායි දෙවියන්ගේ නම අඩගසද්දී, පාතිමා, මගේ පියා, අබූ හා මුරකාරයා ද මරණයේ සෙවනැලි මෙන් මට දිස් විය.

.....බෙලෝ මැරිල. ඔව්. මැරිලා. දැන් මට වැඩි විස්තර දැනගෙන වැඩක් නෑ...

මගේ වැස්ලින් බෝතලය ඉල්ලා ගැනීම හා මෙහි කිසියම් සම්බන්ධයක් ඇත්දැයි මම සිතන්නට වීමි. ඒත් එය මහ විහිළුවකි. මගේ හිස පුපුරා හැලෙන්නාක් මෙන් විය. සුනුවිසුණු වූ මෝටර් රථ, ඇඹරී ගිය ලෝහ කැබැලි මෙන්ම, පෙට්‍රල්වලින් තෙත්වූ වාහන කැබැලි හා වැස්ලින් දියරය තැවරූ අතපය මෙන්ම ඇඹරී ගිය පෙකණිවැල් මා වටා එතෙමින් මා තදකරන්නට විය. දරුවා හා බෙලෝ මරණයේ විකෘතිය විසින් මරණය ළඟටම ඇදගෙන ගොස් තිබිණ.

"වළ දමන්න ඉස්සෙල්ල ඇයි මට කිව්වෙ නැත්තෙ?"

කරහින් පුපුරමින් මම විලාප දුන්නෙමි.

"එහෙම කොහොමද? අපි මුස්ලිම්වරු පැය විසිහතරක් ඇතුළත මිනිය වළ දමන්න ඕනි"

"අනික අපි දන්නෙ නැහැ ඔබ කඳුනාවල කොහේ ඉන්නවද කියල..."

ඔවුහු කියන්නට වූහ. ඒ කීවේද පැටලිලි සහගත සිතිනි. මේ ගැන මහා උවමනාවකින් කතා කරන්නට මට ඇති අයිතිය කුමක්ද? මම නිකම්ම ගැහැනියකි. අනික් අතින්

www.sinhalaelibrary.com 94

ගැහැනියක් පමණක් වූ මම තුන්වැනි බිරිඳය. මට මේ ගැන කුමට කියන්නද?

"නංගි මෙහේ ඉන්න. අලුත් ගෙදර යන්න ඕනි නෑ"

පාතිමා මා ඉදිරියේ කියා සිටියාය. මගේ ගැහැනුකමට සලකන අන්දම ගැන සිතද්දී මට තව මොහොතකුදු මෙහි රැඳී සිටීමට අවශ්‍ය නොවීය. නගරයට යෑම අවශ්‍ය බව මම තදින්ම කියා සිටියෙමි. මගේ පියා සහ මව මා සමඟ පැමිණියහ. ජස්ටිනාද ඒ සමග විය. ජස්ටිනා නවතින්නට සූදානම් වූයේ කෙසේදැයි මම නොදත්තෙමි. මරණයේ අන්ධකාරයත් රැගෙන මා මගේ නිවසට පැමිණි අන්දම මට සිතා ගැනීමට බැරි තරම් විය. අමාවකේ සඳ යාන්තමට නැඟෙමින් තිබිණ. මගේ මව සහ ජස්ටිනා අතර වාඩි වී උන් මට මගේ මවගේ කටහඬ නොනැවතී ඇසිණ.

".... අම්මේ ඔය කතාව නවත්වන්න"

කෑගසා අඬන්නට සිත්වූ මම අම්මාට එසේ කියන්නට උත්සාහ ගත්තෙමි. එහෙත් මගේ මුවින් වචන පිට නොවීය. කෑගැසීමත් හඬා වැළපීමත් සිත යට හිරවී තිබිණ. නගරයට පැමිණි පසු ජස්ටිනා මට නින්ද යෑම, සඳහා බෙහෙත් පෙති දෙකක් දුන්නාය. ඇඳේ වැතිරුණු මම ඒ මේ අතට පෙරළෙන්නට වීමි. කිසිදු හේතුවක් නැතිව මම සල්පිලේ වූ මෙරිගෝ රවුම ගැන සිතන්නට වීමි. මා මෙරිගෝ රවුමක් දුටු ප්‍රථම අවස්ථාව ද එය විය. විදුලි පහන් සියල්ල කැරකෙමින් ගොස් මගේ දෑස වැස්ලින් බෝතලය වෙත නතර විය. බෙලෝ එය ඉල්ලා ගත්තේය. ඔහු මගේ කාලය ද ඉල්ලා ගත්තාක් මෙනි. මූඩිය හරියට වසා නොතිබුණේ මහ කලබලයකින් මෙනි. සියල්ල වසාගෙන මෙරිගෝ



රවුම මා වටා කැරකෙයි. අමීනා. පාතිමා... මම.....

ඉර නැඟෙමින් තිබියදී මා නින්දෙන් අවදි වූයේ මත්වූ කලක මෙනි. මගේ අම්මාගේත් ජස්ටිනාගේත් කටහඬවල් කුස්සිය දෙසින් ඇසිණ. මම සිහිනයක් දුටුවෙමි. එහෙත් එය මහා පැටලිලි සහගතය. වික්ටර් බෙලෝ සහ මම ආබාධිත දරුවාත් සමග මෙරිගෝ රවුමට නැඟ සිටියෙමු. එහෙත් මොහොතකින් මම එයින් බසින්නට උත්සාහ කළමුත් මගේ දෙපා බිම නොපෑගිණ. ඒ සමඟ ම එක්රැස් වූ මිනිසුන් රාශියක් අල්ලා දෙවියන් උදෙසා යාඥා කරන්නට වූහ. යූ අකුරේ හැඬයට ඉඳගත් ඔවුන්ගේ හඬ කන් බිහිරි කරවන තරම් විය.

සිතුවිලි එකින් එක පීරමින් සැබෑ ලෝකයට අවතීර්ණ වෙද්දී මා සිත තුළ කිසියම් පැහැදිලිතාවක් ගොඩනැගෙන්නට විය.

බෙලෝ මියගිහින්. මා ජීවත්ව සිටී. මා මෙතැන. ඔහු ගිහින්. එකට එක්වූ අපේ සිරුරු වෙන්වී ගිහින්.

වෙව්ලන්නට වූ මම අතින් ම මගේ හිස වසාගතිමි. මගේ සිරුර හා වෙළුණු ඔහුගේ සිරුර දන් කුණු වී ගොස්ය. ඇඟ කිලිපොලා යද්දී මම ඒ සිතුවිලිවලින් මිදෙන්නට උත්සාහ කළෙමි. කොහොමද මං ජීවත් වෙන්නෙ. මා ළඟ ඇති නයිරා පන්සියය ගැන මම සිතන්නට වීමි. එච්චරයි මං ළඟ තියෙන්නෙ. දින 40 ක ශෝකී කාලයක් මා ගෙවිය යුතුව ඇත. පාසල් වාරයේ දින ගණන් කරන්නාක් මෙන් මට මේ දින 40, ගෙවී අවසන් වන්නේ කවදාදැයි ගණන් කර ගැනීමට උත්සාහ දැරීමි. ඊට පසු මා කළ යුත්තේ කුමක්දැයි සිතිය යුතුව ඇත. මම දෑස් පියාගත්වනම සිටියෙමි.

www.sinhalaelibrary.com 95

..... කවුරු හරි මාව බලන්න ආවොත් මං නිදියි කියල හිතපුවාවෙ,....

මම මටම කියා ගතිමි,

මෙසේ කියමින් ඇඳේ අනික් පසට හැරෙද්දී මගේ මැණික් කටුව රිදුම් දෙන්නට විය. එක්වරම ඇතිවූ තිගැස්සීමකින් මම බෙලෝගේ රිය තුළ සිටින බවක් දැනිණ. බෙලෝ රිය පදවයි. අලේරුවල සිට රිය පදවයි.

"හුඟක් රිදෙනවද?"

ඔහු ඇසයි, මට මගේ සිත වාවා ගත නොහැකි විය. මම හඬා වැළපෙන්නට වීමි. මා හැඬුවේ බෙලෝ වෙනුවෙන්ද? මා වෙනුවෙන් ද? නැතිනම් සිදු වූ දෙයක් ගැනද? එහෙත් නැත්නම් සිදු නොවූ දෙයක් හෝ සිදු වන්නට යන දෙයක් ගැනද?

දවස් ගෙවී යද්දී බොහෝ දේවල් සිදුවෙමින් පවතී. ඒ හැමදෙයක් ම බලාපොරොත්තු නොවූ දේවල් නොවේ. බෙලෝගේ මරණය සිදුවී හතළිස් පස්වන දිනයේ ඔහුගේ සහෝදරයා හා මාමා අප නිවසට පැමිණියහ. ඔවුන් පැමිණියේ රූපවාහිනී යන්ත්‍රයට හා තවත් සමහරක් බඩු බාහිරාදියට අයිතිවාසිකම් කියමිනි. තමන් වරදක් කරන්නේය යන හැඟීමක් ඔවුන් තුළ තිබුණාදැයි මම නොදනිමි. "අපේ අයියා" ගැන ඔව්හු ටික වේලාවක් කතා කරමින් සිටියහ. ඔවුන් ටිකෙන් ටික මේ සූදානම් වන්නේ මා මේ නිවසින් පිට කිරීමට බව මට පසක් විය. ඒ දවසේ ඔවුහු රූපවාහිනී යන්ත්‍රය සමඟ ගෘහ භාණ්ඩ කිහිපයකුත් බෙලෝට අයිතිව තිබූ පුංචි පුංචි දේවල් සියල්ලමත් රැගෙන ගියහ. මේ කිසිම දේකට මගේ කිසිදු සම්බන්ධයක්



නැතිවාක් මෙන් මම බලා සිටියෙමි.

දින දෙකකට පසු මා කිසිසේත් බලාපොරොත්තු නොවූ සිදුවීමක් සිදු විය. බෙලෝගේ පුත්‍රයා ආපසු රූපවාහිනී යන්ත්‍රයක් රැගෙන මා දොරකඩ පෙනී සිටිමින් සමාව අයදින්නට විය. ඔහු මේ ගැන දැනගත්තේ කෙසේදැයි මට සිතාගත නොහැකි විය.

මගේ සිතට කෘතවේදී හැඟීමක් ඇති විය. ඔහු දැඩි සිත් තැවුලකට පත්වූ බවක් පෙනිණ. ඔහු කියාගන්නට ආ දෙයින් හරි අඩක්වත් කියාගන්නට නොහැකිව වචන පැටලෙන්නට විය. රූපවාහිනී යන්ත්‍රය ආපසු ගෙනවිත්දීම සඳහා ඔහුටත් මහා සටනක් කරන්නට සිදුවන්නට ඇත. කොයි මොහොතේ මට මේ නිවසින් පිටවන්නට අණ ලැබේදැයි මම සිතන්නට වීමි. මරණයකින් පසු දේපොළ අයිතිය පාලනය වන නීතිරීති පද්ධතිය ගැන මම කිසිවක් දැන නොසිටි අතර දැනුදු ඒ ගැන මට කිසිදු අදහසක් නැත. ලාගෝස්හි නීතිවේදිනියක් විසින් කරන ලද කතාවක වාර්තාවක් මා පුවත්පතකින් කියැවූ බවක් මට සිහිපත් විය. සැම දෙයකම ප්‍රතිඵලයක් වශයෙන් කණවැන්දුම් ස්ත්‍රියකට ඉතිරි වන්නේ සැරයටිය පමණි. මා ඉක්මනින් ම තවත් මිනිසකුගේ කරේ එල්ලීමට ඔවුන් බලාපොරොත්තු වනවා විය හැක. මේ නිවස අත්පත් කරගැනීමේ සිතිවිල්ල සිත යට තබා ගනිමින් බෙලෝගේ සොහොයුරා තොල් මැතිරූ අන්දම මට ඇසෙන්නාක් මෙනි.

"ඔබට ඕනෑ තරම් කාලයක් මෙහේ ඉන්න...."

රූපවාහිනී යන්ත්‍රය ආපසු රැගෙන පැමිණි බෙලෝගේ පුත්‍රයා මට එසේ කීවේය. ඔහු මුදල් නෝට්ටු කිහිපයක් ද මා වෙත පෑවේය.

www.sinhalaelibrary.com 96

"මේ වෙලාවේ නම් වියදමට මං ළඟ සල්ලි තියෙනවා"

මා එසේ කීවද ඔහුගේ පරිත්‍යාගය ප්‍රතික්ෂේප කිරීමට තරම් වූ තත්ත්වයක මා නොසිටියේය. මා මේ උදව්ව කෙලින්ම ප්‍රතික්ෂේප කළා නම් මට පියාගෙන් යැපෙන්නට සිදු වෙයි. ඒත් සතියකට වරක් හෝ මසකට වරක් මුදල් රැගෙන මොහුගේ පැමිණීම මට බලාපොරොත්තු විය නොහැක. ඔහු ද ඒ ගැන හොඳින් ම දන සිටියා විය යුතුය.

"මුරකාරය බෙලෝගෙ සාප්පුවට එව්වොත්"

ඒ වචන පැවසූ ඔහු මොහොතකට පසු යළිත් කටහඬ අවදි කළේය.

"එහෙම නැත්නම් බැංකු ගිණුමක් අරින්න. ඔබට ඕන වේලාවට ගන්න පුළුවන් විදියට මට පුළුවන් දිගටම සල්ලි දාන්න"

"මට ඒ ගැන දැනුමක් නෑ"

මම පැවසුවෙමි.

"මං කවදාවත් බැංකුවකට ගිහින් නෑ"

මගේ ඒ වචනවලට ඔහු හිනැහුණේය.

"දවසක් ගියා නම් ඔබ නිකම්ම ඉගෙන ගනීවි"

ඔහු කීයේය.



"මං උත්සාහ කරල බලන්නම්"

"මගේ මාමල ආවට කිසි දෙයක් දෙන්න එපා"

ඔහු ආපසු යන්නට හැරෙමින් කීවේය.

මේ ගැන දනගත් විට මාමාවරු ඔහුට දෙහි කපනු ඇත. දැනටමත් මුරකාරයා මේ සියල්ල අහගෙනය. බෙලෝගේ මේ පුත්‍රයාට බෙලෝගේ අනුකම්පා සහගත හැඟීම් සියල්ල ආරෝපණය වී තිබේ. කෙසේ වුවද එකම පරම්පරාවකට අයිති වූ අප එකම මිහිතලය මත හමුවන්නෝ වෙති. කායික වශයෙන් වුවද ඔහු බෙහෙවින් බෙලෝට සමානය. මා තුළින් වියැකී ගිය වේදනාව යළිත් අලුත් විය. බෙලෝ මට අහිමි වෙද්දී මුළු ලෝකයම මට නැති වූවාක් මෙන් දැනිණ.

මධ්‍යම රාත්‍රිය ගෙවී ගියද නින්ද මා අසළකටවත් නොපැමිණියේය. මම නිදන කාමරයේ විශාල ජනේලය අසළ වාඩිවී සිටියෙමි. පැරැණි නිවසේ බිත්තියේ බොහෝ ඉහළින් තිබූ හතරැස් පුංචි ජනේලයට වඩා මෙය බෙහෙවින් වෙනස්ය. එය පුරහඳ පායා බැබළෙමින් තිබූ රාත්‍රියකි. තරු මල් ද බොහොමයක් අහස පුරා විසිරී තිබිණ.

මගේ සිත දරා ගත නොහැකි තරම් වූ කැළඹීමකට පත් විය. මා ගැනත් මගේ අනාගතය ගැනත් කිසියම් තීරණයකට මම එළඹෙමින් සිටියෙමි. මගේ ජීවිතය පුරා බොහෝ දේවල් සිදුව ඇත. එහෙත් මේ තත්ත්වයට මා පත්ව ඇත්තේ අහම්බෙනි. බෙලෝගේ මරණයෙන් පසු හැම මොහොතකම එය මා තුළ සැඟවී තිබෙන්නට ඇත.

www.sinhalaelibrary.com 97

පසුදින දහවල් වරුවේ මා විවේක ගනිමින් සිටියදී අමුත්තෙක් මා හමුවීමට පැමිණ ඇති බව දැනගන්නට ලැබිණ. ඒ මොහොතේ මගේ සොහොයුරිය අසුමී ගෙදර සිටියාය. විශාල මෝටර් රියකින් පැමිණි ඔහු අල්හාජ් කෙනෙකු බව ඈ පැවසුවාය. මුරකරු පැමිණ ඔහුට මා බැහැදැකීමට අවශ්‍ය බව පැවැසීය. ආලින්දයට පැමිණි මට ඔහු බෙලෝගේ ව්‍යාපාරික මිත්‍රයකු වූ අබ්දුල් කාසිම් බව හඳුනාගත හැකි විය. ඔහු මහා පොහොසතකු බව මම දැන සිටියෙමි. ඒ එසේ නොවූවද අත බැඳි ඝන රන් ඔරලෝසු පටිය, අතැඟිලිවල පැළඳි රන් මුදු සංඛ්‍යාව මෙන්ම පොරවාගත් වටිනා ඇඳුම් පැළඳුම්වලින් ඔහුගේ වත්පොහොසත්කම්වල මහන්තත්වය කියා පාමින්, පොහොසත් ව්‍යාපාරිකයකුගේ කීර්තිමත් පෙනුම ජීවිතය තරම්ම විශාල බව පෙන්නුම් කරමින් ඔහු මා ඉදිරියේ පෙනී සිටියේය. බෙලෝ පොහොසතකු වුවද මෙතරම් ආටෝපයක් ඔහු ළඟ නොවීය.

ඔහු කතාව ආරම්භ කළ මොහොතේම ඔහු කියන්නට යන්නේ කුමක්දැයි මට ඉව වැටින. මීයාගේ ගඳ සුවඳ ගැන අමුතුවෙන් කිවයුතු නැත. මහා දිග කතාවක් කෙටියෙන් කියතොත් එය විවාහ යෝජනාවකි. එය යෝජනාවක් පමණක් නොව මා එය ස්ථිරකර පිළිගනීයැයි ඔහු දැඩි විශ්වාසයකට එළඹ තිබිණ.

.... අනේ දුප්පත් කෙල්ල. කොයි වෙලාවෙ ගෙදරින් එළියට දමාවිද දන්නෙ නැහැ....

එසේ සිතූ ඔහු මට වටිනා ඇඳුම් පැළඳුම් යාන වාහන මෙන්ම සුඛෝපභෝගී නිවසක්ද පරිත්‍යාග කිරීම සඳහා මෙහි



පැමිණ සිටී. දැන් ඔහු ළඟ සිටින්නේ බිරියන් සිව් දෙනකු පමණකි. තවත් එකියකට එහි ඉඩ ඇත. මා ගිපියෝ ලේස් සළුවකින් සැරසී මහා ධනස්කන්දයක් රැගෙන සාප්පු සවාරියක යන අන්දම මට මැවී පෙනිණ. තව මොහොතකින් මම සිහි එලවා ගතිමි. ඔහු මා ඉදිරියේ වාඩි වී සිටී.

මා අකමැත්ත ප්‍රකාශ කිරීමට තුරුම්පුවක් සෙව්වෙමි. කෙලින්ම බැහැ කීවොත් ඔහු යළි යළිත් උත්සාහ කොට මා ලජ්ජාවට පත් කරනු ඇත.

"බොහොම ස්තූතියි. ඇත්තටම ඔබට ගොඩක් ස්තූතියි. මම ආයෙ විවාහ වෙන්නෙ නැහැ. මං විශ්වවිද්‍යාලයට යන්න බලාපොරොත්තු වෙනවා"

මගේ මේ අදහස සාර්ථක වුවහොත් ඉදිරියේදී මට තවත් පිරිමියකුගේ අනුකම්පාව බලාපොරොත්තු නොවී ජීවිතය ගෙන යෑමට මග පෑදෙනු ඇත.

නිමි.

www.sinhalaelibrary.com 98